ජාතික ලොතරැයි මණ්ඩලය
தேசிய லொத்தர் சபை
**NATIONAL LOTTERIES BOARD**

වාර්ෂික වාර්තාව ஆண்டறிக்கை

# Annual Report 2014



# පෙළගැස්ම


## 1 දළ විශ්ලේෂණය

- සංස්ථාමය තොරතුරු හා නියාමන ප්‍රතිපත්තීන් - 04
- නිෂ්පාදන විෂය ධාරාව - 13

## 2 විධායක වාර්තා

- සභාපතිගේ සමාලෝචනය - 18
- ක්‍රියාකාරී අධ්‍යක්ෂගේ වාර්තාව - 20
- විගණන හා කළමනාකරන කමිටු වාර්තාව - 22

## 3 මූල්‍ය ප්‍රකාශන හා තොරතුරු

- විගණකාධිපති වාර්තාව - 24
- ආදායම් ප්‍රකාශය - 37
- විස්තීර්ණ ආදායම් ප්‍රකාශය - 37
- මූල්‍ය තත්ත්ව ප්‍රකාශය - 38
- අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය - 39
- ස්කන්ධ ප්‍රාග්ධනයේ වෙනස්වීම් ප්‍රකාශය - 40
- මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 41

## 4 මෙහෙයුම් හා මූල්‍ය විශ්ලේෂණය

- මූල්‍යමය ප්‍රමුඛතාවයන් - 66
- සමස්ත කාර්යසාධනය - 67
- නිෂ්පාදන කාර්යසාධනය - 68
- දස වසරක මෙහෙයුම් සමාලෝචනය - 72





# 1 දළ විශ්ලේෂණය

# සංස්ථාමය තොරතුරු හා නියාමන ප්‍රතිපත්තීන්

## සංස්ථාමය තොරතුරු

**ආයතනයේ නම**
ජාතික ලොතරැයි මණ්ඩලය

**නෛතික තත්ත්වය**

ආරෝග්‍යශාලා ලොතරැයිය අහෝසි කිරීමෙන් පසු 1963 අංක 11 දරණ මුදල් පනත යටතේ ජාතික ලොතරැයි මණ්ඩලය පිහිටුවන ලදී. 1997 වසරේදී ඉහත පනත යටතේ සමහර වගන්ති 1997 අංක 35 දරණ මුදල් (සංශෝධිත) පනත යටතේ සංශෝධනය කර ඇත.

**පිහිටුවන ලද වර්ෂය**
1963

**ගිණුම් වර්ෂය අවසන් වනුයේ**
දෙසැම්බර් 31

**ලියාපදිංචි කාර්යාලය**

**ලිපිනය** : අංක 234/ 2, ගාලුපාර, කොළඹ 03.

**දුරකථන** : 2470662, 2470663, 4607000, 2329576

**ෆැක්ස්** : 2421897, 2326528, 2433631, 2470661,

**විද්‍යුත් තැපෑල** : nlbgen@sltnet.lk

**වෙබ් අඩවිය** : www.nlb.lk

**විගණක**

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

**බැංකුකරු**
මහජන බැංකුව

# නියාමන ප්‍රතිපත්තීන්

## දර්ශනය

සමස්ත දිවයිනේ සමාජ ආර්ථික සංවර්ධනය උදෙසා සෑම ජන කොටසකගේම දායකත්වය තුලින් රාජ්‍ය ආයෝජන නිර්මාණය කිරීමේ ප්‍රමුඛයා

## මෙහෙවර

සමාජ වගකීම පෙරදැරිව පාරිභෝගික විශ්වාසය දිනා ගනිමින් ඔවුන්ගේ ජයග්‍රහණයන් තහවුරු කිරීම උදෙසා නවීන තාක්ෂණය භාවිත කරගනිමින් නවතාවයෙන් යුතු ලොතරැයි හඳුන්වාදෙමින් ආශ්චර්යමත් දේශයක් උදෙසා දක්ෂ කැපවූ කාර්ය මණ්ඩලයක් සමඟ ගමන් කරන්නාවූ අභිමානවත් ආයතනයක්

# පරමාර්ථ

## සංවිධාන පරමාර්ථ

- රජයේ සංවර්ධන අවශ්‍යතා සඳහා අරමුදල් ඉපයීම
- රජයට ආදායම් උත්පාදනය කරන ආයතන අතරින් ප්‍රධානතම ආයතනය බවට පත්වීම
- ජනතාවගේ ජීවන තත්ත්වය නංවාලීම
- රටේ සේවා නියුක්තියට දායකත්වය සැපයීම

## මණ්ඩලීය අරමුණු

- පවතින ආදායම් මට්ටම හා ලාභදායකත්වය වැඩි කිරීම තුළින් රජයට කරන දායකත්වය වැඩි කිරීම
- වෙළඳපල නායකත්ව තත්ත්වය පවත්වාගෙන යාම
- මෙහෙයුම් කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය වැඩි දියුණු කිරීම
- ආයතනයේ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම
- සේවක මණ්ඩලයේ කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය
- පාරිභෝගික සංතුෂ්ඨිය වැඩි කිරීම

# ප්‍රධාන සාරධර්ම

- වගකියන සහ වගකිවයුතු ආයතනයක්
- අවංක සහ විනිවිදභාවයෙන් යුතු ආයතනයක්
- කණ්ඩායම් පරිශ්‍රමය හා නිපුණත්වය පිළිබද විශ්වාසය
- නවීන තාක්ෂණය හා වෙනස්වීමට ඇති අභිරුචිය
- ඉහළම පාරිභෝගික සේවාවක් පිළිබද විශ්වාසය






# සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය

1. චමින්ද අතුළුවගේ මහතා - සභාපති
2. ජානක ශ්‍රී වර්ණසිංහ මහතා - ක්‍රියාකාරී අධ්‍යක්ෂ
3. ආර්.ජේ.ටී. අබේවර්ධන මහතා - අධ්‍යක්ෂ
4. සම්පත් දිසානායක මහතා - අධ්‍යක්ෂ
5. සමන් ගලප්පත්ති මහතා - නිරීක්ෂක

භාණ්ඩාගාර නියෝජිත
එච්.පී.සුමනසිංහ මහතා - අධ්‍යක්ෂ
(2013 ඔක්තෝබර් සිට 2015 ජනවාරි දක්වා )

මෙම අධ්‍යක්ෂ මණ්ඩලය 2015 ජනවාරි මස 08 දින ඉල්ලා අස්වෙන ලදී.

# ජ්‍යෙෂ්ඨ කළමණාකරනය



නාලක කළුවැව මහතා
MPA (Canberra) MMgt (Canberra)
MBS(Colombo) PGDMB (Colombo)
B.Sc.(SP) (Peradeniya)
ශ්‍රී ලංකා පරිපාලන සේවය (පළමු පංතිය)
සාමාන්‍යාධිකාරී
(2014 අප්‍රේල් සිට)



අශෝක් විතාරණ මහතා
අතිරේක සාමාන්‍යාධිකාරී



හර්ෂ බණ්ඩාර මහතා
FCMA(UK), FCCA (UK),
MBA (USA) AMSLIM,
FCMA(SL),FCPM,FCAA,
CGMA.
ප්‍රධාන මූල්‍ය නිලධාරී



වී. සුන්දරේශ්වරන් මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(ආදායම් මූල්‍ය)



රෝහණ විජේවික්‍රම මහතා (FCA)
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(සාමූහික ව්‍යාපෘති මූල්‍ය)



රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(සැපයුම්)



ගීතා පෙරේරා මිය
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(මෙහෙයුම් මූල්‍ය)

# ගමනෙහි ඉතිහාසය හා ප්‍රධාන පියවරයන්



## ගමනෙහි ඉතිහාසය

රටේ සෞඛ්‍ය සේවාවන් වඩාත් පුළුල් කිරීමට අවශ්‍ය මුදල් උපයා ගැනිමේ අරමුණින් රජය විසින් ශ්‍රී ලංකාව තුල ලොතරැයි ආරම්භ කිරීමට පියවර ගන්නා ලදී. 1949 වසරේදී එවකට පළාත් පාලන කටයුතු පිළිබද අමාත්‍යවරයා විසින් ලොතරැයි පැවැත්වීම පිලිබද අදහස රජයට ඉදිරිපත් කරන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන් 1955 අංක 4 දරණ පනත යටතේ ආරෝග්‍යශාලා ලොතරැයි මණ්ඩලය ඇරඹිනි.

1960 ගණන්වලදී රජයට ශ්‍රී ලංකාව තුල ලොතරැයි ආරම්භ කිරීමේ අභිප්‍රායයන් තවදුරටත් පුළුල් කිරීමේ අවශ්‍යතාවය පැන නැගුනි. අරමුදල් සෞඛ්‍ය සේවාවන් වලට අමතරව විවිධ සංවර්ධන ව්‍යාපෘති සඳහා අවශ්‍ය විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ආරෝග්‍යශාලා ලොතරැයිය අහෝසි කරමින් 1963 අංක 11 දරණ මුදල් පනත යටතේ රටේ සංවර්ධන කටයුතු සඳහා අරමුදල් උපයා ගැනීමේ පරමාර්ථයෙන් ජාතික ලොතරැයි මණ්ඩලය පිහිටුවන ලදී.



# ප්‍රධාන පියවරයන්

## පළමු දශකය 1963 - 1972

1963 අංක 11 දරණ මුදල් පනත යටතේ ජාතික ලොතරැයි මණ්ඩලය ස්ථාපිත කිරීම
1964 ජාතික ලොතරැයි මණ්ඩලයේ පළමු දිනුම් ඇදීම - ටොරින්ටන් චතුරශ්‍රය (20/02/1964)
1965 පළමුවරට බෙන්ස් මෝටර් රථයක් ත්‍යාගලාභියෙකුට පිරිනැමීම
1967 පළමු ශාඛා කාර්යාලය රත්නපුරයෙහි ආරම්භ කිරීම
1968 ජාතික සම්පත ලොතරැයිය හඳුන්වා දීම
1970 ජාතික සම්පත ලොතරැයිය මහජන සම්පත ලෙසට පරිවර්තනය කිරීම (28/07/1970)

## දෙවන දශකය 1973 - 1982

1975 සර් චිත්තම්පලම් ඒ.ගාඩිනර් මාවත අංක 111/1 දරණ ස්ථානයට ප්‍රධාන කාර්යාලය රැගෙන යාම
1977 ජාතික ලොතරැයියේ මිළ ශත 50- සිට රු. 1 දක්වා වැඩිකිරීම

## තුන්වන දශකය 1983 - 1992

1987 සුපිරි ජාතික ලොතරැයිය හඳුන්වා දීම (11/04/1987)
1988 මහජන සම්පත ලොතරැයියේ මිළ රු. 1/- සිට රු. 8/- දක්වා වැඩි කිරීම.
ලොටෝ ලොතරැයිය ආරම්භ කිරීම
මහජන සම්පත ලොතරැයියේ ප්‍රථම රූපවාහිනී දිනුම් ඇදීම (10/05/1988)
1989 මහජන සම්පත ලොතරැයියේ මිළ රු. 8 සිට රු. 10- දක්වා වැඩි කිරීම
1992 එයාර්පෝට් සුපර්ඩ්‍රෝ ලොතරැයිය ආරම්භ කිරීම

## හතරවන දශකය 1993 - 2002

1994 වාසනා සම්පත ලොතරැයිය ආරම්භ කිරීම
1995 ගොවිසෙත ලොතරැයිය ආරම්භ කිරීම
1996 සමෘද්ධි ලොතරැයිය ආරම්භ කිරීම
1997 ශ්‍රම වාසනා ලොතරැයිය ආරම්භ කිරීම
සෙවණ ලොතරැයිය ජාතික ලොතරැයි මණ්ඩලය හා ඒකාබද්ධ කිරීම
1999 සුපිරි වාසනා ලොතරැයිය ආරම්භ කිරීම
2000 ජයවිරු ලොතරැයිය ආරම්භ කිරීම

## පස්වන දශකය 2003- 2012

2004 සුනාමි ව්‍යසනයෙන් විපතට පත්වූවන්ට මූල්‍ය පහසුකම් සලසාදීම සඳහා සරණ ලොතරැයිය ආරම්භ කිරීම
සේවක සුභසාධනය සඳහා සුභසාධන හා සකසුරුවම් අරමුදල ආරම්භ කිරීම

2005 ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනයෙන් (SLIM)සිදුකරන ලද ත්‍යාග ප්‍රදානෝත්සවයේදී බැංකු හා මූල්‍ය සේවා අංශය යටතේ වඩාත් ජනප්‍රිය වෙළඳනාමය සඳහා වන සම්මානය මහජන සම්පත ලොතරැයිය සඳහා හිමිවීම

2006 ලොටෝ ලොතරැයිය අහෝසි කොට සුවසෙත ලොතරැයිය ආරම්භ කිරීම
ලොතරැයියක් සඳහා මෙතෙක් ගෙවන ලද ඉහලම සුපිරි ත්‍යාගය මහජන සම්පතෙන් පිරිනැමීම (රු. මිලියන 61. 3)

2007 නව ගුවන් තොටුපල ලොතරැයිය ආරම්භ කිරීම
එයාර්පෝට් සුපර්ඩ්‍රෝ ලොතරැයියේ මිළ ඩොලර් 25 සිට 50 දක්වා වැඩි කිරීම

2008 දිනුම් අදින ලොතරැයිවල මිළ රු. 10 සිට රු. 20 දක්වා වැඩි කිරීම (02/09/2008)

2010 ශ්‍රම වාසනා හා සුවසෙත ලොතරැයි දෙකම අහෝසි කර ජාතික සම්පත ලොතරැයිය ආරම්භ කිරීම

මහජන සම්පත ලොතරැයිය ඉරිදා දිනටත් දිනුම් ඇදීම හඳුන්වාදීම

2011 ඉතිහාසයේ ප්‍රථම වතාවට රු. බිලියන 10 ක අලෙවි ඉලක්කය පසු කිරීම
බදාදා දිනුම් අදින ලද ජයවිරු ලොතරැයිය අහෝසි කර එදිනටත් සුපිරිවාසනා සම්පත ලොතරැයිය දිනුම් ඇදීම හඳුන්වාදීම

නව ගුවන්තොටුපල ලොතරැයිය පැවැත්වීම හා අඩු කාර්යසාධනය නිසා මෙම ලොතරැයිය අහෝසි කිරීම

සති තුනක් ඇතුලත රු. මිලියන 10 ට වඩා වැඩි ත්‍යාග 5 ක් පිරිනමන ලද අතර මින් 4ක් එක දිගට දින 4 කදී සිදුවීම

2012 සම්පත් රේඛා නමින් නව ලොතරැයියක් හඳුන්වා දීම
ගොවිසෙත ලොතරැයිය බ්‍රහස්පතින්දා දිනටත් දිනුම් ඇදීම හඳුන්වා දීම
වාසනා සම්පත ලොතරැයිය සඳුදා දිනටත් දිනුම් ඇදීම හඳුන්වා දීම

## වර්තමාන දශකය 2013 - 2022

2013 ගොවිසෙත ලොතරැයියේ සුපිරිත්‍යාගය රු. මිලියන 10 සිට රු. මිලියන 40 දක්වා වැඩිකිරීම
සම්පත් රේඛා ලොතරැයියේ සුපිරි ත්‍යාගය රු. මිලියන 5 සිට රු. මිලියන 10 දක්වා වැඩිකිරීම
ජාතික ලොතරැයි මණ්ඩලයේ 50 වන සංවත්සරය වෙනුවෙන් මෙගා 50 නැමති ලොතරැයිය ආරම්භ කිරීම

2014 පවර් ලොටෝ ලොතරැයිය ආරම්භ කිරීම

# නිෂ්පාදන විෂය ධාරාව

## දිනුම් අදින ලොතරැයි

### මහජන සම්පත

| | |
|---|---|
| විස්තරය | : ලොතරැයි වෙළඳපලෙහි පැරණිතම ලොතරැයිය වේ. ටිකට්පතෙහි මිල රු.20/ කි. |
| දිනුම් අදින දින | : අඟහරුවාදා, සිකුරාදා, ඉරිදා |
| ත්‍යාග | : රු. මිලියන 10 හෝ ඊට වැඩි සුපිරි ත්‍යාගයක් රු. මිලියන 2 ක ප්‍රථම ත්‍යාගයක් සහ වෙනත් සිත්ගන්නා සුළු ත්‍යාග |
| දායකත්වය | : පිරිවැටුමෙන් 16.5% ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබේ. |




### වාසනා සම්පත

| | |
|---|---|
| විස්තරය | : 1994 වසරේ වෙළඳපලට හඳුන්වා දෙන ලදී. ටිකට්පතෙහි මිල රු.20/ කි. |
| දිනුම් අදින දින | : සඳුදා, බ්‍රහස්පතින්දා |
| ත්‍යාග | : රු මිලියන 10 හෝ ඊට වැඩි සුපිරි ත්‍යාගයක් රු. මිලියන 1 ක ප්‍රථම ත්‍යාගයක් සහ වෙනත් සිත්ගන්නා සුළු ත්‍යාග |
| දායකත්වය | : පිරිවැටුමෙන් 16.5% ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබේ. |




### ගොවිසෙත

| | |
|---|---|
| විස්තරය | : කෘෂිකර්ම අමාත්‍යාංශය වෙනුවෙන් ගොවි භාරකාර අරමුදලට අරමුදල් උත්පාදනය සඳහා මණ්ඩලය විසින් මෙම ලොතරැයිය 1995 වසරේදී වෙළඳපලට හඳුන්වා දෙන ලදී. මෙම ලොතරැයියෙහි අලෙවිය වැඩිකර ගැනීමේ පරමාර්ථයෙන් 2013 නොවැම්බර් මස සුපිරි ත්‍යාගය රු. මිලියන 10 සිට රු. මිලියන 40 දක්වා වැඩිකරන ලදී. ටිකට්පතෙහි මිල රු.20/ කි. |
| දිනුම් අදින දින | : සඳුදා බ්‍රහස්පතින්දා |
| ත්‍යාග | : රු. මිලියන 40 හෝ ඊට වැඩි සුපිරි ත්‍යාගයක් රු. මිලියන 1 ක ප්‍රථම ත්‍යාගයක් සහ වෙනත් සිත්ගන්නා සුළු ත්‍යාග |
| දායකත්වය | : පිරිවැටුමෙන් 10% කෘෂිකර්ම අමාත්‍යාංශයට ගෙවනු ලැබේ. |



## සුපිරි වාසනා සම්පත

| | |
|---|---|
| විස්තරය | : මෙම ලොතරැයිය 1999 වසරේදී හඳුන්වා දෙන ලදී. ටිකට්පතෙහි මිල රු.20/ කි. |
| දිනුම් ඇදීන දින | : බදාදා, සෙනසුරාදා |
| ත්‍යාග | : රු. මිලියන 10 හෝ ඊට වැඩි සුපිරි ත්‍යාගයක් රු. මිලියන 1 ක ප්‍රථම ත්‍යාගයක් සහ වෙනත් සිත්ගන්නා සුළු ත්‍යාග |
| දායකත්වය | : බදාදා දින දිනුම් ඇදීන ලොතරැයියෙහි අලෙවි පිරිවැටුමෙන් 10% රණවිරු සේවා අධිකාරියට දෙනු ලබන අතර සෙනසුරාදා දිනුම් ඇදීන ලොතරැයියෙහි අලෙවි පිරිවැටුමෙන් 10% ක්‍රීඩා හා සමාජ සේවා අමාත්‍යාංශවලට සමානව බෙදා දෙනු ලැබේ. |




## ජාතික සම්පත

| | |
|---|---|
| විස්තරය | : සුවසෙත හා ශ්‍රම වාසනා ලොතරැයි දෙකම වෙනුවට 2010 වසරේදී මෙම ලොතරැයිය හඳුන්වා දෙන ලදී. ටිකට්පතෙහි මිල රු.20/ කි. |
| දිනුම් ඇදීන දින | : බදාදා, සෙනසුරාදා |
| ත්‍යාග | : රු. මිලියන 5 හෝ ඊට වැඩි සුපිරි ත්‍යාගයක් රු. මිලියන 2 ක ප්‍රථම ත්‍යාගයක් සහ වෙනත් සිත්ගන්නා සුළු ත්‍යාග |
| දායකත්වය | : බදාදා දින දිනුම් ඇදීන ලොතරැයියෙහි අලෙවි පිරිවැටුමෙන් 10% සෞඛ්‍ය අමාත්‍යාංශයටද සෙනසුරාදා ලොතරැයියේ අලෙවි පිරිවැටුමෙන් 10% කම්කරු අමාත්‍යාංශයටද බෙදා දෙනු ලැබේ. |




## සම්පත් රේඛා

| | |
|---|---|
| විස්තරය | : 2012 මාර්තු මස මෙම ලොතරැයිය හඳුන්වා දෙන ලදී. ටිකට්පතෙහි මිල රු.20/ කි. |
| දිනුම් ඇදීන දින | : අඟහරුවාදා, සිකුරාදා, ඉරිදා |
| ත්‍යාග | : රු මිලියන 10 හෝ ඊට වැඩි සුපිරි ත්‍යාගයක්, රු මිලියන 1 ක ප්‍රථම ත්‍යාගයක් සහ වෙනත් සිත්ගන්නා සුළු ත්‍යාග |
| දායකත්වය | : අලෙවි පිරිවැටුමෙන් 10% ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබේ. |



## මෙගා 50 ලොතරැයිය

විස්තරය : ජාතික ලොතරැයි මණ්ඩලයේ 50 වැනි සංවත්සරය වෙනුවෙන් 2013 ඔක්තෝබර් මස මෙම ලොතරැයිය හඳුන්වා දෙන ලදී. ටිකට්පතෙහි මිල රු.100/ කි.

දෙවන සහ තුන්වන දිනුම් ඇදීම් මෙගා මිලියන් ලෙස නම් කළ අතර එම දිනුම් ඇදීම් පිළිවෙලින් 2013 දෙසැම්බර් හා 2014 මාර්තු මස පවත්වන ලදී.

ත්‍යාග : රු. මිලියන 50 ක සුපිරි ත්‍යාගයක් පිරිනැමේ. අනිකුත් ත්‍යාග එක් එක් දිනුම්වාරයේ ත්‍යාග රටාව අනුව වෙනස් වේ. පළමු දිනුම්වාරයේ ප්‍රථම ත්‍යාග ලෙස පැන්ඩා වර්ගයේ මෝටර් රථ 50 ක් පිරිනමන ලදී. සෝටි වර්ගයේ ජීප් රථ 27 ක් දෙවන දිනුම්වාරයේ ද, ජීප්රථ 13ක් තුන්වන දිනුම් වාරයේ දී ද ප්‍රථම ත්‍යාග ලෙස පිරිනමන ලදී.

දායකත්වය : අලෙවි පිරිවැටුමෙන් 10% ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබේ.




## පවර් ලොටෝ

විස්තරය : මෙම ලොතරැයිය 2014 වසරේ ජූලි මස හඳුන්වාදෙන ලදී. ටිකට්පතෙහි මිල රු. 20 කි.

ත්‍යාග : රු. මිලියන 5 හෝ ඊට වැඩි සුපිරි ත්‍යාගයක් සහ වෙනත් සිත් ගන්නා සුළු ත්‍යාග.

දායකත්වය : පිරිවැටුමෙන් 10% ක් ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබේ.




## එයාර්පෝට් සුපර්ඩ්‍රෝ

විස්තරය : සිවිල් ගුවන්සේවා අධිකාරියට අරමුදල් ඉපයීමේ පරමාර්ථයෙන් ජාතික ලොතරැයි මණ්ඩලය විසින් 1992 වසරේ එයාර්පෝට් සුපර්ඩ්‍රෝ ලොතරැයිය හඳුන්වාදෙන ලදී.
වර්තමානයේ එම ටිකට්පත ඇමෙරිකානු ඩොලර් 50කට හෝ ඊට සමාන පරිවර්තිත මුදල්වලට අලෙවි කරනු ලැබේ. දිනුම් ඇදීමට අදාල නියමිත ටිකට්පත් ප්‍රමාණය (වර්තමානයේදී ටිකට්පත් 6,000) විකිණී අවසන් වීමෙන් පසු දිනුම් ඇදීම සිදු කරනු ලැබේ.

ත්‍යාග : සුපිරි අති සුඛෝපභෝගී (Benz හෝ BMW) මෝටර් රථයක් පිරිනමනු ලැබේ.

දායකත්වය : ශුද්ධ ආදායම සිවිල් ගුවන්සේවා අධිකාරියට යොමු කරනු ලැබේ.



# ක්ෂණික ලොතරැයි

## සෙවණ ලොතරැයි

විස්තරය : නිවාස ඉදිකිරීම සඳහා අරමුදල් ඉපයීමේ පරමාර්ථයෙන් 1985 වසරේදී ආරම්භ කරන ලදී. ජාත්‍යන්තරව පිළිගත් සූරන ලොතරැයි තාක්ෂණය යොදාගත් ජනප්‍රිය ක්ෂණික ලොතරැයියකි. සෙවණ ලොතරැයිය වෙනම ආයතනයක් ලෙස මෙහෙයුම් කටයුතු සිදුකරන ලද අතර පසුව 1990 වසර අවසානයේදී ජාතික ලොතරැයි මණ්ඩලය හා ඒකාබද්ධ කරන ලදී.

දායකත්වය : අලෙවි පිරිවැටුමෙන් 10% නිවාස අමාත්‍යාංශයට යොමු කරනු ලැබේ.




## සමෘද්ධි

විස්තරය : සමෘද්ධි අධිකාරියට අරමුදල් ඉපයීමේ පරමාර්ථයෙන් 1996 වසරේදී මෙම ලොතරැයිය ආරම්භ කරන ලදී. මෙය ජාතික ලොතරැයි මණ්ඩලය විසින් වෙළඳපලට හඳුන්වා දුන් පළමු ක්ෂණික ලොතරැයිය වේ. දිනුම් ලාභීන් නිශ්චය කිරීම සඳහා ජාත්‍යන්තරව පිළිගත් සූරන ලොතරැයි තාක්ෂණය යොදාගෙන ඇත.

දායකත්වය : අලෙවි පිරිවැටුමෙන් 10% සමෘද්ධි හා තරුණ කටයුතු අමාත්‍යාංශයට යොමු කරනු ලැබේ.



# 2 විධායක වාර්තා



# සභාපතිගේ සමාලෝචනය

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ජාතික ලොතරැයි මණ්ඩලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරන්නේ සතුටිනි. එසේ වුවත් 2015 සභාපතිනිය ලෙස රාජකාරි භාරගත්තායින් පසු මා වෙත පැවරුන වගකීම මත පසුගිය වසරේ ප්‍රතිඵල පිළිබඳ මෙම වාර්තාව ඉදිරිපත් කරමි.

## මෙහෙයුම් ප්‍රතිඵල

2013 වසරේ රු මිලියන 14,537 වූ අලෙවි පිරිවැටුමට සාපේක්ෂව 2014 වසරේ අලෙවිය අඛණ්ඩව වැඩිවූ අතර රු. මිලියන 15,153 ක අලෙවි පිරිවැටුමක් ලබා ගැනීමට සමත් වූ අතර එය රු. මිලියන 616 ක වැඩිවීමකි.

2013 වසරේ රු. මිලියන 7,083 වූ ත්‍යාග සඳහා ගෙවීම් 2014 වසරේ 7311 වූ අතර එය රු. මිලියන 228 ක වැඩිවීමකි. 2013 වසරේ ඒකාබද්ධ අරමුදලට ගෙවීම් රු. මිලියන 1,753 ක් වූ අතර 2014 වසරේදී එය රු. මිලියන 1,888 වූ අතර එය රු. මිලියන 135 ක වැඩිවීමකි.

අලෙවියේ වැඩිවීම මත 2013 වසරේ අලෙවි නියෝජිතයින්ට ගෙවූ රු. මිලියන 2,701 ට සාපේක්ෂව අලෙවියේ වැඩිවීම මත 2014 වසරේ 2014 වසරේදි රු. මිලියන 2,818 ක් ගෙවන ලදී.

2013 වසරේ රු.මිලියන 1,827 වූ දළ ලාභයට සාපේක්ෂව 2014 වසරේ රු. මිලියන 1,908 ක දළ ලාභයක් ලැබූ අතර එය පසුගිය වසරට වඩා රු. මිලියන 81.0 ක වැඩිවීමකි.

කෙටිකාලින ආයෝජන අඩුවීම හා පොලී අනුපාත අඩුවීම නිසා 2013 වසරේ රු. මිලියන 220 ක් වූ ප්‍රධාන වශයෙන්ම පොලී ආදායම මත උපයාගත් වෙනත් ආදායම් 2014 වසරේදී රු. මිලියන 88 ක් විය.

2013 වසරේ රු. මිලියන 2,013 ක් වූ අලෙවි හා විකුණුම් වියදම් 2014 රු.මිලියන 1,209 වූ අතර එය ආසන්න වශයෙන් රු.මිලියන 316 ක වැඩිවීමක් නිසා මෙහෙයුම් වියදම් සමස්තයක් වශයෙන් වැඩිවීමක් පෙන්වයි.

2013 වසරේ රු. මිලියන 476 ක් වූ මණ්ඩලයේ බදු පෙර ලාභ 2014 වසර වන විට රු.මිලියන 109 ක් වූ අතර එය රු. මිලියන 367 කින් අඩුවීමක් පෙන්වයි. 2013 වසරේ රු.මිලියන 133.4 වූ බදු පසු ශුද්ධ පාඩුවට සාපේක්ෂව 2014 වසරේදි බදු පසු ශුද්ධ පාඩුව රු.මිලියන 8.6 ක් විය.

පෙර වර්ෂයේ එනම් 2013 වර්ෂයේ බිහිකළ සුපිරි ත්‍යාගලාභින් 27 දෙනෙකුට සාපේක්ෂව 2014 වර්ෂයේ ත්‍යාගලාභින් 27 දෙනෙකු බිහිකිරීමට මණ්ඩලයට හැකිවිය.

විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු වන රවි අබේවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන විගණන හා කළමණාකරන රැස්වීම් 4 ක් මෙම වසරේදි පවත්වන ලදී.

ක්‍රියාකාරී අධ්‍යක්ෂතුමාගේ වාර්තාවේ මූල්‍යමය ප්‍රමුඛතාවයන් දක්වා ඇති අතර ඊට පසු පිටුවල නිෂ්පාදන ධාරාව, පසුගිය ප්‍රතිඵලවල සන්සන්දනාත්මක කාර්යසාධනය වෙන වෙනම ඉදිරිපත් කර ඇත.

## ඉදිරි ගමන

2015 පෙබරවාරි මස පත්කරන ලද අධ්‍යක්ෂ මණ්ඩලය නව උපාය මාර්ග හා ඉතා ඵලදායි පිරිවැය පාලන ක්‍රමවේදයක් අනුගමනය කරමින් යහපත් කාර්යක්ෂම ප්‍රතිඵලයක් ලගා කර ගැනීමට ගත හැකි හැම පියවරක්ම ගෙන ඇත.

නියෝජිත ජාලය වඩාත් හොඳින් තක්සේරුවකට ලක් කර අවධානය යොමු කළ යුතු දුර්වල ප්‍රදේශ හඳුනාගැනීමටත් එම දුර්වල ස්ථාන ශක්තිමත් කිරීමට ගත හැකි සෑම පියවරක්ම ගැනීමට මණ්ඩලය බලාපොරොත්තු වේ.
වකුගඩු රෝගය රටින් තුරන් කිරීමේ අරමුණින් ඇති කළ ජාතික වකුගඩු අරමුදලට අරමුදල් උත්පාදනය වෙනුවෙන් ලොතරැයියක් ක්‍රියාත්මක කිරීමට නව අධ්‍යක්ෂ මණ්ඩලය සැලසුම් කර ඇත.

විකුණුම් හා වෙලඳපල ප්‍රසාරණය කිරීම සඳහා ලොතරැයි දිනුම් ඇදීම් ව්‍යුහය වෙනස් කිරීමට මණ්ඩලය අදහස් කරයි.

ඉතිහාසයේ විශේෂිත සිදුවීමක් ලෙස හැඳින්විය හැකි ජාතික ලොතරැයි මණ්ඩලයට ස්ථිර කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ක්‍රියා මාර්ග ගැනීමට මණ්ඩලය දැඩි අපේක්ෂාවෙන් පසුවෙයි.

## ප්‍රණාමය

අලෙවි සහායකයින්ගෙන්, අලෙවි නියෝජිතයින්ගෙන් සහ දිස්ත්‍රික් නියෝජිතයින්ගෙන් සමන්විත වන දිවයින පුරා විසිරී සිටින අපගේ සමස්ත අලෙවි ජාලයට ඔවුන්ගේ වටිනා දායකත්වයට ස්තුති කිරීම සඳහා මෙය අවස්ථාවක් කර ගන්නා අතර එලඹෙන වසර තුලදීත් වඩාත් හොඳ කාර්යක්ෂමතාවක් අපේක්ෂා කරමි.

කළමණාකාරීත්වය සහ සමස්ත සේවක මඩුල්ල වසර පුරා සිදුකළ අතිමහත් සේවයට ස්තූතිය පල කරන අතර 2015 වසර තුලදීත් එලෙස කැපවීමෙන් සේවය කරනු ඇතැයි අපේක්ෂා කරමි.

ලබාදෙන වටිනා මඟපෙන්වීම් හා උපදෙස් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට ස්තුති කරමි. අපගේ ප්‍රධාන බැංකුකරුවන මහජන බැංකුව ලබාදුන් සේවයට, ලොතරැයි ටිකට්පත් කලට වේලාවට ලබාදුන් මුද්‍රණකරුවන්ට, විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට හා අනෙකුත් විගණන සමාගම්වලට වසර තුලදී ලබාදෙන ලද වටිනා සේවය වෙනුවෙන් ස්තුතිය පළ කරමි.

අපගේ ලොතරැයි කෙරේ නොබිඳුනු විශ්වාසයකින් සිටින අපගේ පාරිභෝගික ජනතාව අගය කරන අතර ඔවුන් නොවන්නට අද අප මෙම තත්ත්වයේ නොසිටිනු ඇත. ඔවුන් බලාපොරොත්තු වන සැබෑ නොවන සිහින සැබෑ කර ගැනීමට වඩාත් හොඳ අවස්ථාවන් ඉදිරිපත් කිරීමට කටයුතු කරන බවට පොරොන්දු වෙමි.

තවද මුදල් අමාත්‍ය රවි කරුණානායක මැතිතුමාට සහ මුදල් අමාත්‍යාංශයේ ලේකම් හා මුදල් අමාත්‍යාංශයේ අනිකුත් නිලධාරීන්ට 2015 පෙබරවාරි සිට ලබාදෙන ලද සහයෝගයට ස්තුතිවන්ත වෙමි.

**ශ්‍යාමිලා පෙරේරා,**
සභාපතිනි,
ජාතික ලොතරැයි මණ්ඩලය,
2015 මැයි 12 දින,
කොළඹ.

# ක්‍රියාකාරි අධ්‍යක්ෂගේ වාර්තාව

2014 වසරේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා ජාතික ලොතරැයි මණ්ඩලයේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශණ අධ්‍යක්ෂ මණ්ඩලය සතුටින් ඔබ වෙත ඉදිරිපත් කරමු.

## අඛණ්ඩ පැවැත්ම

ජාතික ලොතරැයි මණ්ඩලයේ මෙහෙයුම් කටයුතු ඉදිරියටත් අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා ප්‍රමාණවත් සම්පත් පැවතීම සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමකට පත්වේ. එම නිසා මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්මේ පදනම මත පිළියෙල කර ඇත.

## ප්‍රධාන ක්‍රියාකාරකම්

ජාතික ලොතරැයි මණ්ඩලය ලොතරැයි ව්‍යාපාරයේ වෙළඳ ප්‍රමුඛයා වන අතර එහි ප්‍රධාන කාර්යය වන්නේ දිනුම් අදින හා ක්ෂණික ලොතරැයි පවත්වාගෙන යාමයි. සමාලෝචිත වසරේදී මෙම ක්‍රියාකාරකම් ස්වභාවයේ කිසිදු වෙනසක් සිදු නොවිණි.

## මෙහෙයුම් සමාලෝචනය

2014 වසරේ ජාතික ලොතරැයි මණ්ඩලයේ මෙහෙයුම් කටයුතුවල කෙටි සමාලෝචනයක් සභාපතිගේ වාර්තාවේද මූල්‍යමය ප්‍රමුඛතාවයන් හා එක් එක් ලොතරැයිවල කාර්යසාධනයේ විස්තරාත්මක සමාලෝචනයක් මෙහෙයුම් හා මූල්‍ය සමාලෝචනය යටතේ දක්වා ඇත.

## සංචිත

2014 දෙසැම්බර් 31 දිනට මුළු සංචිතවල වටිනාකම රු. මිලියන 1,077.0 වන අතර එහි විචලනය ස්කන්ධ ප්‍රාග්ධනයේ වෙනස්කම් ප්‍රකාශයේ සදහන්ව ඇත.

## ශේෂ පත්‍ර දිනට පසුව සිදුවන සිදුවීම්

මූල්‍ය ප්‍රකාශනවල ශේෂ පත්‍ර දිනට පසුව සිදුවන සිදුවීම් සඳහා ගැලපීම් කිරීමට හෝ පැහැදිලි කිරීම් කිරීමට අවශ්‍යතාවයක් පැන නැගී නැත.

## මානව සම්පත් සංවර්ධනය

පෙර වර්ෂයේ සිටි 309 ක් වූ සේවක සංඛ්‍යාවට සාපේක්ෂව 2014 වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට සේවකයින් 317 ක් දෙනෙකු සේවයේ නිරත විය.

ආයතනයක සාර්ථකත්වය සඳහා ඇති වටිනාම වත්කම වන්නේ මානව ප්‍රාග්ධනය බව අපි තරයේ විශ්වාස කරමු. එබැවින් සේවකයින්ගේ ප්‍රශස්ත දායකත්වය ලබා ගැනීමට උපකාර වන හා පෞද්ගලික හා සාමූහික අරමුණු සාක්ෂාත් කර ගැනීමට පහසුකම් සලසන සේවකයින් පුහුණු කිරීම හා සංවර්ධනය සඳහා වූ යෝග්‍ය මානව සම්පත් ප්‍රතිපත්තීන් හා ක්‍රියාමාර්ගයන් ගනු ලැබේ.

එමනිසා ජාතික ලොතරැයි මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ කළමණාකරනය සේවක සුභසාධනය සඳහා වැඩි අවධානයක් යොමු කොට ඇත.

විකුණුම් දිරි දීමනා ක්‍රමය හා සේවක වෛද්‍ය රක්ෂණ ක්‍රමය මෙම වසරේදීත් අඛණ්ඩව පවත්වාගෙන යන ලදී. ඊට අමතරව සමාලෝචිත වසරේදී සේවකයිනට හා ඔවුනගේ පවුලේ සාමාජිකයින්ට වැඩි පහසුකම් ලබාදීමේ අරමුණින් වෛද්‍ය රක්ෂණ ක්‍රමය ප්‍රතිශෝධනය කරන ලදී. සේවකයින්ගේ කුසලතා හා දැනුම වර්ධනය කිරීම සඳහා නව සේවක පුහුණු කිරීම් ක්‍රමයක් ක්‍රියාත්මක කරන ලදී.

## රජයට කරන ලද දායකත්වය

2013 වසරේදී ගෙවන ලද රු. මිලියන 3,822.00 ට සාපේක්ෂව ඒකාබද්ධ අරමුදලට කළ සෘජු ප්‍රතිපාදන හා බදු මගින් කරන ලද වක්‍ර ප්‍රතිපාදන ලෙස 2014 වසරේ රු. මිලියන 3,004.8 ක් මණ්ඩලය විසින් රජයට ලබාදෙන ලද අතර විස්තර පහත පරිදි වේ.

| මුළු ප්‍රතිපාදන | 2014<br>රු. මිලි | 2013<br>රු.මිලි |
|---|---|---|
| **සෘජු ප්‍රතිපාදන** | | |
| ඒකාබද්ධ අරමුදලට දායකත්වය | 1,888.4 | 1,753.1 |
| මහා භාණ්ඩාගාරයට කරන ලද විශේෂ දායකත්වය | - | 500.0 |
| | **1,888.4** | **2,253.1** |
| **වක්‍ර ප්‍රතිපාදන** | | |
| එකතු කළ වටිනාකම් මත බදු | 540.5 | 507.7 |
| ජාතිය ගොඩනැගීමේ බදු | 211.7 | 203.5 |
| ආදායම් බදු/ | 117.8 | 610.0 |
| අහිමිකළ ත්‍යාග | 246.4 | 247.7 |
| | **1,116.4** | **1,568.9** |
| **රජයට කරන ලද මුළු ප්‍රතිපාදන** | **3,004.8** | **3,822.0** |

## දේපල යන්ත්‍ර හා උපකරණ

සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලය රු. මිලියන 128.5 ක මුදලක් දේපල යන්ත්‍ර හා උපකරණවල ආයෝජනය කරන ලදී.

## මෙහෙයුම් වියදම්

සමාලෝචිත වර්ෂයේ රු. මිලියන 1,887.8 ක් වු මුළු මෙහෙයුම් වියදම් පෙර වර්ෂයේ රු. මිලියන 1,571.3 සමග සසදන විට 20.1 ක % වැඩිවීමක් පෙන්වන අතර මෙය මුළු පිරිවැටුමේ ප්‍රතිශතයක් ලෙස ගත් විට පසුගිය වසරේ 10.8 % ක් වූ අතර මෙම වසරේ එය 12.4% කි.

## මූල්‍ය ප්‍රකාශන සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂවරුන්ගේ වගකීම වේ. මූල්‍ය ප්‍රකාශන පොදු සම්මත ගණක මූලධර්මවලට හා ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන්වලට අනුකූලව පිළියෙල කර ඇත.

## සමාප්තිය

ආයතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා කළමණාකරනය හා සේවක මඩුල්ල, දිස්ත්‍රික් අලෙවි නියෝජිතයින්, සාමාන්‍ය අලෙවි නියෝජිතයින් විසින් ලබාදෙන ලද අග්‍රගණ්‍ය දායකත්වයට සහ සහයෝගයට ස්තුති කිරීම සඳහා මෙය අවස්ථාවක් කර ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය බලාපොරොත්තුවේ. තවද මහජන බැංකුව, සැපයුම්කරුවන්, මුද්‍රණකරුවන් සහ විගණකවරු විසින් ලබාදෙන අඛණ්ඩ කැපවීමෙන් යුතු පක්ෂපාති දායකත්වයට ස්තුතිය ප්‍රකාශ කර සිටිමු.



**එම්. කේ. හසන්,**
ක්‍රියාකාරි අධ්‍යක්ෂ,
ජාතික ලොතරැයි මණ්ඩලය,
2014 මැයි 12 දින,
කොළඹ.

# විගණන හා කළමණාකරන කමිටු වාර්තාව

## දළ විශ්ලේෂණය

විගණන හා කළමණාකරන කමිටුව 2005 වසරේ ස්ථාපිත කරන ලද අතර එතැන් සිට සෑම වසරකම යොදාගත් පරිදි රැස්වීම් වාර පවත්වන ලදී. 2014 වසරට රැස්වීම් වාර 4ක් පවත්වනු ලැබීය. පැන නගින ගැටළු හඳුනා ගැනීමට හා ඒවාට අවශ්‍ය අවස්ථාවල උපදෙස් කළමණාකාරිත්වය වෙත ලබාදීමට හැකියාව පැවතිණි.

සමාලෝචිත වසර තුල කමිටුව පහත සදහන් සාමාජික මණ්ඩලයෙන් සමන්විත විය.

| | | |
|---|---|---|
| ආර්. ජේ. ටී. අබේවර්ධන මහතා | - | සභාපති (විධායක නොවන අධ්‍යක්ෂ) |
| සම්පත් දිසානායක මහතා | - | සාමාජික (විධායක නොවන අධ්‍යක්ෂ) |
| එච්. ජී. සුමනසිංහ මහතා | - | භාණ්ඩාගාර නියෝජිත |
| නාලක කළුවැව මහතා | - | සාමාන්‍යාධිකාරී |
| හර්ෂ බණ්ඩාර මහතා | - | ප්‍රධාන මූල්‍ය නිලධාරී |
| එස්. බාලසූරිය මිය | - | ලේකම් (සාමාන්‍යාධිකාරී නීති ,අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්) |

## නිරීක්ෂකයින්


| | | |
|---|---|---|
| අභ්‍යන්තර විගණක | - | ප්‍රසාද් විල්ආරච්චි මහතා |
| නියෝජිත | - | විගණකාධිපති දෙපාර්තමේන්තුව |

කළමණාකරනයේ අනිකුත් සාමාජිකයින් පැහැදිලි කිරීම් අවශ්‍යවන අවස්ථාවලදී රැස්වීම්වලට කැදවයි. මූල්‍යමය ප්‍රකාශනවල සම්පූර්ණත්වය, අවදානම් කළමණාකරනය, අභ්‍යන්තර පාලනය, නීති රීති හා නියාමන අවශ්‍යතාවලට අනුකූලවීම, බාහිර විගණකවරුන්ගේ කාර්යසාධනය, සුදුසුකම්, ස්වාධීනත්වය හා අභ්‍යන්තර විගණකවරුන්ගේ කාර්යසාධනය, යනාදිය සම්බන්ධ කටයුතුවලදී අධ්‍යක්ෂ මණ්ඩලයට සහයෝගය දැක්වීම විගණන හා කළමණාකරන කමිටුවේ කාර්යභාරය නිර්දේශය හා නියමය වේ.

සමාලෝචිත වසර තුල කමිටුව විසින් මූල්‍ය ප්‍රකාශන සමාලෝචනයට භාජනය කරන ලද අතර ගිණුම්කරණ පිළිවෙල පිළිබඳ සෑහීමකට පත්වේ. වාර්ෂික වාර්තා, සංයුක්ත සැලැස්ම ක්‍රියාකාරී සැලැස්ම, කාර්තු ගත වාර්තා සහ විගණන විමසීම්ද කමිටුව විසින් සමාලෝචනය කරන ලදී.



**ශ්‍යාමිණි බාලසූරිය,**
ලේකම්,
විගණන හා කළමණාකරන කමිටුව,
ජාතික ලොතරැයි මණ්ඩලය,
2015 මැයි 12 දින.



# 3 අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ තොරතුරු

# විගණකාධිපති වාර්තාව

2015 ඔක්තෝබර් 09 දින
එෆ් ආර් 2/ඒ/එන්එල් බී/1/14/2
සභාපති,
ජාතික ලොතරැයි මණ්ඩලය

**ජාතික ලොතරැයි මණ්ඩලයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

ජාතික ලොතරැයි මණ්ඩලයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වු ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරණ මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1963 අංක 11 දරණ මුදල් පනතේ අංක 11 (ආ) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් මණ්ඩලයේ සභාපති වෙත 2015 අගෝස්තු 10 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමණාකරනයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවු මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමණාකරනයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පරිපාටින් වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමණාකරනය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ.

විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරණ මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 අහිතකර මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලට ගැලපීම කර තිබුණේ නම් අනුගාමී මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් බොහෝමයක් මූලිකාංගවලට ප්‍රමාණාත්මක ලෙස බලපෑ හැකිව තිබුනි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 අහිතකර මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2014 දෙසැම්බර් 31 දිනට ජාතික ලොතරැයි මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 01

(i) මණ්ඩලය සතු වාහන අලෙවි හා බෙදාහැරීමේ කටයුතු සඳහාද යොදාගන්නා බැවින් උපයෝජනය වෙනුවෙන් වූ රු. 37,514,257 ක වියදමෙන් සාධාරණ පදනමකින් කොටසක් අලෙවි හා බෙදාහැරීමේ වියදම් ලෙස අවශෝෂණය කළ යුතු නමුත් ඊට පටහැනිව මුළු වියදම ම විකුණුම්, අලෙවි හා බෙදාහැරීමේ වියදම් යටතේ දක්වා තිබූ අතර සන්නිවේදන සහ මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය වියදම් වෙනුවෙන් වූ රු. 44,014,105 ක වියදම භාවිතා කිරීමේ අරමුණ අනුව සාධාරණ පදනමකින් විකුණුම් අලෙවි හා බෙදාහැරීමේ වියදම් සහ ආයතන හා පරිපාලන වියදම් යටතේ වර්ගීකරණය කර දැක්විය යුතු වුවත් මුළු වියදමම විකුණුම් අලෙවි හා බෙදාහැරීමේ වියදම් යටතේ දක්වා තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශනවල ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයේ (Statement of Changes in Equity) දක්වා ඇති ත්‍යාග සංචිත ගිණුමෙන් ලබාගත් රු. 325,000,000.00 ණය මුදල සම්බන්ධයෙන් ප්‍රමාණාත්මක හෙළිදරව් කිරීමක් මූල්‍ය ප්‍රකාශන තුල සිදුකර නොතිබුණි.

(iii) මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර ඇති ගිණුම් සටහන් තුළ ත්‍යාග සංචිත ගිණුම, ආදායම් බදු වෙනුවෙන් භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු මුදල් ශේෂය හා ඊට අනුරූපව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ගෙවිය යුතු මුදල් ශේෂය පිළිබද ප්‍රමාණාත්මක හෙළිදරව් කිරීමක් සිදු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 02

තොගය පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගයෙන් අඩු අගය මත ගණනය කර මූල්‍ය ප්‍රකාශන තුල දැක්විය යුතු වුවත් ඉකුත් වර්ෂයේ මණ්ඩලය විසින් ප්‍රවර්ධන භාණ්ඩ තොගයක් ප්‍රත්‍යාගණනය කර රු. 1,343,522 ක ප්‍රත්‍යාගණන ලාභයක් ප්‍රත්‍යාගණන සංචිත ගිණුමට බැර කර තිබුණ හෙයින් සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ප්‍රත්‍යාගණන සංචිත ගිණුම එම ප්‍රමා-ණයෙන් අධිතක්සේරු වී තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07

පහත සදහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) මණ්ඩලයේ මෙහෙයුම් කටයුතුවලදී මුදල් ප්‍රවාහයන් ගලා ඒමක් හෝ ගලායාමක් සිදුනොවූ ප්‍රත්‍යාගණන සංචිතයේ රු. 22,167,055 ක හා ත්‍යාග සංචිත ගිණුමේ රු. 56,377,929 ක වැඩිවීම සහ ආදායම් බදු වෙනුවෙන් ඒකාබද්ධ අරමුදලෙන් ලැබිය යුතු මුදල් ගිණුමේ රු. 521,049,738 ක අඩුවීම මුදල් ප්‍රවාහ ප්‍රකාශණය සැකසීමේදී අදාල කර ගෙන තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දැක්විය යුතු පාරිතෝෂික ගෙවීම්, එකතු කළ අගය මත බදු සහ ජාතිය ගොඩනැගීමේ බදු ගෙවීම්, ආදායම් බදු සහ විලම්භිත බදු ගෙවීම හා ත්‍යාග ගෙවීම් වටිනාකම් පිළිවෙලින් රු. 1,137,525 ක්, රු. 778,755,390 ක්, රු. 985,216,486 ක් හා රු 7,515,196,737 ක් සාවද්‍ය ලෙස මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 10

මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට අනුමැතිය ලබාදීම හා අනුමත කළ දිනය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණ අතර මූල්‍ය ප්‍රකාශන අනුමත කළ දිනට පසු සිදුවීම්ද අනාවරණය කර නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16

(i) දේපල පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කිරීමට අදාලව ප්‍රත්‍යාගණනය කළ දිනය, ස්වාධීන තක්සේරුකරුවෙකු සම්බන්ධ වී තිබේද හා සාධාරණ අගය ගණනය කිරීමේදී භාවිතා කර ඇති ක්‍රමය හා උපකල්පනයන් මූල්‍ය ප්‍රකාශන තුල හෙළිදරව් කර නොතිබුණි.

(ii) ආයෝජන දේපල යටතේ දක්වා ඇති මන්නාරමේ සංචාරක බංගලාවේ ප්‍රත්‍යාගණන අලාභය රු 27,296,728 ට අදාලව ප්‍රමාණවත් හෙළිදරව් කිරීමක් මූල්‍ය ප්‍රකාශන තුල සිදුකර නොතිබුණි.

(ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19

ආයු ගණක උපකල්පනයන්හි වෙනස්වීම් හේතුවෙන් ඉකුත් වර්ෂයේ සිදු වී ඇති රු. 12,385,733 ක් වූ සේවක පාරිතෝෂික අඩිවෙන් කිරීම වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ දක්වා තිබුණද අඩිවෙන් කිරීම ඇතිවීමට පදනම් වූ හේතුව විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ දක්වා නොතිබුණි.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 38

ප්‍රමිතියට අනුව අස්පෘෂ්‍ය වත්කම් සම්බන්ධයෙන් ඵලදායි ජීවකාලය හෝ භාවිතා කළ ක්‍රමක්ෂය අනුපාතය, භාවිතා කළ ක්‍රමක්ෂය ක්‍රමය හා හඳුනාගත් හානිකරනා අලාභ ආදී තොරතුරු ප්‍රමාණවත් ලෙස මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

(ඌ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 39

සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට පැවති රු. 101,708,309 ක් වූ සේවක ණය ශේෂය ලියාහල පිරිවැයට (Amortized Cost) අගය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණ අතර සේවක ණය පොලී අගය කිරීමේ ක්‍රමවේදයද මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කිරීමද සිදු කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සදහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලය විසින් ලොතරැයි පවත්වා ලැබෙන ආදායමින් සමාලෝචිත වර්ෂයේ ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කළ රු.1,888,455,133 ක් වූ මුදල විකුණුම් පිරිවැයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල ගලපා තිබුණ හෙයින් සමාලෝචිත වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) ත්‍යාග ලබා ගැනීම සඳහා ජයග්‍රාහකයින් ඉදිරිපත් නොවූ විට අදාල ත්‍යාග මුදල මණ්ඩලයේ අරමුදලට බැර කර අනතුරුව භාණ්ඩාගාරයට ගෙවිය යුතු නමුත් මණ්ඩලය විසින් ඉකුත් වර්ෂවලදී මෙන්ම සමාලෝචිත වර්ෂයේදිත් දිනුම් ඇදීමෙන් මාස හයක් ඉක්මගොස් තිබූ ත්‍යාග ලබා ගැනීම සඳහා ජයග්‍රාහකයින් ඉදිරිපත් නොවූ රු 246,424,920 ක් වටිනා ත්‍යාග මණ්ඩලයේ අරමුදලට බැර කිරීමකින් තොරව සෘජුවම භාණ්ඩාගාරයට ගෙවා තිබුණ අතර එම මුදල මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට මණ්ඩලයේ ජංගම ප්‍රචාරක අංශයේ නිලධාරියෙකු භාරයේ පැවති අලෙවි වටිනාකම රු.34,730,650 ක් වූ ලොතරැයිපත්, කලාප කළමණාකරුවන්ට සහ සුභසාධක සංගමයට ලබාදුන් රු.28,810,000 ක සූරන ලොතරැයිපත්, ණයට විකුණුම් ලෙස ගිණුම් ගත කර තිබුණ හෙයින් විකුණුම් ආදායම රු.63,540,650 ක් හා ණයගැති වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් ගිණුම්වල දක්වා තිබුණි. මෙම විකුණුම් අතරින් රු.47,242,500 ක විකුණුම් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින සිදුකර තිබුණි. මේ අයුරින් කලාප කළමනාකරුවන් වෙත ලොතරැයි පත් ණය පදනමට නිකුත් කළ ප්‍රථම අවස්ථාව මෙය වූ අතර ඇතැම් කලාප කළමනාකරුවන් 2015 අප්‍රේල් මාසය දක්වාත් ලොතරැයි පත් අලෙවි කිරීම සිදුකර නොතිබුණි.

(ඈ) ජාතිය ගොඩනැගීමේ බදු මුදල රු.211,761,787 ක් විකුණුම් හා බෙදා හැරීමේ වියදම් ලෙස ආදායම් ප්‍රකාශනයේ දැක්විය යුතු වුවත් මණ්ඩලය විසින් එම බදු මුදල ආදායම් ප්‍රකාශනයේදී ලොතරැයි අලෙවි ආදායමින් අඩුකර දක්වා තිබුණි.

(ඉ) 'කොළඹ ගුවන්තොටුපල ලොතරැයිය' පැවැත්වීමට අදාල ත්‍යාගය ලෙස මෝටර් රථය මිලදී ගැනීමේදී මණ්ඩලය විසින් තීරුබදු වෙනුවෙන් ගෙවා තිබුණු රු.8,240,950 ක්, වියදමක් ලෙස ගිණුම් ගත කිරීමෙන් තොරව ලැබිය යුතු ශේෂයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල හෙලිදරව් කර තිබුණි.

(ඊ) වටිනාකම රු. 2,169,622 ක් පාරිභෝජන ද්‍රව්‍ය තොගයක් මූල්‍ය ප්‍රකාශනවල දෙවරක් සටහන් කර තිබුණ අතර මණ්ඩලයේ තොග පොත් අනුව රු. 1,209,445 ක් වටිනා පාරිභෝජන ද්‍රව්‍ය මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(උ) දිනුම්වාරයන් සඳහා වෙන් කළ එහෙත් ජයග්‍රාහකයින්ට හිමි නොවු රු 56,377,929 ක ත්‍යාග මුදලක් සමාලෝචිත වර්ෂයේ ලාභයට ගලපා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයේදි ත්‍යාග සංචිත ගිණුමට මාරුකළ යුතු වුවත්, එසේ කිරීමෙන් තොරව ලෙජර ගිණුම් තුළින් ගලපා තිබුණ හෙයින් සමාලෝචිත වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

### 2.2.3 නොසැසඳු පාලන ගිණුම්

ගබඩා තොග පොත් හා මූල්‍ය ප්‍රකාශනවලට අදාලව මණ්ඩලය විසින් ලබාදුන් උපලේඛන සැසඳීමේදී පාරිභෝජන ද්‍රව්‍ය අයිතම 08 එකතුව රු.611,973 ක නොසැසඳීමක් අනාවරණය විය.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

ලෙජර් ගිණුම් 04 කට අදාල සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.71,649,794 ක බැර ශේෂවල හා එක් ලෙජර ගිණුමකට අදාල රු.526,547 ක හර ශේෂයක නිරවද්‍යතාවය තහවුරු කරගැනීම සඳහා විස්තරාත්මක උපලේඛන, ශේෂ සනාථ කිරීම් හෝ ශේෂයන් සකස් වී ඇති ආකාරය දැක්වෙන වාර්තා කිසිවක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සදහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 'කොළඹ ගුවන් තොටුපල ලොතරැයිය' පැවැත්වීම වෙනුවෙන් ගුවන් තොටුපල සංවර්ධන අධිකාරිය වෙත මණ්ඩලය විසින් 2008 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ගෙවිය යුතු රු 14,000,000 ක මුදලක් විය.

(ආ මණ්ඩලය විසින් ලොතරැයි අලෙවි නියෝජිතයන්හට ණය පදනම මත ලබාදී තිබුණු පාපැදි හා ලොතරැයි කුටි වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු. 10,260,252 ක් වූ ශේෂයෙන් රු. 6,353,177 ක් 2012 වර්ෂය හා ඊට පෙර වර්ෂවල සිට අයනොවී පවතින ණය ශේෂයන් විය.

## 2.4 නීති රීති රෙගුලාසි හා කළමණාකරන තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1997 අංක 35 දරණ මුදල් (සංශෝධිත) පනතින් සංශෝධිත 1963 අංක 11 දරණ මුදල් පනත | |
| (i) 14 (2) හා 17(1) අ වගන්තිය | මණ්ඩලයේ ත්‍යාග සංචිත ගිණුමේ පවතින මුදල් මණ්ඩලය මගින් පවත්වන ලොතරැයිවල ත්‍යාග ප්‍රදානය සඳහා පමණක් යොදාගත හැකි වුවත් සමාලෝචිත වර්ෂයේදි අවස්ථා 05 කදී පනතේ විධිවිධාන වලට පටහැනිව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ රු. 368,000,000 ක් ත්‍යාග සංචිත ගිණුමෙන් මණ්ඩලයේ වියදම් සඳහා ලබාගෙන තිබුණ අතර එම මුදලින් රු.43,000,000 ක් පමණක් සමාලෝචිත වර්ෂයේදී නැවත ත්‍යාග සංචිත ගිණුමට බැරකර තිබුණි. |
| (ii) 17 (2) වගන්තිය | ලොතරැයි ආදායමින් අදාල වියදම් අඩුකළ පසු ඉතිරි මුදල ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතුවුවත් ඉකුත් වර්ෂවලට අදාලව එසේ බැර කිරීමෙන් තොරව රු. 433,446,392 ක් රඳවා තිබුණි. |
| (iii) 20 (2) (1) වගන්තිය | විධිවිධාන ප්‍රකාර ලොතරැයි පැවැත්වීම සම්බන්ධයෙන් රීති සකස් කර විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන ගැසට් පත්‍රයේ පල කිරීමෙන් තොරව සම්පත් රේඛා, පවර් ලොටෝ හා මෙගා 50 මිලියන ලොතරැයි පවත්වා රු 2,060,227,100 ක අලෙවි ආදායමක් උපයාගෙන තිබුණු අතර එම ආදායමින් රු.997,394,123 ක් ත්‍යාග සඳහා වෙන් කිරීමටත් රු. 360,539,743 ක් අලෙවි නියෝජිත කොමිස් ගෙවීමටත් වියදම් කර තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | |
| xxiv පරිච්ඡේදයේ 11 වන වගන්තිය | 2005 ජනවාරි 01 දින සිට දේපල ණය ලබාදීම බැංකු මගින් සිදු කළ යුතු වුවත් මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේදී රු. 14,548,296 ක දේපල ණය මණ්ඩලයේ මුදල් උපයෝගි කරගෙන නිලධාරීන් වෙත ලබාදී තිබුන අතර දේපල ණය සඳහා නිලධාරියාගෙන් අයකළ යුතු පොලිය ලබාගත් ණය අනුව සියයට 4, 8 හා 11 බැගින් වූ අනුපාතයන්ට වුවත් මණ්ඩලය විසින් සියලුම දේපල ණය සඳහා සියයට 4 ක අවම පොලී අනුපාතය යටතේ ණය ලබාදී තිබුණි. |

| | |
|---|---|
| (ඈ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| (i) 6.5.1 ඡේදය | සමාලෝචිත වර්ෂයට අදාල මණ්ඩලයේ වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් මූල්‍ය ප්‍රකාශන සමග විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) 9.7 ඡේදය | භාණ්ඩාගාර අනුමැතිය ලබාගැනීමෙන් තොරව ලොතරැයි දිනුම් ඇදීම සඳහා සහභාගි වන නිලධාරීන්ට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ඉකුත් වර්ෂවලදී මෙන්ම සමාලෝචිත වර්ෂයේදී රු. 10,480,850 ක් ගෙවා තිබුණ අතර සමාලෝචිත වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ගාස්තු ඉහළ නංවා ගැනීමද සිදුකර තිබුණි. |
| (iii) 9.12 ඡේදය | භාණ්ඩාගාර අනුමැතිය ලබාගැනීමෙන් තොරව ඉකුත් වර්ෂවලදී මෙන්ම සමාලෝචිත වර්ෂයේදීද සුභසාධක සංගමය විසින් කරන ලද ඉල්ලීමට අනුව සභාපතිවරයාගේ අනුමැතිය මත කාර්ය මණ්ඩලය සඳහා සුභසාධන දීමනා රු. 13,940,315 ක් ගෙවා තිබුණි. |
| (ඇ) 1994 ජුනි මස 14 දිනැති අංක 95 දරණ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය හා 2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | දිරිදීමනා ගෙවීමේදී භාණ්ඩාගාර අනුමැතිය ලබා ගත යුතු වුවත් එසේ භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමෙන් තොරව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන් ඉකුත් වර්ෂවලදී මෙන්ම සමාලෝචිත වර්ෂයේදීද දිරිදීමනා ලෙස රු. 67,107,446 ක් ගෙවා තිබුණි. |
| (ඉ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.3.2 මාර්ගෝපදේශය | 2012 වර්ෂයේ ඔක්තෝම්බර් මාසයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා රු. 217,556,830 ක් වටිනා සම්පත් රේඛා ලොතරැයිපත් 176,654,881 ක් ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් තොරව අනෙකුත් ලොතරැයිපත් මුද්‍රණය කරවා ගන්නා පෞද්ගලික සැපයුම්කරුවකු මඟින්ම මුද්‍රණය කරවාගෙන තිබුණි. |
| (ඊ) 2011 පෙබරවාරි 9 දිනැති අංක 13/2008 (iv) දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | නිල වාහන හිමිකම ඇති නිලධාරීන් 09 දෙනෙකු සඳහා ගෙවිය යුතු මාසික ඉන්ධන දීමනාවලට පටහැනිව එම නිලධාරීන් සඳහා රු. 2,783,900 ක් ප්‍රතිපූර්ණය කර තිබුණි. |
| (උ) කළමණාකරන සේවා අංක 30 චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට අදාල 2006 දෙසැම්බර් 07 දිනැති අංක ඩිඑම්එස්/සී/එජ් සී/37 දරණ කළමණාකරන සේවා දෙපාර්තමේන්තු ලිපිය | සහකාර සාමාන්‍යාධිකාරී (නීති) නිලධාරිනියකගේ අනුමත ආරම්භක මූලික වැටුප් පියවර රු. 25,640 ක් වුවත් ඊට පටහැනිව 2009 පෙබරවාරි 16 දින සිට රු. 32,870 ක ආරම්භක වැටුප් පියවරෙහි පිහිටුවා වැටුප් ගෙවීමට කටයුතු කර තිබුණු අතර ඒ අනුව 2009 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රු. 499,800 ක වැටුප් වැඩිපුර ගෙවා තිබුණි. |
| (ඌ) 2011 පෙබරවාරි 11 දිනැති අංක 57 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6 (iii) හා (iv) ඡේද | මණ්ඩලය විසින් පුද්ගලික ආයතන, රාජ්‍ය ආයතන හා ආගමික උත්සව සඳහා සමලෝචිත වර්ෂයේදී අයිතම 13 ක් වෙනුවෙන් වියදම් කරන ලද එකතුව රු. 114,590,100 ක් වූ අනුග්‍රහ හා පරිත්‍යාග වියදම් සම්බන්ධයෙන් උක්ත විධිවිධාන ප්‍රකාරව විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

# 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 8,663,584 ක ඌණතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌණතාවය රු. 133,406,928 ක් වූයෙන් ඉකුත් වර්ෂය සමග සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 124,743,344 ක හෙවත් සියයට 93.5 ක වර්ධනයක් නිරීක්ෂණය විය. විකුණුම් පිරිවැය, වෙනත් ආදායම්, විකුණුම් අලෙවි සහ බෙදාහැරීමේ වියදම් හා පරිපාලන වියදම්වල රු. 949,784,471 ක අහිතකර විචලනයක් පැවතියද ලොතරැයි ආදායම මූල්‍ය වියදම හා ආදායම් බදු යන අයිතමයන්ගේ හිතකර විචලනය රු. 1,074,527,815 ක් මෙම ඌණතාවයේ අඩුවීමට බලපා තිබුණි.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයේ මණ්ඩලයේ ලාභදායිත්ව හා කාරක ප්‍රාග්ධන අනුපාත පිළිබඳ විග්‍රහයක් පහත දැක්වේ.

| අනුපාතය | වර්ෂය | |
|---|---|---|
| | 2014 | 2013 |
| (I) දළ ලාභ (ප්‍රතිශතය) | 13.3 | 13.2 |
| (ii) ශුද්ධ ලාභ/(අලාභ) (ප්‍රතිශතය) | (-0.06) | (-0.96) |
| (iii) ජංගම | 1.13:1 | 1.24:1 |
| (iv) ක්ෂණික වත්කම් | 1.07:1 | 1.18:1 |

මේ සම්බන්ධයෙන් පහත සදහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ලොතරැයි අලෙවි ආදායම රු. 615,771,275 කින් එනම් සියයට 4. 2 කින් වැඩිවී තිබීම දළ ලාභ අනුපාතය ඉහලයාම කෙරෙහි බලපා තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය වියදම් රු.7,447,452 කින් පහළයාමත් බදු වියදම රු. 492, 234,454 කින් පහළ යාමත් ශුද්ධ අලාභය අඩුවීමට ඉවහල් වී තිබුණි.

(ඇ) මණ්ඩලයේ ජංගම හා ක්ෂණික අනුපාත ප්‍රශස්ත මට්ටමක පවත්වා ගැනීම සඳහා කාරක ප්‍රාග්ධන කළමණාකරනය කෙරෙහි මණ්ඩලයේ අවධානය තවදුරටත් යොමු විය යුතුව තිබුණි.

## 3.3 මණ්ඩලයට එරෙහිව හෝ මණ්ඩලය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

වටිනාකම රු. 2,000,000 ක ත්‍යාග දිනුමක් සම්බන්ධයෙන් ජයග්‍රාහකයෙකු විසින් මණ්ඩලයට එරෙහිව අධිකරණයේ නඩුවක් ගොනුකර තිබුණ අතර, රු. 3,000,000 ක වන්දියක් ඉල්ලා මණ්ඩලයේ හිටපු සේවකයෙකු විසින් මණ්ඩලයට එරෙහිව කම්කරු උසාවියේ නඩුවක් ගොනුකර තිබුණි.

# 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කළමණාකරන අකාර්යක්ෂමතා

පහත සදහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලය විසින් අනිකුත් ලොතරැයිවල අලෙවි ආදායමින් සියයට 47 ත් සියයට 49 ත් අතර පරාසයක් තුල ත්‍යාග සඳහා වෙන් කර තිබුණද සමාලෝචිත වර්ෂයේ පවත්වා තිබුණ මෙගා 50 මිලියන ලොතරැයියේ තුන්වන දිනුම් වාරයේ ආදායමින් සියයට 58 ක් ත්‍යාග සඳහා වෙන් කර තිබුණි. තුන්වන දිනුම් වාරයේදී රු.24,889,292 ක් ත්‍යාග සංචිත ගිණුමට එකතුකර තිබුණද, මෙගා 50 මිලියන 1 හා 2 දිනුම්වාරවල ත්‍යාග ලබාදීම සඳහා වෙනත් ලොතරැයිපත්වල ත්‍යාග සංචිත ගිණුම්වලින් එකතුව රු.30,275,023 ක මුදලක් ලබාගෙන තිබුණි. ඒ අනුව මෙගා 50 මිලියන ලොතරැයියේ පවත්වන ලද දිනුම් වාර 03 තුලදී ශුද්ධ වශයෙන් රු. 5,385,731 ක් මණ්ඩලයේ ත්‍යාග සංචිත ගිණුමෙන් උපයෝජනය කර තිබුණි.

(ආ) 2013 ඔක්තෝබර් 23 වන දින සිට 2016 ඔක්තෝබර් 23 දින දක්වා වසර 03 ක කාලයක් සඳහා ලොතරැයිපතක් රු 0.537 (බදු සහිත) ක මුදලකට මුද්‍රණය කිරීමට මණ්ඩලය විසින් ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටි මගින් සැපයුම්කරු තෝරාගෙන තිබුණ අතර සමාලෝචිත වර්ෂයේදී රු. 247,252,495 ක් වටිනා ලොතරැයිපත් අදාල ආයතනයෙන් මුද්‍රණය කරවාගෙන තිබුණි. සැපයුම්කරු සමග එළඹි ගිවිසුමෙහි 3.13 ඡේදය ප්‍රකාරව විශේෂ ආරක්ෂිත කඩදාසිවල දිය සලකුණු සහිතව ලොතරැයිපත් මුද්‍රණය කළයුතු වුවත් යථෝක්ත සමාගම විසින් 2014 ඔක්තෝබර් 11 දින දක්වාම ගිවිසුම් ප්‍රකාරව ආරක්ෂිත කඩදාසිවල දිය සලකුණු සහිතව ටිකට්පත් මුද්‍රණය කර නොතිබුණි. සැපයුම්කරු විසින් ලොතරැයිපතේ ගුණත්වයට හා ආරක්ෂාකාරීත්වයට බලපාන මූලික කොන්දේසි කඩකර තිබියදිත් මණ්ඩලය විසින් සැපයුම්කරු සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණ අතර ගිවිසුම්ගත පරිදි ලොතරැයිපතක් සඳහා රු 0.537 බැගින් ගෙවීම් කරමින් 2014 ඔක්තෝබර් 11 දින දක්වාම ලොතරැයිපත් මිලදීගෙන තිබුණි.

(ඇ) මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේ වෙළඳපලට ඉදිරිපත් කළ පවර් ලොටෝ ලොතරැයියේ සමාලෝචිත වර්ෂයේ පවත්වන ලද දිනුම්වාර 24 තුලදී රු. 243,402,900 ක දළ ආදායමක් උපයා තිබුණ අතර ලොතරැයිපත ආරම්භ කිරීමට තිරණය ලබාදුන් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව අනුව මණ්ඩලයේ වියදම් සඳහා රු.59,633,710 ක් පමණක් වැය කල හැකි වුවද, විගනණයට ඉදිරිපත් කල තොරතුරු අනුව හඳුනාගත හැකි වියදම රු. 62,647,558 ක් වූයෙන් වෙන් කළ මුදල ඉක්මවා රු. 3,013,847 ක් වැය කර තිබුණි. තවද දිනුම්වාර 24 තුලදීම කෝටි 5න් ආරම්භවන සුපිරි ත්‍යාගය ජයග්‍රහණය කර නොතිබුන අතර ත්‍යාග රටාව තුල දිනුම්වාරයක දල ආදායමින් සියයට 48 ක් එනම් රු. 116,833,392 ක් ත්‍යාග සඳහා වෙන් කර තිබුනද සමාලෝචිත වර්ෂයේ පවත්වන ලද දිනුම්වාර 24 ට අදාලව ලද දළ ආදායමින් සියයට 39 ක් එනම් රු. 94,448,400 ක් පමණක් ජයග්‍රාහකයින් අතරේ බෙදි ගොස් තිබුණි.

(ඈ) මණ්ඩලයේ සහකාර සාමාන්‍යාධිකාරිගේ (අලෙවි) මූලිකත්වයෙන් කරන ලද සමීක්ෂණයක් තුලින් ප්‍රචාරණ අවශ්‍යතාවය හඳුනාගැනීම හා ප්‍රචාරණ මාධ්‍යය තෝරාගැනීමෙන් එකතුව රු. 131,538,960 ක මුදලක් වැය කර අපේක්ෂිත අරමුණ ඉස්මතු නොවූ ප්‍රචාරණ වැඩසටහන් දෙකක් ක්‍රියාත්මක කර තිබුනි. මෙම අලෙවි සමීක්ෂණයට අදාල සමීක්ෂණ වාර්තාව ප්‍රශ්නාවලිය හා ප්‍රශ්නාවලිය පුරවා ඇති ආකාරය පිලිබදව ගැඹුරින් පරීක්ෂා කිරීමේදී විගණනයට අනාවරණය වූ තොරතුරු අනුව පූර්ව නිශ්චයකරගත් ප්‍රචාරණ අවශ්‍යතාවයක් හා ප්‍රචාරණ මාධ්‍යක් සඳහා පදනම සකසා ගැනීම සඳහා මෙම අලෙවි සමීක්ෂණය සිදුකර තිබෙන බව විගණනයේදී බැහැර කළ නොහැකි විය.

## 4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව සූරන ලොතරැයිපත් සමාලෝචිත වර්ෂය තුළ ණය පදනම මත නියෝජිතයන්ට අලෙවි කර තිබුණ අතර 2014 දෙසැම්බර් 31 දිනට අය විය යුතු ණය ශේෂය රු. 184,356,966 ක් විය. සමාලෝචිත වර්ෂයේ සිදු කළ ණයට විකුණුම්වලින් රු. 155,150,095 ක් සඳහා කිසිදු ඇපකරයක් ලබා ගෙන නොතිබූ අතර රු. 20,026,048 ක ණයට විකුණුම්, ඇපකර සීමාව ඉක්මවාත් සිදුකර තිබුණි. කෙසේවෙතත් ණය පදනම මත නියෝජිතයින්ට ටිකට්පත් අලෙවියට ලබාදීම සම්බන්ධව විධිමත් ක්‍රමවේදයක් මණ්ඩලය විසින් මෙතෙක් හඳුන්වා දී නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ ප්‍රචාරණ වියදම්වලට අදාලව පහත කරුණු නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලය විසින් රු 1,269,553,482 ක් ප්‍රචාරණ වැඩසටහන් සඳහා වැයකර තිබුණද 2011 පෙබරවාරි 11 දිනැති අංක 57 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍ර ලේඛය ප්‍රකාරව අවශ්‍ය අනුමැතිය රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් ලබාගෙන නොතිබුණි.

(ii) එක් වාර්තා වැඩසටහනක් සඳහා එකවර මුදල් ගෙවනවාද, වාරික වශයෙන් ගෙවනවාද යන්න පැහැදිලිව ගිවිසුම්වල දක්වා නොතිබුණ අතර එම වාර්තා වැඩසටහන සඳහා රු. 19,162,500 ක් වූ මුදල අවස්ථා පහකදී කොටස් වශයෙන් ගෙවා තිබුණි.

(iii) වාර්තා වැඩසටහන් තුනක් සඳහා ගිවිසුම් ප්‍රකාරව අදාල ආයතන වෙත මාසිකව ගෙවීම් කළ යුතු වුවත් අදාල ආයතන විසින් වාර්තා වැඩසටහන් පිටපත් මණ්ඩලය වෙත භාරදීමෙන් අනතුරුව මුළු මුදලම පිළිවෙලින් රු. 18,200,000 ක් රු. 19,600,000 ක් හා රු. 19,250,000 ක් අදාල ආයතන තුන වෙත එකවර ගෙවා තිබුණි.

(iv) රාජ්‍ය ආයතනයක ඉල්ලීම මත විකාශනය කළ වාර්තාමය වැඩසටහනක් සඳහා රු 8,400,000 අනුග්‍රාහකත්වයක් ලබා දී තිබුණද එම වැඩසටහන තෝරා ගැනීමේ පදනම විගණනයට අනාවරණය නොවීය.

(ඇ) අනුරාධපුර සංචාරක බංගලාවේ ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණ රු. 6,595,987 ක මුදලක් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ සමාලෝචිත වර්ෂයේ දී ප්‍රාග්ධනිත කර තිබුණි. එහෙත් මෙම වටිනාකමට අදාල විධිමත් ඉන්වොයිස් පත්‍ර හෝ වටිනාකමට සරිලන වැඩ කොටස් ප්‍රමිතියෙන් යුතුව ඉටු කර ඇති බවට තාක්ෂණික නිලධාරී වාර්තාවක් හෝ ලබාගෙන නොතිබිණි.

## 4.3 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රචාරණය වෙනුවෙන් දැන්වීම් පුවරු 150 ක් වසරක කාලසීමාවක් තුළ ප්‍රදර්ශනය කිරීම සඳහා මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් මාසයේ දී රු.64,680,000 ක වියදමක් දරා තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට පටහැනිව මිල ගණන් කැඳවා තෝරාගත් සැපයුම්කරුවකු මගින් සේවය සපයාගෙන තිබුණ අතර ප්‍රචාරණ පුවරුව තුළ ප්‍රදර්ශනය කළ ඡායාරූප තුළින් ප්‍රචාරණ අරමුණ ඉස්මතු වී නොතිබිණි. 2015 පෙබරවාරි මාසය වන විට මණ්ඩලයට පරිබාහිර පාර්ශව විසින් දැන්වීම් පුවරු 120 ක් ගලවා ඉවත් කර තිබුණ අතර ඉතිරි දැන්වීම් පුවරු 30ට අදාල ඡායාරූපද අපේක්ෂිත ප්‍රචාරණ අරමුණට පටහැනි ඒවා බව නිරීක්ෂණය විය.

(ආ) 2014 නොවැම්බර් මාසයේ සිට 2015 ජනවාරි මාසය දක්වා රු. 66,858,960 ක වියදමක් දරා විශාල ප්‍රමාණයේ ට්‍රක් රථ 4ක් යොදාගෙන දිවයින පුරා වීඩියෝ දර්ශන පෙන්වීම හා වීදි ප්‍රසංග වලින් සමන්විත ප්‍රචාරණ කටයුත්තක් මණ්ඩලය විසින් සිදු කර තිබුණි. එහිදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට පටහැනිව කිසිදු මිල ගණන් කැඳවීමකින් තොරව තෝරාගත් සැපයුම්කරුවෙකු මගින් රු.2,484,720 ක් වැය කර වීඩියෝ පටයක් නිර්මාණය කරවාගෙන තිබුණ අතර එම වීඩියෝ පටය තුළින් ප්‍රචාරණ අරමුණ ඉස්මතු වී නොතිබුණි. තවද ප්‍රවර්ධන වැඩසටහන සඳහා වීදි නාට්‍ය කණ්ඩායම් ඇතුලත්ව තිබුණද වීදි නාට්‍ය මගින් පාරිභෝගික ජනතාව වෙත ලබාදුන් පණිවුඩය ප්‍රචාරණ අරමුණ හා සැසඳේද යන්න පිළිබඳ තහවුරුවක් ලබා ගැනීම සඳහා කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොවිණි.

(ඇ) පිරිවැය 1,428,000 ක් වැය කර ඉකුත් වර්ෂයේ සවිකළ ප්‍රචාරණ පුවරු 3 ක් මණ්ඩලය විසින් රු. 1,428,000 ක් වැය කර සමාලෝචිත වර්ෂයේදී ද අලුත් කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ ගෙවීම් වවුචර් සමග ඉදිරිපත් කර ඇති ඡායාරූප 2013 වර්ෂයට අදාල ඒවාම බව විගණනයට නිරීක්ෂණය විය.

(ඈ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට පටහැනිව මිල ගණන් කැඳවා සමාලෝචිත වර්ෂයේදී ප්‍රචාරණ පුවරු 50 ක් යොදාගෙන මණ්ඩලය විසින් ප්‍රචාරණ කටයුත්තක් සිදුකර තිබුණද අදාල පුවරු මගින් ලොතරැයි ප්‍රචාරණයට පරිබාහිර කරුණු ප්‍රදර්ශනය කර තිබුණි.

(ඉ) මණ්ඩලය විසින් 2012, 2013 හා 2014 වර්ෂවලදී එකම ස්ථානයක ප්‍රදර්ශනය කළ දැන්වීම් පුවරුවක් සඳහා එහි යකඩ රාමුව යලි භාවිතයට ගැනීමේ හැකියාව සලකා බැලීමෙන් තොරව හා අධ්‍යක්ෂ මණ්ඩල උපදෙස්වලට පටහැනිව වර්ෂ 3 දීම රු. 1,950,000 බැගින් සැපයුම්කරුට ගෙවා තිබුණි. මෙම ප්‍රචාරණ පුවරුවේ ප්‍රදර්ශනය කළ මුහුණත ආවරණය මණ්ඩලයේ ප්‍රචාරණ කටයුතුවලට පරිබාහිර ඒවා බව විගණනයට ඉදිරිපත් වූ ඡායාරූප අනුව නිරීක්ෂණය විය.

(ඊ) මණ්ඩලය විසින් රු. 3,480,000 ක් වැය කර ප්‍රචාරණ පුවරු 12 ක් යොදාගෙන අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත නොකළ ලොතරැයි වර්ග දෙකකට අදාල ප්‍රචාරණයක් ඉකුත් වර්ෂයකදී සිදුකර තිබිණි.

(උ) මණ්ඩලය විසින් ප්‍රචාරණ අවශ්‍යතාවය හඳුනාගැනීම, ප්‍රචාරණ වැඩසටහන් සැලසුම් කිරීම හා රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් මාධ්‍ය ආයතනයක් තෝරාගැනීම යන කරුණු සිදුකිරීමෙන් තොරව පෞද්ගලික ගුවන් විදුලි නාලිකාවක් විසින් ඉදිරිපත් කළ යෝජනාවක් අනුව රු. 3,000,000 ක් වැය කර බාහිර ක්‍රියාකාරකම් රැසක් ඇතුලත් ප්‍රචාරන වැඩසටහනක් සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කර තිබුණි. ගුවන් විදුලි නාලිකාව වෙත ගෙවීම් කිරීමේදී වෙළඳ දැන්වීම් ප්‍රචාරය වූ ගුවන් කාලය පිලිබඳව පමණක් තහවුරු කරගෙන තිබුණු අතර අනෙකුත් බාහිර ක්‍රියාකාරකම් ඉටුවූ බව තහවුරු කරගැනීමෙන් තොරව ගෙවීම් සිදුකර තිබුණි.

(ඌ) මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේදී විධිමත් ක්‍රමවේදයකින් තොරව තෝරාගත් පෞද්ගලික රූපවාහිනි නාලිකාවක් මගින් රු.20,563,200 ක් වැය කර ලොතරැයි ප්‍රචාරණ කටයුතු සිදුකර තිබුණි.

(එ) මණ්ඩලයේ ලොතරැයිපත් අලෙවි නියෝජිතයින් වෙත බෙදාහැරීම වෙනුවෙන් බෙදාහරින්නන්ට එක් ටිකට්පතකට ශත 20 බැගින් වූ කොමිස් මුදලක් මණ්ඩලය විසින් ගෙවනු ලබන අතර බෙදාහරින්නන් විසින් ලොතරැයිපත් 41,924,451 ක් අලෙවි නියෝජිතයින් වෙත බෙදාහැරීමෙන් තොරව සෘජුවම අලෙවි කර තිබුණි. එහෙත් මණ්ඩලය විසින් එම ටිකට්පත් වෙනුවෙන්ද බෙදාහැරීම වෙනුවෙන් ගෙවන ලද ශත 20 බැගින් වූ කොමිස් මුදල පදනම් කරගෙන රු. 8, 384,890 ක කොමිස් මුදලක් බෙදාහරින්නන් වෙත ගෙවා තිබුණි.

මණ්ඩලය විසින් මන්නාරම දිස්ත්‍රික්කයේ ඉදිකළ සංචාරක නිවාසය වැඩ නිම කිරීමෙන් අනතුරුව සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලයට භාරගෙන තිබුණි. රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මගින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සංචාරක නිවාසයේ තක්සේරු වාර්තාවක් ලබාගෙන තිබුණ අතර එහි වටිනාකම අඩුවීම මත වූ ප්‍රත්‍යාගණන අලාභය පොත්වලට ගෙන තිබුණි. මෙම අලුතින් ඉදිකළ ගොඩනැගිල්ලේ තක්සේරු වටිනාකම පිරිවැයට වඩා රු. 27,296,728 කින් අඩුවී තිබුණ හෙයින් ඉදිකිරීම් සඳහා මණ්ඩලය විසින් දරන ලද පිරිවැයේ සාධාරණ බව විගණනයේදී මතභේදයට තුඩු දෙන කරුණක් විය. තවද මෙම සංචාරක නිවාසයේ වටිනාකම ආයෝජන දේපලක් ලෙස සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

### 4.4 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් මණ්ඩලයේ සම්පත්

2003 ජුනි 02 දිනැති අංක පී ඊ ඩී/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 ඡේදය ප්‍රකාර මණ්ඩලය සතු සම්පත් රේඛීය අමාත්‍යාංශය හෝ වෙනත් රාජ්‍ය ආයතනයට උපයෝජනය සඳහා යෙදවිය නොහැකි වුවත්, ඊට පටහැනිව මණ්ඩලය විසින් වාහන 3 ක් 2006 වසරේ සිට වෙනත් රාජ්‍ය ආයතනවලට මුදා හැර තිබුණ අතර, එම වාහනවල අලුත්වැඩියා හා නඩත්තු වියදම් ලෙස සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලය රු. 690,405 ක් වැය කර තිබුණි. තවද, උක්ත නියමයන්ට පටහැනිව මණ්ඩලයෙන් වැටුප් ලබන නිලධාරීන් 03 දෙනෙකුද බාහිර ආයතන සඳහා 2006 හා 2007 වර්ෂවල සිට මුදා හැර තිබුණ අතර සමාලෝචිත වර්ෂයේ එම නිලධාරීන් තිදෙනාට සේවක පාරිශ්‍රමිකය ලෙස ගෙවා තිබූ රු. 1,039,139 ක් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 4.5 නිශ්ක්‍රිය හා ඌණ උපයෝජිත වත්කම්

මණ්ඩලයේ පරිගණක මෘදුකාංග හඳුන්වාදීම යටතේ ගබඩා තොග ලේඛන පවත්වා ගෙන යාම පරිගණක ගත කිරීම සඳහා රු. 668,460 ක වියදමක් දරා පරිගණක මෘදුකාංගයක් හඳුන්වා දී තිබුණද විගණිත දින වන 2015 මැයි 26 දින වන විටත් එහි පූර්ණ භාවිතයක් නොතිබුණි.

### 4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

2014 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 305 ක් පමණ වුවද මණ්ඩලය විසින් 317 ක කාර්ය මණ්ඩලයක් සේවයේ යොදවා තිබුණි. අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 17 ක් පැවති අතර අනුමත කාර්ය මණ්ඩලයට පරිබාහිරව කොන්ත්‍රාත් පදනම මත 28 දෙනෙකු බඳවාගෙන තිබුණි.

## 5. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

### 5.1 අභ්‍යන්තර විගණනය

මණ්ඩලය සඳහා වෙනම අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම එකඟත්වය සඳහා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබුණද ඊට අනුරූපව අභ්‍යන්තර විගණන කටයුතු පවත්වා නොතිබුණි. එසේම මුදල් රෙගුලාසි 134.3 ප්‍රකාරව සමාලෝචිත වර්ෂයට අදාල අභ්‍යන්තර විගණන වාර්තාද විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.

### 5. 2 ප්‍රසම්පාදන සැලැස්ම

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 වගන්තිය ප්‍රකාරව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර තිබුණද ඒ තුලින් සියලුම ප්‍රසම්පාදනයන් ආවරණය කර නොතිබිණි.

### 5.3 අයවැය ලේඛනමය පාලනය

මණ්ඩලයේ සමාලෝචිත වර්ෂයේ අයවැය 2014 නොවැම්බර් මාසයේදී සංශෝධනය කර තිබුණි. වියදම් විෂයයන් 10 ක හා වෙනත් ආදායම් විෂයයේ සංශෝධිත අයවැය ගත සහ තථ්‍ය අගයන් අතර සියයට 7ක් සියයට 100 ක් අතර සැලකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායි මූල්‍ය කළමනාකරන පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුන බව නිරීක්ෂණය විය.

### 5.4 නොවිසඳි ඇති විගණන ඡේද

(අ) ඉකුත් වර්ෂවලදි වැඩිපුර ගෙවන ලද රු 7,392,287 ක සේවක පාරිතෝෂික මුදල මණ්ඩලයට ආපසු අයකරගන්නා ලෙස පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව 2013 මාර්තු 21 දින නියෝග කර තිබුණද එම මුදල අයකර ගැනීමට හෝ ලැබිය යුතු මුදලක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට හෝ කටයුතු කර නොතිබිණි. වැඩිපුර ගෙවා ඇති පාරිතෝෂික මුදල මණ්ඩලයට ප්‍රතිපූර්ණය කරන ලෙස අදාල විශ්‍රාමික නිලධාරින්ට ලිඛිතව දැන්වීම පමණක් මණ්ඩලය විසින් සිදු කර තිබිණි.

(ආ) 2005 වර්ෂයේ සිට මණ්ඩලය සතුව පවතින කොළඹ නගරාසන්නයේ පර්චස් 112 ක ඉඩමේ ගොඩනැගිල්ලක් ඉදිකර මණ්ඩලය පවත්වාගෙන යාමට කටයුතු කිරීමෙන් තොරව ප්‍රධාන කර්යාලය පවත්වාගෙන යාමට හා ගබඩා පවත්වාගෙන යාමට කුලී ගොඩනැගිලි 2 ක් උපයෝජනය කරමින් පැවතිණි.

ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල සඳහා සමාලෝචිත වර්ෂයේදී රු. 15,258,406 ක් කුලිය ලෙස ගෙවා තිබුණ අතර එම කුලී ගොඩනැගිල්ලේ කාර්යාල නවීකරණ කටයුතු සහ විදුලි පරිපථ නැවත සැකසීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ හා වාර්ථාව නිකුත් කරන 2015 වර්ෂයේ ජූලි 16 දින වන විට එකතුව රු. 20,928,160ක් මණ්ඩලය විසින් වැයකර තිබුණි. ගබඩා පහසුකම් ලබා ගැනීම වෙනුවෙන් ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් ගොඩනැගිල්ලක් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු. 1,836,000ක් ක් කුලී ලෙස ගෙවා තිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදි නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ගිණුම්කරණය
(ආ) මානව සම්පත් කළමණාකරනය
(ඇ) වත්කම් කළමණාකරනය
(ඈ) වියදම් කළමණාකරනය
(ඉ) ගබඩා පාලනය



**ඩබ්ලිව්. පී.සී. වික්‍රමරත්න**
විගණකාධිපති (වැඩ බලන)

# ආදායම් ප්‍රකාශය

| **දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා** | **සටහන්** | **2014 රු.** | **2013 රු.** |
|---|---|---|---|
| පිරිවැටුම | 2 | **15,153,133,820** | **14,537,362,545** |
| අඩුකළා වක්‍ර බදු | | | |
| එකතු කළ වටිනාකම් මත බදු | | 540,502,194 | 507,792,059 |
| ජාතිය ගොඩනැගීමේ බදු | | 211,761,787 | 203,546,556 |
| එ ව බදු හා ජා ගො බදු වලට පසු ශුද්ධ පිරිවැටුම | | **14,400,869,839** | **13,826,023,930** |
| අඩුකළා : විකුණුම් පිරිවැය | 3 | 12,492,687,628 | 11,998,247,176 |
| **දළ ලාභය** | | **1,908,182,211** | **1,827,776,754** |
| එකතු කළා : වෙනත් ආදායම් | 4 | 88,823,238 | 220,209,583 |
| | | 1,997,005,449 | 2,047,986,337 |
| විකුණුම් අලෙවි හා බෙදාහැරීමේ පිරිවැය | 5 | 1,284,599,303 | 1,069,000,356 |
| පරිපාලන වියදම් | 6 | 573,472,839 | 465,114,112 |
| මූල්‍ය පිරිවැය | 7 | 29,743,395 | 37,190,847 |
| **බදු පෙර ලාභ** | | **109,189,912** | **476,681,022** |
| ආදායම් බදු වියදම් | 8 | 117,853,496 | 610,087,950 |
| **වර්ෂය සඳහා ලාභ (පාඩු)** | | **(8,663,584)** | **(133,406,928)** |

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්හි සටහන් අංක 1 යටතේ ගිණුම්කරන ප්‍රතිපත්ති දක්වා ඇත.

# විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

| **දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා** | **2014 රු.** | **2013 රු.** |
|---|---|---|
| වර්ෂය සඳහා ලාභ (පාඩු) | (8,663,584) | (133,406,928) |
| **බදුවලින් අනතුරුව වර්ෂය සඳහා මුළු වෙනත් විස්තීර්ණ ආදායම** | | |
| එකතු කළා : ප්‍රත්‍යාගණනය කරන ලද තොග අයිතම - රන් කාසි | - | 1,343,522 |
| එකතු කළා : ප්‍රත්‍යාගණනය කරන ලද දේපල යන්ත්‍ර උපකරණ | 49,463,782 | 263,640,924 |
| අඩු කළා : ප්‍රත්‍යාගණනය කරන ලද දේපල යන්ත්‍ර උපකරණ | (27,296,728) | - |
| එකතු කළා : විනිමය විචලනයේ ප්‍රතිලාභ | 6,334,089 | 245,524 |
| එකතු කළා : පාරිතෝෂික සඳහා කරන ලද අතිරික්ත ප්‍රතිපාදන | - | 12,385,733 |
| **බදුවලින් අනතුරුව වර්ෂය සඳහා මුලු විස්තීර්ණ ආදායම** | **19,837,559** | **144,208,775** |

# මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනට | සටහන් | 2014 රු. | 2013 රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල යන්ත්‍ර හා උපකරණ | 10 | 762,397,726 | 739,286,832 |
| ඒකාබද්ධ අරමුදලින් ලැබිය යුතු ආදායම් බදු | | 1,215,320,896 | 1,736,370,634 |
| ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව - ආයෝජන | | 5,336,575 | 5,336,575 |
| ආයෝජන දේපල | 10 | 43,997,011 | - |
| | 11 | 33,713,255 | - |
| **මුලු ජංගම නොවන වත්කම්** | | 2,060,765,463 | 2,480,994,041 |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 11 | 150,996,078 | 149,137,662 |
| වෙළඳ ලැබිය යුතු | 12 | 370,260,544 | 241,678,915 |
| වෙනත් ජංගම වත්කම් | 13 | 741,632,583 | 702,043,808 |
| මුදල් හා මුදලට සමාන දෑ | 14 | 1,402,778,114 | 2,089,399,814 |
| **මුළු ජංගම වත්කම්** | | 2,665,667,319 | 3,182,260,199 |
| **මුළු වත්කම්** | | 4,726,432,782 | 5,663,254,240 |
| **ස්කන්ධ ප්‍රාග්ධනය හා වගකීම්** | | | |
| **ස්කන්ධ ප්‍රාග්ධන හිමිකරුවන්ට ආරෝපිත ස්කන්ධ ප්‍රාග්ධනය** | | | |
| රඳවාගත් ඉපයීම් | 15 | 433,446,392 | 435,775,890 |
| ස්කන්ධ ප්‍රාග්ධනයේ අනිකුත් සංරචක හා ස්කන්ධ ප්‍රාග්ධනය | 16 | 643,643,970 | 890,098,987 |
| | | 1,077,090,362 | 1,325,874,877 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| විලම්භිත බදු | 17 | 46,870,270 | 10,319,839 |
| දිගුකාලීන ප්‍රතිපාදන | 18 | 1,243,861,388 | 1,761,554,939 |
| **මුළු ජංගම නොවන වගකීම්** | | 1,290,731,658 | 1,771,874,778 |
| **ජංගම වගකීම්** | | | |
| වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ | 19 | 1,974,159,396 | 1,771,698,128 |
| ගෙවිය යුතු වර්තමාන බදු | 20 | 384,451,369 | 793,806,460 |
| මුළු ජංගම වගකීම් | | 2,358,610,765 | 2,565,504,588 |
| **මුළු වගකීම්** | | 3,649,342,423 | 4,337,379,366 |
| **මුළු ස්කන්ධ ප්‍රාග්ධනය හා වගකීම්** | | 4,726,432,785 | 5,663,254,243 |

ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍යම සටහන් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන 2014 දෙසැම්බර් 31 දිනට ජාතික ලොතරැයි මණ්ඩලයේ කටයුතු පිළිබඳ හා 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසරේ ලාභය පිළිබඳ සත්‍ය හා සාධාරණ දැක්මක් ලබාදේ.

හර්ෂ බණ්ඩාර
ප්‍රධාන මූල්‍ය නිලධාරී

වී සුන්දරේශ්වරන්
නි සාමාන්‍යාධිකාරී (මූල්‍ය)

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට වගකීම පැවරේ.

ශ්‍යාමිලා පෙරේරා
සභාපති

එම්. කේ. හසන්
ක්‍රියාකාරී අධ්‍යක්ෂ

# අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා | 2014<br>රු. | 2013<br>රු. |
|---|---|---|
| බදු පෙර ලාභ | 109,189,912 | 476,681,022 |
| | | |
| ගුවන්තොටුපළ ලොතරැයියේ ලැබිය යුතු | | |
| තිරුබදු ලියාහැරීම් සඳහා ගැලපීම් | - | (26,774,238) |
| ගොඩනැගිලි සංචිතයෙන් මහාභාණ්ඩාගාරයට කරන ලද මාරුකිරීම් සඳහා ගැලපීම් | - | 365,000,000 |
| ගොඩනැගිලි සංචිතයෙන් මාරුකිරීම් සඳහා ගැලපීම් - වොක්ෂෝල් ඉඩම | - | 187,042,734 |
| අතිරික්ත පාරිතෝෂික ප්‍රතිපාදන සඳහා ගැලපීම් | - | 12,385,733 |
| විනිමය විචලනයේ ප්‍රතිලාභ සඳහා ගැලපීම් | 6,334,089 | 245,524 |
| **ප්‍රත්‍යාගණනය කරන ලද සංචිත වැඩිවීම් / (අඩුවීම්)** | 22,167,055 | 264,984,446 |
| ත්‍යාග සංචිත වැඩිවීම් /(අඩුවීම්) | 56,377,929 | 337,923,091 |
| ගොඩනැගිලි සංචිත වැඩිවීම් /(අඩුවීම්) | - | (853,842,734) |
| සමුච්චිත භාණ්ඩාගාර අරමුදලේ වැඩිවීම් /(අඩුවීම්) | - | - |
| පාරිතෝෂික ප්‍රතිපාදනවල වැඩිවීම් / (අඩුවීම්) | 4,493,712 | (12,385,733) |
| ක්‍රියාත්මක තත්ත්වයේ පවතින ප්‍රාග්ධන වැඩවල - (ගොඩනැගිලි) අඩුවීම් /(වැඩිවීම්) | - | 22,909,114 |
| ඒකාබද්ධ අරමුදලින් ලැබිය යුතු ආදායම් බදු අඩුවීම් / (වැඩිවීම්) | 521,049,738 | 551,421,102 |
| | 719,612,435 | 1,325,590,061 |
| **ගැලපීම්** | | |
| ක්ෂයකිරීම් | 78,273,985 | 43,900,791 |
| එ ව මත බදු හා ජා ගො බදු සඳහා ප්‍රතිපාදන | 752,263,981 | 711,338,615 |
| දේපල යන්ත්‍ර හා උපකරණ විකිණීමෙන් ලාභ | (1,572,025) | (6,144,211) |
| ඒකාබද්ධ අරමුදල සඳහා වෙන් කිරීම් | 1,888,455,133 | 1,753,135,197 |
| ත්‍යාග සඳහා වෙන් කිරීම් | 7,311,136,590 | 7,083,652,537 |
| | 10,748,170,099 | 10,911,472,990 |
| **කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම්** | | |
| (වැඩිවීම්)/ අඩුවීම් තොග | (1,856,416) | (106,868,579) |
| (වැඩිවීම්)/ අඩුවීම් වෙළඳ ලැබිය යුතු | (128,581,629) | (211,987,356) |
| (වැඩිවීම්)/ අඩුවීම් වෙනත් ජංගම වත්කම් | (40,034,863) | (29,845,191) |
| වැඩිවීම් / (අඩුවීම්) වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ හා | | |
| දිගුකාලීන ප්‍රතිපාදන | 98,677,308 | 251,675,224 |
| **මෙහෙයුම් ක්‍රියාකාරිත්වයේ ශුද්ධ අරමුදල් ගලායාම** | **10,676,374,499** | **10,814,447,088** |
| | | |
| **ආයෝජන ක්‍රියාකාරිත්වයේ අරමුදල් ගලායාම** | | |
| දේපල යන්ත්‍ර හා උපකරණවල වැඩිවීම | (156,975,321) | (75,978,081) |
| ප්‍රත්‍යාගණනය කරන ලද දේපල යන්ත්‍ර උපකරණවල ප්‍රතිලාභ | (22,167,054) | (263,640,924) |
| දේපල යන්ත්‍ර හා උපකරණ විකිණීමෙන් ලාභ | 2,065,343 | 6,637,529 |
| **ආයෝජන ක්‍රියාකාරිත්වයේ ශුද්ධ අරමුදල් ගලායාම** | **(177,077,032)** | **(332,981,477)** |
| | | |
| **මූල්‍ය ක්‍රියාකාරිත්වයේ අරමුදල් ගලායාම** | | |
| | | |
| ඒකාබද්ධ අරමුදලට කරන ලද ගෙවීම් | (1,905,611,026) | (1,776,179,552) |
| ඒකාබද්ධ අරමුදලට කරන ලද විශේෂ ප්‍රතිපාදන | - | (500,000,000) |
| ත්‍යාග ගෙවීම් | (7,515,196,737) | (6,589,862,236) |
| පාරිතෝෂික ගෙවීම් | (1,137,525) | (326,465) |
| එ ව මත බදු හා ජා ගො බදු ගෙවීම් | (778,755,390) | (681,423,198) |
| ආදායම් බදු හා විලම්භිත බදු ගෙවීම් | (985,216,486) | (1,022,332,806) |
| **මූල්‍ය ක්‍රියාකාරිත්වයේ ශුද්ධ අරමුදල් ගලායාම** | **(11,185,917,164)** | **(10,570,124,257)** |
| | | |
| වර්ෂය තුල මුදල් හා මුදලට සමාන දෑවල ශුද්ධ වෙනස්වීම | (686,621,699) | (88,658,646) |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදලට සමාන දෑ | 2,089,399,814 | 2,178,058,460 |
| වර්ෂය අවසානයේ මුදල් හා මුදලට සමාන දෑ | **1,402,778,114** | **2,089,399,814** |
| **අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා සටහන්** | | |
| මුදල් හා මුදලට සමාන දෑ | | |
| | 2,014 | 2,013 |
| කෙටිකාලීන ආයෝජන | 990,787,939 | 1,589,431,447 |
| අතැති හා බැංකු මුදල් | 411,990,175 | 499,968,366 |
| **වර්ෂය අවසානයේ ශුද්ධ මුදල් හා මුදලට සමාන දෑ** | **1,402,778,114** | **2,089,399,813** |

# ස්කන්ධ ප්‍රාග්ධන වෙනස්වීම් ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා | සමුච්චිත භාණ්ඩාගාර අරමුදල රු. | ප්‍රත්‍යාගණන සංචිත රු. | ගොඩනැගිලි සංචිත රු. | ත්‍යාග සංචිත රු. | රඳවාගත් සංචිත රු. | එකතුව රු. |
|---|---|---|---|---|---|---|
| **2013.01.01 දිනට ශේෂය** | **21,263,101** | **-** | **853,842,734** | **265,928,349** | **531,283,063** | **1,672,317,247** |
| ත්‍යාග සංචිතයේ ශුද්ධ වෙනස්වීම් | - | - | - | 36,123,091 | - | 36,123,091 |
| ගොඩනැගිලි සංචිතයෙන් මාරු කිරීම් | - | - | (301,800,000) | 301,800,000 | - | - |
| ගොඩනැගිලි සංචිතයෙන් මාරු කිරීම් | - | - | (365,000,000) | - | 365,000,000 | - |
| ගොඩනැගිලි සංචිතයෙන් මාරු කිරීම් -වොක්ෂෝල් ඉඩම | - | - | (187,042,734) | - | 187,042,734 | - |
| මහාභාණ්ඩාගාරයට කරන ලද විශේෂ ප්‍රතිපාදන | - | - | - | - | (500,000,000) | (500,000,000) |
| පාරිතෝෂික සඳහා කරන ලද අතිරික්ත ප්‍රතිපාදන | - | - | - | - | 12,385,733 | 12,385,733 |
| ගුවන්තොටුපල ලොතරැයියේ ලැබිය යුතු තිරුබදු ලියාහැරීම් | - | - | - | - | (26,774,238) | (26,774,238) |
| ප්‍රත්‍යාගණනය කරන ලද තොග අයිතම - රන් කාසි | - | 1,343,522 | - | - | - | 1,343,522 |
| ප්‍රත්‍යාගණනය කරන ලද දේපල යන්ත්‍ර උපකරණ | - | 263,640,924 | - | - | - | 263,640,924 |
| විනිමය විචලනයේ ප්‍රතිලාභ | - | - | - | - | 245,524 | 245,524 |
| 2013 වර්ෂය සඳහා ලාභ (පාඩු) | - | - | - | - | (133,406,928) | (133,406,928) |
| **2013.12.31 දිනට ශේෂය** | **21,263,101** | **264,984,446** | **-** | **603,851,440** | **435,775,888** | **1,325,874,875** |
| **2014.01.01 දිනට ශේෂය** | **21,263,101** | **264,984,446** | **-** | **603,851,440** | **435,775,888** | **1,325,874,874** |
| ත්‍යාග සංචිතයේ ශුද්ධ වෙනස්වීම් | - | - | - | 56,377,929 | - | 56,377,929 |
| ප්‍රත්‍යාගණනය කරන ලද දේපල යන්ත්‍ර උපකරණ | - | 49,463,782 | - | - | - | 49,463,782 |
| ආයෝජන දේපල නැවත ප්‍රතගණනයේදී වූ පාඩු - මන්නාරම සංචාරක බංගලාව | - | (27,296,728) | - | - | - | (27,296,728) |
| මණ්ඩලීය අරමුදලින් ලැබිය යුතු ණය | - | - | - | (325,000,000) | - | (325,000,000) |
| විනිමය විචලනයේ ප්‍රතිලාභ | - | - | - | - | 6,334,089 | 6,334,089 |
| 2013 වර්ෂය සඳහා ලාභ (පාඩු) | - | - | - | - | (8,663,584) | (8,663,584) |
| **2014.12.31 දිනට ශේෂය** | **21,263,101** | **287,151,500** | **-** | **335,229,369** | **433,446,393** | **1,077,090,362** |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

## සටහන් අංක 01

## 1. සංස්ථාමය තොරතුරු

### 1.1 සාමාන්‍ය තොරතුරු

ආරෝග්‍යශාලා ලොතරැයිය අහෝසි කිරීමෙන් පසු 1963 අංක 11 දරන මුදල් පනත යටතේ ජාතික ලොතරැයි මණ්ඩලය පිහිටුවන ලදී. ඉහත පනතේ සමහර වගන්ති 1997 අංක 35 දරණ මුදල් (සංශෝධිත) පනත යටතේ සහ 1998 අංක 22 දරණ මුදල් (සංශෝධිත) පනත යටතේ සංශෝධනය කර ඇත.

මෙය මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය යටතේ පවතින අර්ධ රාජ්‍ය ආයතනයකි.
ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය පිහිටා ඇත්තේ කොල්ලුපිටිය ගාලුපාරේ අංක 234/2 දරණ ස්ථානයේය.

### 1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය

ජාතික ලොතරැයි මණ්ඩලය පිහිටුවීමේ ප්‍රධාන අභිලාශය රජයට ආදායම් උත්පාදනය සඳහා ජාතික ලොතරැයි පැවැත්වීමයි.

### 1.3 මුදල් වර්ෂය

මණ්ඩලයේ මූල්‍ය කාලපරිච්ඡේදය වන්නේ 2014 ජනවාරි 01 දින සිට 2014 දෙසැම්බර් 31 දින දක්වා වූ මාස දොළහක කාලපරිච්ඡේදයයි.

### 1.4 මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම්

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය විසින් නිකුත් කරන ලද නව ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිත (SLFRS/LKAS) අනුකූලව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හා ඉදිරිපත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමෙන් බැදේ. ක්‍රියාකාරී අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාවේ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබද සටහනෙහි මූල්‍ය ප්‍රකාශන පිළිබද අධ්‍යක්ෂවරුන්ගේ වගකීම දක්වා ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශනවල පහත සංරචක අඩංගු වේ.

- විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි සමාලෝචිත වර්ෂයෙහි මූල්‍ය කාර්යසාධනය පිළිබද තොරතුරු ඇතුලත් වේ.
- මූල්‍ය තත්ත්ව ප්‍රකාශය වර්ෂය අවසානයේ මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය පෙන්නුම් කරයි.
- ස්කන්ධ ප්‍රාග්ධන වෙනස්කම් ප්‍රකාශය සමාලෝචිත වර්ෂයෙහි මණ්ඩලයේ අරමුදල්වල වෙනස්වීම් විස්තර කරයි.
- අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය මුදල් හා මුදලට සමාන දෑ උත්පාදනය සදහා මණ්ඩලයට ඇති හැකියාව හා මෙම අරමුදල් උපයෝජනයේ අවශ්‍යතාවය පිළිබද තොරතුරු සපයයි. සහ
- මූල්‍ය ප්‍රකාශන සදහා සටහන් හි ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හා අනිකුත් විස්තරාත්මක තොරතුරු ඇතුලත් වේ.

# 2. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

### 2.1.1 ගිණුම් පිළියෙල කිරීමේ පදනම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිත (SLFRS/LKAS) අනුකූලව ඓතිහාසික පිරිවැය පදනම හා සත්‍ය වටිනාකම් පදනම යටතේ උපචිත පදනමට ශ්‍රී ලංකා රුපියල් වලින් මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත.

### 2.1.2 අනුකූලතා ප්‍රකාශනය

2005 දෙසැම්බර් 31 දිනට සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මණ්ඩලයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් ("මූල්‍ය ප්‍රකාශ") සමගින් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධ වෙනස්වීම් සහ මුදල් ප්‍රවාහ පිළියෙල කොට ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී.ල.ගි.ප්‍ර) සහ 1963 අංක 11 දරන මුදල් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූලවය.

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2012 අප්‍රේල් 01 වන දා සිට බලාත්මක වන පරිදි වහාම ක්‍රියාත්මක වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව මණ්ඩලය පිළියෙල කරනු ලැබූ පළමු මූල්‍ය ප්‍රකාශ වන්නේය. මෙම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති, ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිති මණ්ඩලය විසින් නිකුත් කොට ඇති ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති සමග ප්‍රමාණාත්මකව අභිසාරී වේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති මුල් වරට සම්මත කර ගැනීම පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 1 අදාළ කර ගෙන ඇත. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වෙත සංක්‍රාන්තිය මීට පෙර වාර්තා කරන ලද මණ්ඩලයේ මූල්‍ය කාර්ය සාධනය, මූල්‍ය තත්වය සහ මුදල් ප්‍රවාහ වෙත බලපෑමක් ඇති කර ඇති නමුදු එම මූල්‍ය ප්‍රකාශයන්හි හෙළිදරව් කර ඇති පරිදි ඒ සඳහා නිසි පරිදි ගැලපීම් කර ඇත.

### 2.1.3 අඛණ්ඩ පැවැත්ම

අඛණ්ඩ පැවැත්මක් ලෙස දිගටම පැවතීමට මණ්ඩලයට ඇති හැකියාව පිළිබඳව අධ්‍යක්‍ෂකවරුන් තක්සේරුවක් කර ඇති අතර අස්තිත්වය ඈවර කිරීමට හෝ වෙළඳාම නතර කිරීමට ඔවුන් අපේක්ෂා නොකරයි. පූර්වේක්ෂිත අනාගතයක් සඳහා ව්‍යාපාර කටයුතු දිගටම පවත්වාගෙන යාමට සම්පත් තමන් සතු බවට කළමනාකාරිත්වය සෑහීමකට පත් වෙයි. තවද, අඛණ්ඩ පැවැත්මක් ලෙස දිගටම පැවතීමට මණ්ඩලයට ඇති හැකියාව මත සැලකිය යුතු සැකයන් පහළ කරන්නා වූ කිසියම් ප්‍රමාණාත්මක අවිනිශ්චිතතා පිළිබඳ කළමනාකාරිත්වය නොදනී. එබැවින් අඛණ්ඩ පැවැත්ම පදනමක් මත මූල්‍ය ප්‍රකාශ නොකඩවා පිළියෙල කරනු ලැබේ.

### 2.1.4 සන්සන්දනාත්මක තොරතුරු

මණ්ඩලය විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති සංගතව යොදාගෙන ඇති අතර ඒවා පෙර වසරේ ප්‍රතිපත්ති සමග සංගත වේ. ප්‍රවර්තන වසරේ ඉදිරිපත් කිරීම හා අනුකූල වන පරිදි අවශ්‍ය තැන්හිදී පෙර වසරේ සංඛ්‍යා සහ වාක්‍යාංශ නැවත සකස් කර හා ප්‍රතිවර්ගීකරණය කර ඇත. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 01 - 'මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම' ප්‍රකාරව පෙර වසරේ ගිණුම්කරණ ප්‍රමිති සමග මණ්ඩලය විසින් මෙම ප්‍රමිති සංගතව ආදේශ කොට ඇත.

### 2.1.5 විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු

සියලු විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු, ගනුදෙනුව සිදුකළ අවස්ථාවේ පැවති විනිමය අනුපාතයට (එතැන් විනිමය අනුපාතය) වාර්තාකරණ ව්‍යවහාර මුදල් ඒකකය මත ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කරනු ලැබේ. එබඳු ගනුදෙනු බේරුම් කිරීමේ සහ මූල්‍ය අයිතම වසර අවසාන විනිමය අනුපාතයන්ට ප්‍රති මැනීමේ ප්‍රතිඵලයක් ලෙස ඇතිවන ප්‍රතිලාභ හෝ අලාභයන්, ලාභ හෝ අලාභවල හඳුනාගනු ලැබේ.

විදේශ ව්‍යවහාර මුදලින් සඳහන් කර ඇති මූල්‍ය වත්කම් හෝ බැරකම්, වසර අවසාන එතැන් විනිමය අනුපාත යොදා ගනිමින් ශ්‍රී ලංකා රුපියල්වලින් සමාන අගයට පරිවර්තනය කරනු ලබන අතර, එයින් ඇතිවන ප්‍රතිලාභ හෝ අලාභයන් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ ගිණුම්ගත කරනු ලැබේ.

### 2.1.6 මැනීමේ පදනම

මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාවේ පහත දැක්වෙන ද්‍රව්‍යමය අයිතම හැරුණු විට, මූල්‍ය ප්‍රකාශ පිලියෙල කර ඇත්තේ ඓතිහාසික පිරිවැය සම්මුතිය ප්‍රකාරවය.

- ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමට ඇති මූල්‍ය සාධන පත්‍ර සාධාරණ වටිනාකමට මනිනු ලැබේ.
- නිර්වචිත ප්‍රතිලාභ බැඳීම් සඳහා බැරකම්, නිර්වචිත ප්‍රතිලාභ බැඳීමේ සහ හඳුනා නොගත් ආයු ගණන වැනි එකතුව, අතීත සේවා පිරිවැය සහ හඳුනා නොගත් ආයුගණක අලාභයෙන් අඩු කොට වත්මන් වටිනාකමට හඳුනාගනු ලැබේ.
- විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් සාධාරණ වටිනාකමට මනිනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශවලට බලපාන්නාවූ උද්ධමනකාරී සාධක වෙනුවෙන් කිසිදු ගැලපීමක් කර නැත.

### 2.1.7 ව්‍යවහාර සහ වාර්තාකරණ මුදල් ඒකක

මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුලත් කර ඇති අයිතමයන් මනිනු ලබන්නේ මණ්ඩලය ක්‍රියාත්මක වන මූලික ආර්ථික පරිසරයේ ව්‍යවහාර මුදල් ඒකකය භාවිතා කරමිනි. (ක්‍රියාකාරී ව්‍යවාහරික මුදල් ඒකකය) මෙම මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කර ඇත්තේ මණ්ඩලයේ ක්‍රියාකාරී ව්‍යවහාරික හා වාර්තාකරණ මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලිනි. සමාලෝචිත වර්ෂය තුළදී මණ්ඩලයේ ක්‍රියාකාරී ව්‍යවහාරික හෝ වාර්තාකරණ මුදල් ඒකකයේ වෙනසක් සිදුව නොමැත.

අන්‍යාකාරයෙන් සඳහන් කර ඇති විටෙක හැර, රුපියල්වලින් ඉදිරිපත් කර ඇති සියලු මූල්‍ය තොරතුරු ආසන්නම රුපියලට වටයා ඇත.

### 2.1.8 ප්‍රමාණාත්මක බව සහ සමාහරණය

සමාන අයිතමයන්ගේ එක් එක් ද්‍රව්‍යමය පංතිය මූල්‍ය ප්‍රකාශනයන්හි සමුච්චිතව ඉදිරිපත් කර තිබේ. 'මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම' පිළිබඳව වූ ශ්‍රී.ලං.ගි.ප්‍ර. 1 මගින් අවසර දී ඇති පරිදි වැදගත් නොවන්නේ නම් පමණක් ස්වභාවයෙන් හෝ කර්තව්‍යයෙන් වෙනස් අයිතම වෙනම ඉදිරිපත් කරනු ලැබේ.

හඳුනාගත් වටිනාකම් හිලව් කිරීම සඳහා බලාත්මක කළ හැකි නෛතික හිමිකමක් පවතින විට සහ ශුද්ධ පදනම මත පියවීම සඳහා චේතනාවක් ඇති විට හෝ වගකීම් පියවීම හා වත්කම් උපලබ්ධිය එක විටම සිදුවීමේදී මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් හිලව් කිරීම හා ශුද්ධ අගයන් මූල්‍ය ප්‍රකාශ තත්ත්ව ප්‍රකාශනය තුළ වාර්තා කිරීම සිදු කරයි. මණ්ඩලයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල විශේෂිත අනාවරණයකදී හා අවශ්‍යතාවයකට හැර ආදායම් ප්‍රකාශනයේ ආදායම් හා වියදම් හිලව් කිරීම සිදු නොකරයි.

### 2.1.9. වැදගත් ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පන

#### (අ) විනිශ්චයන්

ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදාගැනීමේ ක්‍රියාවලියේදී, මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන ඇති ප්‍රමාණ මත වඩාත්ම වැදගත් බලපෑම සහිත, ඇස්තමේන්තු පිළිබඳ විනිශ්චයන් හැරුණු විට, කළමනාකාරිත්වය පහත සඳහන් විනිශ්චයන් කර තිබේ.

**(ආ) ඇස්තමේන්තු හා උපකල්පන**

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී ආදායම්, වියදම්, වත්කම් සහ බැරකම්වල වාර්තා කර ඇති සංඛ්‍යා සහ වාර්තාකරණ දිනයට අසම්භාව්‍ය බැරකම් හෙළිදරව් කිරීම කෙරෙහි බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කිරීමට කළමනාකාරිත්වයට සිදු වේ. මීළඟ මූල්‍ය වර්ෂය තුළ වත්කම් සහ බැරකම්වල ධාරණ අගයන්ට ප්‍රමාණාත්මක ගැලපුම් කිරීමට සිදුවන සැලකිය යුතු අවදානමක් සහිත අනාගතයට අදාල වැදගත් උපකල්පන සහ ඇස්තමේන්තු අවිනිශ්චිතතාවේ අනෙකුත් වැදගත් මූලාශ්‍ර සැලකිල්ලට ලක් කර තිබේ.

## 2.2 වත්කම් සහ ඒවායේ තක්සේරු කිරීම් පදනම්

අන්‍යාකාරයෙන් සඳහන් කර ඇත්තේ නම් මිස, පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති මෙම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල සියලු කාල සීමාවන්ට සංගතව ආදේශ කර ඇත.

### 2.2.1 දේපල, පිරියත සහ උපකරණ

හඳුනාගැනීමේ පදනම

අනාගත ආර්ථික ප්‍රතිලාභයක් වත්කම් තුලින් ගලා ඒම පිළිබඳව භව්‍යතාවයක් ඇත්නම් සහ වත්කමේ පිරිවැය විශ්වසනීය ලෙස මැනිය හැකි විටකදී, දේපල, පිරියත හා උපකරණ වත්කම් සේ හඳුනාගනු ලැබේ.

මැනීමේ පදනම

**(අ) පිරිවැය**

සියලු දේපල, පිරියත සහ උපකරණ ප්‍රකාශ කරනු ලැබ ඇත්තේ සමුච්චිත ක්ෂයවීම් සහ කිසියම් සමුච්චිත හානි අලාභ අඩු කර පිරිවැයටය. වත්කම් අත් කර ගැනීම සඳහා සෘජුව ආරෝපණීය වියදම් පිරිවැයට ඇතුලත් වේ. මණ්ඩලය විසින් ඉදිකළ වත්කම්වලට අමුද්‍රව්‍ය පිරිවැය සහ සෘජු ශ්‍රම පිරිවැය සහ අදාළ වත්කම අපේක්ෂිත පරිරහණ තත්ත්වයට පත් කිරීමට දරන ලද පිරිවැය සහ එම ඉදිකිරීමට කරන ලද වැඩ බිමෙහි යම් ඉවත් කිරීම් සහ බැහැර කිරීම් සඳහා දරන ලද පිරිවැය සහ හඳුනා ගැනීමේ නිර්ණායක සපුරාලනු ලබන්නේ නම් දිගුකාලීන ඉදිකිරීම් සඳහා ප්‍රාග්ධනගත කළ ණය ගැනුම් පිරිවැයද අන්තර්ගත වේ. අනෙකුත් සියළු අලුත්වැඩියා හා නඩත්තු පිරිවැය දරනු ලබන අවස්ථාවේදී විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ පිලිගනු ලැබේ. වත්කම භාවිතයෙන් පසුව එය භාවිතයෙන් ඉවත් කිරීම සඳහා අපේක්ෂිත පිරිවැයේ වත්මන් වටිනාකම, ප්‍රතිපාදනයක හඳුනාගැනීමේ නිර්ණායක සපුරාලන්නේ නම් අදාළ වත්කමේ පිරිවැයෙහි අන්තර්ගත කරනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණවල සැලකිය යුතු කොටස් කාලාන්තරව ප්‍රතිස්ථාපනය කිරීමට අවශ්‍ය වන විටදී, ප්‍රතිස්ථාපනය කළ කොටස මණ්ඩලය ඉවත් කර නව කොටස හා ඒ හා ආශ්‍රිත ප්‍රයෝජනවත් ආයු කාලය සහ ක්ෂයවීම පිළිගනු ලැබේ. එපරිද්දෙන්ම, ප්‍රධාන පරීක්ෂාවක් සිදු කරනු ලැබීමේදී, හඳුනාගැනීමේ නිර්ණායක සපුරාලන්නේ නම්, එහි පිරිවැය ප්‍රතිස්ථාපනයක් ලෙස පිරියතේ සහ උපකරණයේ ධාරණ වටිනාකමේ හඳුනාගනු ලැබේ. අනෙකුත් සියලු අළුත්වැඩියා සහ නඩත්තු පිරිවැය දරනු ලැබූ විටදී විස්තීරණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ.වත්කම භාවිතයෙන් පසු එය භාවිතයෙන් ඉවත්කිරීම සඳහා අපේක්ෂිත පිරිවැයේ වත්මන් වටිනාකම, ප්‍රතිපාදනය සඳහා හඳුනාගැනීමේ නිර්ණායක සපුරාලන්නේ නම් ඒ ඒ වත්කමේ පිරිවැයෙහි ඇතුලත් කරනු ලැබේ.

**(ආ) ප්‍රත්‍යාගණනය**

වත්කම් මනිනු ලබන්නේ වත්කම මත සමුච්චිත ක්ෂයවීම සහ ප්‍රත්‍යාගණන දිනයෙන් පසු හඳුනාගනු ලබන හානි අලාභ අඩු කොට සාධාරණ වටිනාකමටය. ප්‍රත්‍යාගණනය කළ වත්කමක සාධාරණ වටිනාකම එහි ධාරණ වටිනාකමින් ප්‍රමාණාත්මකව වෙනස් නොවන බව සහතික කිරීම සඳහා ගණනය කිරීම් සැලකිය යුතු වාර ගණනකින් සිදු කරනු ලැබේ.

ඕනෑම ප්‍රත්‍යාගණන අතිරික්තයක්, අනෙකුත් විස්තීර්ණ ආදායමේ කලින් හඳුනා ගනු ලැබූ එම වත්කමේම ප්‍රත්‍යාගණන අඩුවීමක් එය ප්‍රතිවර්තකරණ ප්‍රමාණයට හැර අනෙකුත් විස්තීර්ණ ආදාය-මේ හඳුනාගනු ලබන අතර, එවන් අවස්ථාවකදී වැඩිවීම අනෙකුත් විස්තීර්ණ ආදායමේ හඳුනාගනු ලැබේ. ප්‍රත්‍යාගණන හිඟයක්, වත්කම් ප්‍රත්‍යාගණන සංචිතයේ හඳුනාගනු ලබන එම වත්කම් මතම පවත්නා අතිරික්තයන් එය හිලව් කරන ප්‍රමාණයට අනෙකුත් විස්තීර්ණ ආදායමේ හඳුනාගනු ලැබේ.

වත්කමක ප්‍රත්‍යාගණනය කළ ධාරණ වටිනාකම මත පදනම් ක්ෂයවීම සහ වත්කමේ මුල් පිරිවැය පදනම් ක්ෂයවීම අතර වෙනස සඳහා වත්කම් ප්‍රත්‍යාගණන සංචිතයෙන් රඳවාගත් ඉපැයුම්වලට වාර්ෂික පැවරුමක් සිදු කරනු ලැබේ. ඊට අතිරේකව, ප්‍රත්‍යාගණන දිනයට සමුච්චිත ක්ෂයවීම වත්කමක දළ ධාරණ වටිනාකමේ ප්‍රමාණයට ඉවත් කරන අතර ශුද්ධ වටිනාකම වත්කමේ ප්‍රත්‍යාගණන වටිනාකමට නැවත ප්‍රකාශ කරනු ලැබේ. බැහැර කිරීමේදී, විකුණනු ලබන නිශ්චිත වත්කමට අදාල කිසියම් ප්‍රත්‍යාගණන සංචිතයක් රඳවාගත් ඉපැයුම්වලට මාරු කරනු ලැබේ.

සියලු දේපල, පිරියත හා උපකරණ ආරම්භයේදී පිරිවැයට වාර්තාකරනු ලැබේ. දේපල, පිරියත හා උපකරණ තදනන්තරව ප්‍රත්‍යාගණනය කිරීමේදී, කළ හැකි සෑම විටකදීම එවැනි වත්කම්වල සමස්ත පන්තියම ප්‍රත්‍යාගණනය කරනු ලැබේ.

ජාතික ලොතරැයි මණ්ඩලයේ වාහන, තදනන්තරව රජයේ තක්සේරුකරු වාරිකව සිදුකරන තක්සේරු පාදකව සාධාරණ වටිනාකමට දරනු ලැබේ.

**(ඇ) ක්ෂයවීම**

ක්ෂයවීම පදනම්ව ඇත්තේ වත්කමක පිරිවැයෙන් එහි අවශේෂ වටිනාකම අඩු කිරීමෙනි. එක් එක් වත්කම්වල සැලකිය යුතු සංචරක තක්සේරු කරනු ලබන අතර යම් සංරචකයකට එම වත්කමේ ඉතිරි ඒවායින් වෙනස් ප්‍රයෝජ්‍ය ආයු කාලයක් තිබේ නම්, එම සංරචකය වෙනම ක්ෂය කරනු ලැබේ.

ක්ෂයවීම සඳහා ප්‍රතිපාදනය ගණනය කරනු ලබන්නේ, සින්නක්කර ඉඩම් හැර සියලු දේපල, පිරියත හා උපකරණවල පිරිවැය හෝ තක්සේරුව මත සරල මාර්ග ක්‍රමය භාවිතා කිරීමෙන් වන අතර එසේ කරනුයේ එම වටිනාකම් ඒවායේ ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයු කාලය පුරා ලියා හැරීමටය.

කල්බදු වාරය අවසානයේදී මණ්ඩලය විසින් හිමිකාරිත්වය ලබාගන්නා බවට සාධාරණ ලෙස නිශ්චිත වන්නේ නම් මිස මූල්‍ය කල්බදු යටතේ දරනු ලබන වත්කම් කල්බදු වාරයේ වඩා කෙටි වාරය සහ ඒවායේ ප්‍රයෝජ්‍ය ආයු කාලය පුරා ක්ෂය කරනු ලැබේ.

වත්කමක ක්ෂයවීම ආරම්භ වනුයේ එය ප්‍රයෝජනය සඳහා ගත හැකි අවස්ථාවේ සිට වන අතර ක්ෂයවීම නවතිනුයේ විකිණීම සඳහා යැයි වත්කම වර්ගීකරණය කළ දිනයේ හෝ වත්කම ඉවත් කරන දිනය යන දිනවලින් කලින් පැමිණෙන දිනයේය. වත්කම්වල අවශේෂ වටිනාකම්, ප්‍රයෝජ්‍ය ආයුකාල සහ ක්ෂය කිරීමේ ක්‍රමවේද සෑම වාර්තාකරණ කාලසීමාවක් අවසානයේම සමාලෝචනය කරනු ලබන අතර අවශ්‍යම නම් පමණක් වෙනස් කරනු ලැබේ.

පෙර වසරවල අනුපාත හා සංගත මෙම කාර්යය සඳහා යොදා ගනු ලැබූ මූලික වාර්ෂික අනුපාත පහත පරිදි වේ.

| | වාර්ෂිකව % |
|---|---|
| සින්නක්කර ගොඩනැගිලි | 5 |
| දිනුම් ඇදීම සඳහා ගන්නා බැරල, ලොතරැයි උපකරණ | 20 |
| මෝටර් රථ | 25 |
| ගෘහභාණ්ඩ හා උපාංග | 10 |
| පරිගණක | 25 |
| වායු සමීකරණ, සාමාන්‍ය සහ කාර්යාල උපකරණ | 20 |

**(ඇ) පසුකාලීන පිරිවැය**

දේපල, පිරියත හා උපකරණයක කොටස් ප්‍රතිෂ්ඨාපනය සඳහා දරන ලද පිරිවැය වත්කමේ ධාරණ අගයට හඳුනාගනු ලබන්නේ එම කොටස හා බැඳුනු අනාගත ආර්ථික ප්‍රතිලාභ මණ්ඩලය තුලට ලැබීමේ භව්‍යතාවයක් ඇත්නම් සහ එහි පිරිවැය විශ්වසනීය ලෙස මැනිය හැකි නම් පමණි. පහත දී ඇති ඉවත් කිරීමේ ප්‍රතිපත්තිය ප්‍රකාරව, ප්‍රතිස්ථාපනය කරනු ලැබූ කොටස්වල ධාරණ වටිනාකම ඉවත් කරනු ලැබේ. දේපල, පිරියත හා උපකරණ එදිනෙදා සේවා කිරීමේ පිරිවැය ඒවා දරනු ලබන විටදී විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ පිලිගනු ලැබේ.

**(ඈ) ඉවත් කිරීම**

මුලින් හඳුනාගත් දේපල, පිරියත සහ උපකරණ අයිතමයන් සහ ඒවායේ යම් වැදගත් කොටසක් බැහැර කිරීමේදී හෝ එය භාවිතා කිරීමෙන් හෝ ඉවත් කිරීමෙන් අනාගත ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විටදී ඉවත් කරනු ලැබේ. විකිණීමේදී හෝ වත්කම ඉවත් කිරීම මත මතුවන කිසියම් ප්‍රතිලාභයක් හෝ අලාභයන් (බැහැර කිරීමෙන් ලත් ශුද්ධ මුදල් සහ වත්කම් ධාරණ වටිනාකම අතර වෙනස) වත්කම ඉවත් කරනු ලැබූ විටදී විස්තීරණ ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ.

සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේදීම වත්කම්වල අවශේෂ වටිනාකම්, ප්‍රයෝජ්‍ය ආයු කාල, ක්ෂය කිරීමේ ක්‍රමවේද සමාලෝචනය කරනු ලබන අතර, යෝග්‍ය නම් ප්‍රතිපත්ති, සම්පාදකයන් සඳහා මූල්‍ය ප්‍රකාශවල සපයා ඇති තොරතුරුවල අදාලත්වය සහ විශ්වසනීයත්වය ඉහළ නැංවීම පිණිස ඉදිරිකාලීනව ගලපනු ලැබේ.

**(ඊ) පුනස්ථාපන පිරිවැය**

ආරම්භයේදී තක්සේරු කළ කාර්යසාධන ප්‍රමිතියෙන් අපේක්ෂා කළ අනාගත ආර්ථික ප්‍රතිලාභ යථා තත්ත්වයට පැමිණවීම හෝ නඩත්තු කිරීම පිණිස දේපල, පිරියත සහ උපකරණවල අළුත්වැඩියා හෝ නඩත්තුව සඳහා දරන ලද වියදම්, දරනු ලැබූ අවස්ථාවේ වියදමක් ලෙස හඳුනාගනු ලැබේ.

**2.2.2 නොනිම් ප්‍රාග්ධන වැඩ**

නොනිම් ප්‍රාග්ධන වැඩ, වත්කම පළමු උපයෝජන අවස්ථාවේදී අදාල වත්කම් ගිණුමට පවරනු ලැබේ. නොනිම් ප්‍රාග්ධන පිරිවැය යනු මිලදීගැනිමේ හෝ ඉදිකිරීමේ හා ඒ ආශ්‍රිත වෙනත් ඕනෑම වියදමක් සහිත පිරිවැය වේ.

ස්ථිර ස්වභාවයේ නොනිම් ප්‍රාග්ධන වැඩ මත හෝ ව්‍යාපාරයේ ඉපැයුම් ධාරිතාවය ඉහළ නැංවීම පිණිස දරන ලද වියදම් ප්‍රාග්ධන වියදම් සේ සලකා තිබේ.

නොනිම් ප්‍රාග්ධන වැඩ පළමු උපයෝජන අවස්ථාවේදී හෝ වත්කම සක්‍රීය සේවය සඳහා යෙදවූ අවස්ථාවේදී අදාළ වත්කමේ ගිණුමට පවරනු ලැබේ.

**2.2.3 අස්පෘශ්‍ය වත්කම්**

**පරිගණක මෘදුකාංග**

වෙන් වෙන්ව අත්කරගත් අස්පෘශ්‍ය වත්කම් පිරිවැයට මූලික හඳුනාගැනීම මත මනිනු ලැබේ. මූලික පිළිගැනීමෙන් අනතුරුව අස්පෘශ්‍ය වත්කම් කිසියම් සමුච්චිත ක්‍රමක්ෂයක් සහ සමුච්චිත හානි අලාභයක් අඩු කර පිරිවැයට ගණනය කරනු ලැබේ. අස්පෘශ්‍ය වත්කම් යනු කුලිය සඳහා හෝ පරිපාලන කාර්යය සඳහා භාණ්ඩ හෝ සේවා නිෂ්පාදනයේදී හෝ සැපයීමේදී භාවිතය සඳහා දරනු ලැබූ භෞතික ද්‍රව්‍යය නොමැති හඳුනාගත හැකි මූල්‍ය නොවන වත්කමකි.

අස්පෘශ්‍ය වත්කම්වල ප්‍රයෝජනයට ආයු කාලය පරිමිත හෝ අපරිමිත සේ තක්සේරු කරනු ලැබේ.

පරිමිත ආයු කාලයක් ඇති අස්පෘශ්‍ය වත්කම් ප්‍රයෝජනවත් ආයුකාලය මත ක්‍රමක්ෂය කරනු ලබන අතර අස්පෘශ්‍ය වත්කම හානි වී ඇත්තේ යැයි පෙන්නුම් කිරීමක් තිබෙන කවර හෝ අවස්ථාවක හානිය අගයනු ලැබේ. පරිමිත ආයුකාලයක් ඇති අස්පෘශ්‍ය වත්කමක් සඳහා ක්‍රමක්ෂ කාලසීමාව සහ ක්‍රමක්ෂ ක්‍රමවේදය යටත්පිරිසෙයින් එක් එක් වාර්තාකරණ කාලසීමාව අවසානයේදී සමාලෝචනය කරනු ලැබේ. අපේක්ෂිත ආයු කාලයේ හෝ වත්කමේ අන්තර්ගත කර ඇති අනාගත ආර්ථික ප්‍රතිලාභයන්හි අපේක්ෂිත පාරිභෝජන රටාවේ වෙනස්කම් උචිත පරිදි, ක්‍රමක්ෂ කාලසීමාව හෝ ක්‍රමවේදය වෙනස් කිරීම මගින් ගිණුම්කරණ අතර ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්කම් සේ සලකනු ලැබේ. පරිමිත ආයුකාලයක් ඇති අස්පෘශ්‍ය වත්කමක් මත ක්‍රමක්ෂ වියදම, අස්පෘශ්‍ය වත්කම්වල කර්තව්‍ය සමග සංගත වියදම් කාණ්ඩයේ ලාභයේ / අලාභයේ හඳුනාගනු ලැබේ.

වත්කමට ආරෝපණය කළ හැකි අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ගලා ඒමේ තත්ත්වයන් තිබේ නම් සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 38 - 'අස්පෘශ්‍ය වත්කම්' ප්‍රකාරව වත්කමේ පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකි නම් අස්පෘශ්‍ය වත්කමක් පිලිගනු ලැබේ.

අස්පෘශ්‍ය වත්කමක් හඳුනා නොගැනීම නිසා ඇතිවන ලාභ හෝ අලාභ ශුද්ධ බැහැර කිරීමේ උත්පාදන සහ වත්කමේ ධාරණ මුදල අතර වෙනස ලෙස මනිනු ලබන අතර වත්කම පිළිනොගන්නා විටදී විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ.

### 2.2.4 කල්බදු වත්කම්

**මූල්‍ය කල්බදු - මණ්ඩලය බදුකරු වන විට**

කල්බදුවල නියමයන් අනුව මණ්ඩලය සැලකිය යුතු පරිදි හිමිකාරීත්වයේ සියලු අවදානම් සහ ප්‍රතිලාභ බාරගන්නා විටදී ඒවා මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. මූල්‍ය කල්බදු මගින් අත්කර ගන්නා වත්කම් මනිනු ලබන්නේ සමුච්චිත ක්ෂයවීම සහ සමුච්චිත හානි අලාභ අඩු කොට, ඒවායේ සාධාරණ වටිනාකමට හෝ ආරම්භයේදී අවම කල්බදු ගෙවීමේ වත්මන් වටිනාකම යන ඒවායින් වඩා අඩු දේට සමාන වටිනාකමටය.

බදුහිමියාට ගෙවිය යුතු අනුරූපී මුල් මුදල බැරකමක් සේ පෙන්නුම් කරනු ලැබේ. අනාගත කාලසීමා සඳහා වෙන් කරනු ලැබූ මූල්‍ය ගාස්තු සටහන්වල වෙනම හෙළිදරව් කොට ඇත.

එක් එක් වර්ෂය සඳහා අදාළ කුලී බැඳීමේ පොලී මූලිකාංගය, එක් එක් කාලසීමාව සඳහා බැරකමේ ඉතිරි ශේෂය මත නියත ආවර්තිත පොලී අනුපාතයක් නිපැයීම පිණිස බදු කාලසීමාව පුරා විස්තීරණ ආදායම් ප්‍රකාශයේ සටහන් කරනු ලැබේ.

කල්බදු දේපලට හෝ ඒ මත වැඩි දියුණු කිරීම් සඳහා පිරිවැය, කල් බද්දේ ඉතිරිව ඇති කාලසීමාව හෝ වැඩි දියුණු කිරීම්වල ප්‍රයෝජනවත් ආයු කාලය හෝ යන දෙකින් වඩා කෙටිකාලයක පුරා ප්‍රාග්ධනගත කිරීම සහ ක්ෂය කිරීම කරනු ලැබේ.

මූල්‍ය කල්බද්දක් ප්‍රතිඵලය වන්නා වූ විකිණීමත් සහ  බදු ගැනීමේ ගනුදෙනුවකට අදාල වත්කම්වල ධාරණ වටිනාකම මත කවර හෝ විකුනුම් ආදායම් අතිරික්තයක් බදු වාරය පුරා විලම්බිත කර ක්‍රමක්ෂය කරනු ලැබේ.

### 2.2.5 ආයෝජන දේපල

**(අ) හඳුනාගැනීමේ පදනම**

ආයෝජන දේපල යනු බදු කුලී ඉපැයීම සඳහා හෝ ප්‍රාග්ධන අගය වැඩි කිරීම සඳහා හෝ ඒ අරමුණු දෙකම සඳහා රඳවා ගන්නා එනමුත් ව්‍යාපාරයේ සාමාන්‍ය කටයුතුවලදී විකිණීම, භාණ්ඩ හෝ සේවා නිපදවීමේදී හෝ සැපයීමේදී භාවිතය සඳහා හෝ පරිපාලනමය කාර්යය සඳහා නොවන දේපල වේ.

**(ආ) මැනීමේ පදනම**

අයිතමය හා ආශ්‍රිත අනාගත ආර්ථික ප්‍රතිලාභ මණ්ඩලය වෙත ගලා ඒමේ සහ ආයෝජන දේපලේ පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකිවීමේ භව්‍යතාවක් තිබේ නම් පමණක්ම ආයෝජන දේපල හඳුනාගනු ලැබේ. නිදහස් අයිතිය ඇති ඉඩම් සහ ගොඩනැගිලිවලින් සමන්විත, ආයෝජන දේපල යනු දිගුකාලීන කුලී සඳහා හෝ ප්‍රාග්ධන අගය වැඩිවීම හෝ ඒ දෙකම සඳහා රඳවාගනු ලබන දේපල වන අතර භාණ්ඩ හෝ සේවා සැපයුම සඳහා හෝ පරිපාලනය සඳහා සාරානුකූලව යොදාගනු නොලබන අතර සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී විකිණීමට අදහස් කරනු නොලබයි.

ආයෝජන දේපල ආරම්භයේදී සහ පසුකාලීනව ආශ්‍රිත ගනුදෙනු පිරිවැය ඇතුළුව, පිරිවැයට මනිනු ලබන අතර එබැවින් සමුච්චිත ක්ෂයවීම සහ කිසියම් සමුච්චිත හානි අලාභ අඩුකොට පවත්වා ගනු ලැබේ.

වෙළඳපොල වටිනාකම විවෘත කිරීම සඳහා මණ්ඩලයේ ආයෝජන දේපල වාර්ෂිකව ප්‍රත්‍යාගණනය කරනු ලබන අතර ධාරණ වටිනාකමේ වෙනස්කම් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ.

**(ඇ) ඉවත් කිරීම**

අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන නිසාවෙන් බැහැර කළ විටදී හෝ භාවිතයෙන් ස්ථිරවම අයින් කළ විටදී ආයෝජන දේපල ඉවත් කරනු ලැබේ.

**(ඈ) ආයෝජන දේපලවලට / දේපලවලින් පසුකාලීන පැවරුම්**

අයිතිකරුගේ අධිවාසය අවසන්වීම, වෙනත් පාර්ශ්වයකට මෙහෙයුම් බදු දීමක් ආරම්භ කිරීම හෝ විකිණීමේ අරමුණ ඇතිව ඉදිකිරීම හෝ සංවර්ධනය සම්පූර්ණ කිරීම මගින් තහවුරු වන, භාවිතයේ වෙනසක් සිදුවූ විට පමණක්ම ආයෝජන දේපලවලට පැවරුම් සිදු කරනු ලැබේ.

**2.2.6 මූල්‍යමය නොවන වත්කම් හානිය**

සෑම වාර්තාකරණ දිනයකටම වත්කමක් හානි වී ඇත්දැයි මණ්ඩලය තක්සේරු කරයි. එවැනි හානිකරණ ලක්ෂණ පවතින විට හෝ වත්කම් සඳහා හානිකරණ පරීක්ෂාවන් අවශ්‍ය විට බැංකු වත්කමෙහි නැවත අය කර ගත හැකි අගය ඇස්තමේන්තු කරනු ලැබේ. විකිණීමේදී දරන පිරිවැය අඩු කළ වත්කමේ හෝ මුදල් ජනන ඒකකයේ සාධාරණ අගය සහ භාවිතා කිරීමේ වටිනාකමට වඩා වත්කමක ආපසු අය කර ගත හැකි අගය ඉහළ වේ. වත්කමක ධාරණ අගය හෝ මුදල් ජනන ඒකකය එහි ආපසු අය කර ගත හැකි අගය ඉක්මවා යන විට වත්කම හානිකරණය වී ඇති බව සලකන අතර එහි නැවත අය කර ගත හැකි අගය පහත හෙලනු ලැබේ. භාවිතා කිරීමේ වටිනාකම තක්සේරු කිරීමේදී මුදලේ කාල අගය හා වත්මනෙහි විශේෂිත අවදානම්වල වර්තමාන වෙළඳපොල තක්සේරු නිරූපනය වන අයුරින් බදු පෙර වට්ටම් අනුපාත භාවිතා කොට ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ වර්තමාන අගය තෙක් වට්ටම් කරනු ලැබේ. මිලැයුම් ගුණාකාර, ප්‍රකාශිත කොටස් මිල, හෝ පවතින අනෙකුත් සාධාරණ වටිනාකම් දර්ශක මගින් මෙම ගණනය කිරීම් තහවුරු කළ යුතුය.

ප්‍රත්‍යාගණනය ස්කන්ධ කරා රැගෙන යනු ලැබූ පූර්වයෙන් ප්‍රත්‍යාගණනය කරනු ලැබූ වත්කම් හැරුණු විට, හානි වූ වත්කමේ කර්තව්‍ය හා සංගත වියදම් කාණ්ඩවල අඛණ්ඩ මෙහෙයුම්වල හානි අලාභ විස්තීරණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ. එවන් අවස්ථාවකදී, පූර්වයෙන් සිදුකරන ලද කවර හෝ ප්‍රත්‍යාගණනයක වටිනාකම දක්වා හානිය ස්කන්ධයේ හඳුනාගනු ලැබේ.

කීර්තිනාමය හැර, වත්කම් සම්බන්ධයෙන් සෑම වාර්තාකරණ දිනයකටම ඇගයීමක් සිදු කරන අතර ඒ තුලින් පෙර හඳුනාගත් හානිකරණ අලාභ තවදුරටත් නොපවතින බවට හා ඒවා අඩුවී ඇති බවට යම් නිරීක්ෂණ කර ඇත්දැයි විමසා බලයි. එවැනි නිරීක්ෂණයක් ඇත්නම්, මණ්ඩලය විසින් වත්කමේ ආපසු අය කරගත හැකි අගය ඇස්තමේන්තු කරයි. කලින් හඳුනාගත් හානිකරණ අලාභ ප්‍රතිවර්ත කරනුයේ, අවසන් වරට හානිකරණ අලාභ හඳුනාගත් අවස්ථාවේ සිට වත්කමේ ආපසු අයකරගත හැකි අගය තීරණය කිරීම සඳහා භාවිතා කළ ඇස්තමේන්තු වෙනස් වේ නම් පමණි. එය එසේ වන්නේ නම්, වත්කමේ ධාරණ අගය එහි ආපසු අය කරගත හැකි වටිනාකමට ඉහළ නංවනු ලැබේ.

පෙර වසරවලදී වත්කම සඳහා හානි අලාභයක් හඳුනාගෙන නොමැති නම්, එම වැඩිකල වටිනාකමට ක්ෂයවීම නොමැතිව නිශ්චය කිරීමට ඉඩ තිබූ ධාරණ වටිනාකම ඉක්මවා යාමට නොහැක. වත්කම ප්‍රත්‍යාගණනය කළ වටිනාකමට පවත්වා නොගන්නේ නම් මිස, එබඳු ප්‍රතිවර්තනයක් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගන්නා අතර එබඳු අවස්ථාවකදී ප්‍රතිවර්තනය, ප්‍රත්‍යාගණන වැඩිවීමක් ලෙස සලකනු ලැබේ.

### 2.2.7 විකිණීම සඳහා රඳවා ගත් ජංගම නොවන වත්කම්

විකිණීම සඳහා ඇති වත්කම්වල ධාරණ වටිනාකම මූලිකවම විකුණුම් ගනුදෙනුවක් හරහා අය කර ගැනීමට නියමිත විටදී හා විකුණුම සිදුවීම සඳහා ඉහළ භව්‍යතාවක් ඇතැයි සලකනු ලබන විටදී ජංගම නොවන වත්කම් විකිණීම සඳහා ඇති වත්කම් ලෙස වර්ගිකරණය කරනු ලැබේ. විකිණීම සඳහා පිරිවැය අඩුකොට ධාරණ වටිනාකම සහ සාධාරණ අගය යන දෙකින් වඩා අඩු දෙයට එය සඳහන් කරනු ලැබේ.

ජංගම නොවන වත්කම් සහ බැහැර කරන කාණ්ඩ විකිණීම සඳහා ඇති ලෙස වර්ගීකරණය කරනු ලබන්නේ විකිණීම සිදුවීම සඳහා ඉහළ භව්‍යතාවයක් ඇති විටදී සහ වත්කම හෝ බැහැර කරන කාණ්ඩය එහි වත්මන් තත්ත්වයෙන් වහාම විකිණීම සඳහා පවතින විටදී පමණි.

දේපල, පිරියත හා උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම් විකිණිම සඳහා ඇති ලෙස වර්ගීකරණය කිරීමෙන් පසුව ක්ෂය කිරීම හෝ ක්‍රමක්ෂණ කිරීම කරනු නොලැබේ.

### 2.2.8 මූල්‍ය වත්කම්

වත්කම අත්පත් කරගත් කාර්යය මත පරායත්ත වූ මණ්ඩලය සිය මූල්‍ය වත්කම් පහත සාකච්ඡා කර ඇති කාණ්ඩ අතුරින් එකකට වර්ගීකරණය කරනු ලැබේ.

**(අ) ණය සහ ලැබිය යුතු දෑ**

ණය සහ ලැබිය යුතු දෑ සක්‍රීය වෙළඳපොලක මිල ගණන් ඉදිරිපත් කර නොමැති ස්ථාවර සහ නිශ්චය ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. ගනුදෙනුකරුවන්ට භාණ්ඩ හා සේවා සැපයීම හරහා ඒවා මූලිකවම මතුවන නමුත් (උදා : වෙළඳ ලැබිය යුතු දෑ) අනෙකුත් ආකාරයේ ගිවිසුම්කර මූල්‍ය වත්කම් ද එයට අන්තර්ගත වේ. සාධාරණ වටිනාකමට සහ ඒවා අත්පත් කර ගැනීම හෝ නිකුත් කිරීමට සෘජුවම ආරෝපණීය ගනුදෙනු පිරිවැයට ඒවා පළමුව හඳුනාගනු ලැබේ. කාර්ය මණ්ඩලය සේවයේ නියුක්තව සිටින බැවින් සහ වෙළෙන්දන් කාර්යසාධන බැඳුම්කරයක් ලබා දී ඇති බැවින් ආපසු අය කරගැනීම නිශ්චිත නිසාවෙන් ණය සහ වෙළඳ ලැබිය යුතු දෑ ක්‍රමක්ෂය නොකළ අතර සාධාරණ වටිනාකමට පෙන්නුම් කෙරේ.

**(ආ) වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ**

වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ මුලින්ම මනිනු ලබන්නේ සාධාරණ වටිනාකම් පිරිවැයටය.

#### 2.2.9 වට්ටෝරු භාණ්ඩ (තොග)

නිෂ්පාදනයේ කෙටි ජීවන චක්‍රය හේතු කොටගෙන ශුද්ධ උපලබ්ධි අගයක් නොමැතිවීම නිසා යල්පිනු සහ සෙමින් විකිණෙන අයිතම සඳහා නිසි වාසි ලබාදීමෙන් අනතුරුව, වට්ටෝරු භාණ්ඩ පිරිවැයට පමණක් මනිනු ලැබේ. ලොතරැයිපත් වේගයෙන් අලෙවි වන බැවින් ශුද්ධ උපලබ්ධි අගය හඳුනාගැනීමේ අවශ්‍යතාවයක් නොමැත. ශුද්ධ උපලබ්ධි අගය යනු සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී සම්පූර්ණ කිරීමේ ඇස්තමේන්තුගත පිරිවැය සහ විකිණීම සිදුකිරීමට අවශ්‍යය ඇස්තමේන්තුගත පිරිවැය අඩු කොට වට්ටෝරු භාණ්ඩ විකිණිය හැකි මිලය.

රන් භාණ්ඩ, මෝටර් රථ සහ අනෙකුත් ත්‍යාග ඇතුළත් ත්‍යාග තොග, ඒවාට විකුණුම් වටිනාකමක් නොමැති බැවින් සහ දරන ලද වියදම පමණක් ඇති බැවින් පිරිවැයට තක්සේරු කරනු ලැබේ. එවැනි සියලු තොග අනාගතයේ ඕනෑම වේලාවක ත්‍යාග ලෙස පිරිනමනු ලබන මුත් 'අතේ දුරින්' ගනුදෙනුවක් මගින් විකුණනු නොලැබේ.

වට්ටෝරු භාණ්ඩ ඒවා වත්මනෙහි තිබෙන ස්ථානයට සහ තත්ත්වයට ගෙන ඒම සඳහා දරන ලද පිරිවැය වට්ටෝරු භාණ්ඩ පිරිවැය ලෙස ගිණුම්ගත කරනු ලැබේ.

#### 2.2.10 මුදල් හා මුදලට සමාන දෑ

මුදල් හා මුදලට සමාන දෑ අතැති මුදල් සහ ඉල්ලුම් තැන්පතු ලෙස නිර්වචනය කෙරේ. අතැති මුදල්, ඉල්ලූ විට ලබාගැනීම සඳහා බැංකුවේ රඳවා ඇති තැන්පතු, මාස තුනක් හෝ ඊට අඩු මුල් කල්පිරීම් සහිත අනෙකුත් කෙටිකාලීන ඉහළ ද්‍රවශීල ආයෝජන ඊට ඇතුලත් වේ.

වක්‍ර ක්‍රමය මත පාදකව මුදල් ප්‍රවාහ ප්‍රකාශ වාර්තා කරනු ලැබේ.

### 2.3 බැරකම් සහ ප්‍රතිපාදන

#### 2.3.1 බැරකම්

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ජංගම බැරකම් යටතේ වර්ගීකරණය කර ඇති බැරකම් වනුයේ ශේෂපත්‍ර දිනයේ සිට වසරක් තුළ ගෙවීමට සිදු වේ යැයි අපේක්ෂා කරන බැරකම් වේ. මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීමේදී දන්නා සියලුම බැරකම් ගිණුම්ගත කොට ඇත.

#### වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ

වෙළඳ ණයගැතියන් සහ අනෙකුත් ගෙවිය යුතු දෑ ඒවායේ පොත් වටිනාකමට සඳහන් කර ඇත.

#### 2.3.2 ප්‍රතිපාදන, අසම්භාව්‍ය වත්කම් සහ අසම්භාව්‍ය බැරකම්

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස වත්මන් බැඳීමක් (නෛතික සහ සම්මුතික) මණ්ඩලය සතුවීමදී, එම බැඳීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ මූර්තිමත් කරමින් සම්පත් ගලා යාමක් අවශ්‍ය වීම සිදුවිය හැකි විටකදී සහ බැඳීමේ වටිනාකමට විශ්වාසනීය ඇස්තමේන්තුවක් සිදු කළ හැකි විටදී ප්‍රතිපාදන හඳුනාගනු ලැබේ.

සම්පත් ගලායාම අසම්භාව්‍ය නොකළහොත් මිස, සියලු අසම්භාව්‍ය බැරකම් සටහන් ලෙස මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කරනු ලැබේ.

**ඒකාබද්ධ අරමුදල වෙත දායකත්වය මත ආදායම් බදු**

ඒකාබද්ධ අරමුදල සඳහා දායකත්වය මත ආදායම් බදු 2007 සිට 2012 දක්වා කාලසීමාව තුළදී බදුකරණය සඳහා ඉඩ නොදෙනු ලැබූ බැවින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ඒකාබද්ධ අරමුදල් ගෙවීම් මත ආදායම් බදු අතිරේක තක්සේරු පනවන ලදී. 2007 සිට 2010 දක්වා, තක්සේරු කිරීම රු. 1,136,146,578/* ක් වූ අතර එය 2013 ජනවාරි මාසයෙන් ආරම්භ කොට මාසික වාරික 26කින් ගෙවිය යුතුය. 2010 සිට 2013 දක්වා තක්සේරු කිරීම් රු. 1,644,103,198/* ක් වූ අතර එය 2015 මාර්තු සිට 2017 අගෝස්තු දක්වා මාසික වාරික 30කින් ගෙවිය යුතුය. ඒ අනුව එම ගෙවීම් සිදු කරනු ලැබේ.

**හිමිකම් ත්‍යාග**

ත්‍යාග හිමි ටිකට්පතක් ඉදිරිපත් කරන ලද දිනුම් හිමියෙකුට මණ්ඩලය විසින් ත්‍යාගය ගෙවන ලද අතර එකී ටිකට්පත පදනම් කරගෙන තවත් හිමිකරුවෙක් මණ්ඩලයට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති අතර මණ්ඩලයට මොහු සඳහා රු.2,000,000 ක් ගෙවීමට සිදුවිය හැක.

**සේවයේ යළි පිහිටුවීම හෝ වන්දි ගෙවීම**

කොළඹ කම්කරු විනිශ්චය සභාවේ නඩු පැවරූ හිටපු සේවකයෙකුට වන්දි ලෙස රු.3,000,000 ගෙවීමට මණ්ඩලයට සිදුවිය හැක.

**අපහාස කිරීම**

කොළඹ දිසා අධිකරණයේ මන්ඩලයට එරෙහිව අපහාස නඩුවක් පැවරූ පුද්ගලයෙකුට රු. 50,000,000 ගෙවීමට මණ්ඩලයට සිදුවිය හැක.

### 2.3.3 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්

**නිර්වචිත දායක සැලසුම් - සේ.අ.අ. සහ සේ.භා.අ.**

සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවක භාරකාර අරමුදලේ දායක මුදල් සඳහා හිමිකම් ලබා ඇති සියලුම සේවකයන් ඒ ඒ ප්‍රඥප්ති සහ රෙගුලාසි ප්‍රකාරව අදාළ දායක අරමුදල්වලින් ආවරණය කෙරේ. නිර්වචිත දායක සැලසුම් සඳහා දායක මුදල් ආදායම් ප්‍රකාශයේ වියදමක් ලෙස හඳුනාගැනේ.

**නිර්වචිත ප්‍රතිලාභ සැලැස්ම - විශ්‍රාම පාරිතෝෂිකය**

මණ්ඩලයෙහි වසර එකක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සියලු සේවකයන් සඳහා 1983 අංක 12 දරන පාරිතෝෂික පනතේ විධිවිධාන යටතේ ගෙවිය යුතු විශ්‍රාම ප්‍රතිලාභ සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා ඇත. මණ්ඩලය විශේෂඥයෙකුගෙන් ආයුගණක තක්සේරුවක් ලබාගෙන ඇති අතර ශ්‍රී.ලං.ගි.ප්‍ර. 19 මගින් නිර්දේශිත පරිදි ප්‍රක්ෂේපිත ඒකක ණයවර ක්‍රමවේදය භාවිතා කරමින් පාරිතෝෂිතය සඳහා ප්‍රතිපාදන සපයන ලදී.

2011 වසරේදී එක් මාසයක වැටුප පදනම්ව ප්‍රක්ෂේපිත ඒකක ණයවර ක්‍රමවේදය යටතේ ගිණුම්ගත කර පාරිතෝෂිකය ලබාදුන් අතර එම මුදල රු. 3,620,091 ක් විය. කෙසේ වෙතත්, 2012 අගෝස්තු සිට මෙය සේවයේ සම්පූර්ණ කරන ලද එක් එක් වසර සඳහා අර්ධ මාසික වැටුප ලෙස ප්‍රතිවර්තනය කරන ලදී.

### 2.3.4 බදුකරණය

**ජංගම බදු**

මූල්‍ය ප්‍රකාශවල වාර්තා කර ඇති පරිදි ආදායම් බදු සඳහා ප්‍රතිපාදන පදනම්ව ඇත්තේ ආදායම් සහ වියදම් මූලිකාංග මත වන අතර 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන සහ එහි සංශෝධන ප්‍රකාරව ගණනය කර ඇත.

**විලම්බිත බදුකරණය**
වත්කම් සහ බැරකම්වල බදු පදනම සහ මූල්‍ය වාර්තාකරණ කාර්යයන් සඳහා ඒවායේ ධාරණ වටිනාකම අතර ශේෂපත්‍ර දිනට ඇති තාවකාලික වෙනස්කම් මත බැරකම් ක්‍රමවේදය භාවිතා කරමින් විලම්භිත බදු පිළිගනු ලැබේ.

සියලු තාවකාලික වෙනස්කම් සඳහා විලම්භිත බදු වත්කම් සහ බැරකම් හඳුනාගනු ලැබේ. සියලු අඩුකළ හැම තාවකාලික වෙනස්කම් ඉදිරියට ගෙන ගිය ප්‍රයෝජනයට නොගත් බදු බැර සහ ප්‍රයෝජනයට නොගත් බදු අලාභ සඳහා බදු අයකළ හැකි ලාභය පැවතීමට ඉඩ ඇති ප්‍රමාණයට හඳුනාගනු ලැබේ.

විලම්බිත බදු වත්කම්වල ධාරණ වටිනාකම එක් එක් ශේෂපත්‍ර දිනයට සමාලෝචනය කරනු ලබන අතර විලම්බිත බදු සියල්ල හෝ ඉන් කොටසක් ප්‍රයෝජනයට ගනු ලැබීමට ඉඩදීම පිණිස ප්‍රමාණවත් බදු අයකළ හැකි ලාභයක් පැවතීමට තවදුරටත් භව්‍යතාවයක් නොමැති ප්‍රමාණයට අඩු කරනු ලැබේ. හඳුනා නොගත් විලම්බිත බදු වත්කම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ එක් එක් දිනට ප්‍රති තක්සේරු කරනු ලබන අතර අනාගත බදු අය කළ හැකි ලාභය විලම්බිත බදු වත්කම් නැවත අය කර ගැනීමට ඉඩදීමට හැකි වන ප්‍රමාණයට හඳුනාගනු ලැබේ.

විලම්භිත බදු වත්කම් හෝ බැරකම් මනිනු ලබන්නේ පනවනු ලැබ ඇති හෝ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයක් දිනට සාරානුකූලව පනවනු ලැබ ඇති බදු අනුපාත සහ බදු නීති මත පදනම්ව වත්කම් උපලබ්ධි කළ හෝ බැරකම පියවනු ලැබූ අවස්ථාවේ එම වසරට අදාළ කර ගැනීමට අපේක්ෂා කරන බදු අනුපාතයන්ටය.

## 2.4 ආදායම් ප්‍රකාශනය

### 2.4.1 ආදායම හඳුනාගැනීම

**(අ) භාණ්ඩ විකිණීම**
ආර්ථික ප්‍රතිලාභ සමාගම වෙත ගලා ඒමට ඉඩ ඇති ප්‍රමාණයට සහ දරන ලද ආදායම සහ ආශ්‍රිත පිරිවැය විශ්වසනීය ලෙස මැනිය හැකි ප්‍රමාණයට ආදායම හඳුනාගනු ලැබේ. හිමිකාරිත්වයේ සැලකිය යුතු අවදානම් සහ ප්‍රතිලාභ ගැනුම්කරුට පවරා ඇති විටදී, ප්‍රතිෂ්ඨාව නැවත අය කර ගැනීම විය හැකි විටදී සහ භාණ්ඩ ආශ්‍රිත පිරිවැය සහ ඇතිවිය හැකි ලාභ විශ්වාසනීය ලෙස මැනිය හැකි විටදී ආදායම හඳුනාගනු ලැබේ.

**(ආ) පොළිය**
කාල පදනමක් මත උපචිත වන සඵල පොලී ක්‍රම වේදය යොදා ගනිමින් පොලී ආදායම හඳුනාගනු ලැබේ.

**(ඇ) වෙනත්**
අනෙකුත් ආදායම උපචිත පදනමකින් හඳුනා ගනු ලැබේ.

### 2.4.2 වියදම හඳුනාගැනීම

(අ) විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ වියදම හඳුනාගනු ලබන්නේ දැරූ පිරිවැය සහ නිශ්චිත ආදායම් අයිතම්වල ඉපැයුම් අතර සෘජු සම්බන්ධය පදනම් කරගෙනය. ඵලදායී අන්දමින් ව්‍යාපාරය පවත්වාගෙන යාමට සහ දේපල, පිරියත හා උපකරණ පවත්වාගෙන යාමට දැරීමට සිදුවූ සියලු වියදම් වසර සඳහා ලාභ කරා පැමිණීමේදී ආදායමට අය කර තිබේ.

## 2.5 අවදානම් කළමනාකරණය

අනෙකුත් සියලු ව්‍යාපාරයන්ට පොදු පරිදි, මණ්ඩලය අවදානම්වලට නිරාවරණය වී තිබේ. එම අවදානම් කළමනාකරණය කිරීම සඳහා මණ්ඩලයේ අරමුණු, ප්‍රතිපත්ති සහ ක්‍රියාදාම සහ ඒවා මැනීම සඳහා යොදාගත් ක්‍රමවේද මෙම සටහන විස්තර කරයි. මෙම අවදානම් පිලිබඳ තවත් ප්‍රමාණාත්මක තොරතුරු මෙම මූල්‍ය ප්‍රකාශ පුරාම ඉදිරිපත් කර තිබේ. තම මෙහෙයුම් හරහා මණ්ඩලය පහත දැක්වෙන අවදානම්වලට නිරාවරණය වේ.

### (අ) දේශපාලන අවදානම

දේශපාලන ක්ෂේත්‍රයේ සිදුවන වෙනස්කම් මණ්ඩලයේ කටයුතුවලට බලපෑම් ඇති කරයි. කෙසේ වෙතත් එවැනි අවදානම් අවම කිරීම පිණිස කළමනාකාරිත්වය සහ පද්ධති මැනවින් ස්ථානගත කර ඇත.

### (ආ) නෛතික අවදානම

නෛතික අවදානම අදාල වනුයේ නව ලොතරැයි ක්‍රියාත්මක කිරීමේදී රට තුළ ඒවායේ අලෙවිය සීමා කරන රෙගුලාසි සම්බන්ධයෙනි.

### (ඇ) කීර්තිනාම අවදානම

ව්‍යාජ ලෙස මුද්‍රණය කරන ලද ලොතරැයි පත් වෙළඳපොලට පිවිසීම සඳහා ඇති හැකියාව හේතු කොටගෙන කීර්තිනාමය පිලිබඳ අවදානමක් ඇති විය හැක. නමුත් එවැනි අවදානම් අවම කිරීම සඳහා ජා.ලො.ම. දැනටමත් ක්‍රියාමාර්ග ගෙන ඇත.

### (ඈ) මෙහෙයුම් අවදානම

ජා.ලො. මණ්ඩලයේ මෙහෙයුම් සඳහා ඇති තර්ජන වනුයේ කාර්ය මණ්ඩලයේ නොසැලකිලිමත්බව, ස්වාභාවික ආපදා, තාක්ෂණික උපකරණ ක්‍රියා විරහිත වීම ආදියයි.

### (ඉ) ද්‍රවශීලතා අවදානම

සියලු පූර්ව මුද්‍රිත අංක සහිත ලොතරැයිවල සුපිරි ත්‍යාග අඛණ්ඩව දිනාගැනීමේ අවදානම මණ්ඩලයේ ද්‍රවශීලතාවට තර්ජනයක් එල්ල කරයි. කෙසේ වෙතත්, ත්‍යාග සංචිතයේ ශක්තිය මෙම අවදානමට මුහුණදීමට මණ්ඩලයට රුකුලක් වනු ඇත.

### (ඊ) ආර්ථික අවදානම

උපයෝජ්‍ය ආදායම පිලිබඳ රජයේ රෙගුලාසි, මහජනයා විසින් ලොතරැයි මිලදී ගැනීමේ රටාවන් කෙරෙහි බලපානු ඇත.

මණ්ඩලයේ අවදානම් කළමනාකරණ අරමුණු සහ ප්‍රතිපත්ති නිර්ණය කිරීම සඳහා සමස්ත වගකීම මණ්ඩලය සතු අතර ඒ සඳහා අත්‍යන්ත වගකීම රඳවා ගනිමින් අරමුණු සහ ප්‍රතිපත්ති සඵලව ක්‍රියාත්මක කිරීම සහතික කරන්නා වූ ක්‍රියාදාම සැලසුම් කිරීම සහ මෙහෙයවීම සඳහා බලය එය අදාල අංශයන්ට පවරා තිබේ. මණ්ඩලයේ ප්‍රධාන මූල්‍ය නිලධාරියාගෙන් මණ්ඩලයට මාසික වාර්තා ලැබෙන අතර හඳුන්වා දී ඇති ක්‍රියාදාමයන්හි සඵලතාව සහ පනවනු ලබන අරමුණු සහ ප්‍රතිපත්තිවල යෝග්‍යතාව එමගින් සමාලෝචනය කරනු ලැබේ. මණ්ඩලයේ අභ්‍යන්තර විගණකවරුන්ද අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ ක්‍රියාදාම සමාලෝචනය කරන අතර ඔවුන් අනාවරණය කරගන්නා කරුණු විගණන කමිටුව වාර්තා කරයි. මණ්ඩලයේ සමස්ත අරමුණ වනුයේ, මණ්ඩලයේ තරඟකාරිත්වයට සහ නම්‍යශිලීත්වයට අයෝග්‍ය බලපෑම් නොකරමින්, හැකිතාක් දුරට අවදානම් අඩු කිරීමට උපකාරී වන ප්‍රතිපත්ති හඳුන්වා දීමයි.

## 2.6 සාමාන්‍ය

### 2.6.1 ශේෂ පත්‍ර දිනට පසු සිදු වූ සිදුවීම්

ශේෂ පත්‍ර දිනට පසු පැන නැගුණු සියළුම ප්‍රමාණාත්මක සිදුවීම් සලකා බලන ලද අතර අවශ්‍ය අවස්ථාවන්හිදී ගැලපීම් හෝ හෙලිදරව් කිරීම් කර මූල්‍ය ප්‍රකාශනවල අදාල සටහන්වල දක්වා ඇත.

අවිනිශ්චිත හා තහවුරු නොකළ ගිවිසුම්ගත වගකීම්

මණ්ඩලයේ පාලනයෙන් ඔබ්බට ගිය අතීත සිදුවීම්වලින් පැන නගින ලද දේ සහ අවිනිශ්චිත අනාගත සිද්ධින්වලට අදාල සිදුවීම් හෝ සිදුවීම් නොවන ලෙස සනාථ කරගත් භව්‍ය වත්කම් හෝ අවනතභාවයන් අවිනිශ්චිතයන් යටතට වැටේ.

### 2.6.2 සන්සන්දනාත්මක දත්ත

පවත්නා වර්ෂයේ ඉදිරිපත් කිරීම් තහවුරු කිරීම පිණිස අවශ්‍ය තැන්වලදී සන්සන්දනාත්මක දත්ත නැවත වර්ගීකරණය කර දක්වා ඇත.

### 2.6.3 අරමුදල් බෙදාහැරීම

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ අනුමැතිය යටතේ මණ්ඩලය විසින් 2008 සැප්තැම්බර් 02 දින සිට බලපැවැත්වෙන පරිදි ටිකට්පතක මිල රු.10.00 සිට රු.20.00 දක්වා වැඩිකරන ලදී. ඒ අනුව නියෝජිත කොමිස් ද 15% සිට 17.5% දක්වා වැඩිවිය.

(අ) දිනුම් අදින ලොතරැයිවලට අදාල අරමුදල් බෙදා හැරීම

| | මහජන සම්පත | වාසනා සම්පත | ගොවිසෙත | සුපිරි වාසනා | ජාතික සම්පත | සම්පත් රේඛා | මෙගා 50 | පවර් ලොටෝ |
|---|---|---|---|---|---|---|---|---|
| ත්‍යාග | 49% | 47% | 47% | 47% | 47% | 47% | 58% | 48% |
| නියෝජිත කොමිස් | 17.5% | 17.5% | 17.5% | 17.5% | 17.5% | 17.5% | 17.5% | 17.5% |
| ඒකාබද්ධ අරමුදල | 16.5% | 16.5% | 10% | 10% | 10% | 10% | 10% | 10% |
| මණ්ඩලීය වියදම් | 17% | 19% | 25.5% | 25.5% | 25.5% | 25.5% | 14.5% | 24.5% |

* වර්ෂය තුලදී ඉහත පෙන්වා ඇති පරිදි ප්‍රතිශතයන් වෙනස් කරන ලදී.

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා සමාගම වෙනුවෙන් ජාතික ලොතරැයි මණ්ඩලය විසින් එයාර්පෝට් සුපර්ඩ්‍රෝ ලොතරැයිය පවත්වයි. ශුද්ධ ආදායම ඒකාබද්ධ අරමුදල හරහා ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා සමාගම වෙත කරනු ලැබේ.

(ආ) ක්ෂණික ලොතරැයිවලට අදාල අරමුදල් බෙදා හැරීම.

| | සමෘද්ධි 10/- | සෙවණ 10/- | සෙවණ 20/- | විශේෂ ක්ෂණික 50/- | විශේෂ ක්ෂණික 20/- |
|---|---|---|---|---|---|
| ත්‍යාග | 49% | 47% | 53% | 53% | 53% |
| නියෝජිත කොමිස් | 15% | 15% | 17.5% | 17.5% | 17.5% |
| ඒකාබද්ධ අරමුදල | 10% | 10% | 10% | 10% | 10% |
| මණ්ඩලීය වියදම් | 26% | 26% | 19.5% | 19.5% | 19.5% |

(ඇ) ඒකාබද්ධ අරමුදලට දායකත්වය හා ඒකාබද්ධ අරමුදල හරහා අමාත්‍යාංශවලට දක්වන දායකත්වය පහත දක්වා ඇත.

**දිනුම් අදින ලොතරැයි**

| | | | |
|---|---|---|---|
| මහජන සම්පත | - ඉරිදා, අඟහරුවාදා, සිකුරාදා | - 16.5% | - ඒකාබද්ධ අරමුදල |
| වාසනා සම්පත | - සදුදා, බ්‍රහස්පතින්දා | - 16.5% | - ඒකාබද්ධ අරමුදල |
| ගොවිසෙත | - සදුදා, බ්‍රහස්පතින්දා | - 10% | - කෘෂිකර්ම අමාත්‍යාංශය |
| සුපිරි වාසනා | - බදාදා | - 10% | - රණවිරු සේවා අධිකාරිය |
| | - සෙනසුරාදා | - 10% | - ක්‍රීඩා හා සමාජ සේවා අමාත්‍යාංශය |
| ජාතික සම්පත | - බදාදා | - 10% | - සෞඛ්‍ය අමාත්‍යාංශය |
| | - සෙනසුරාදා | - 10% | - කම්කරු අමාත්‍යාංශය |
| සම්පත් රේඛා | - ඉරිදා, අඟහරුවාදා, සිකුරාදා | - 10% | - ඒකාබද්ධ අරමුදල |
| මෙගා 50 | - කළමණාකරණය තීරණය කරයි | - 10% | - ඒකාබද්ධ අරමුදල |
| පවර් ලොටෝ | - සෙනසුරාදා | - 10% | - ඒකාබද්ධ අරමුදල |

**ක්ෂණික ලොතරැයි**

| | | |
|---|---|---|
| සමෘද්ධි | - 10% | - සමෘද්ධි හා යෞවන කටයුතු අමාත්‍යාංශය |
| සෙවණ | - 10% | - නිවාස අමාත්‍යාංශය |
| විශේෂ ක්ෂණික | - 5% | - ඒකාබද්ධ අරමුදල |

(ඈ) ආදායම් බදු ප්‍රකාශයෙහි ඒකාබද්ධ අරමුදල දැක්වීම

2011 වසර දක්වා ඒකාබද්ධ අරමුදල දක්වන ලද්දේ ආදායම් ප්‍රකාශය යටතේ සෘජු වියදමක් ලෙසිනි. කෙසේවෙතත් 2012 වසරේදී ඒකාබද්ධ අරමුදල ආදායම් බදු ගණනයේදී අනුදත් නොවූ වියදමක් ලෙස සැලකූ බැවින් 2012 වසරේදී එය ස්කන්ධ ප්‍රාග්ධන වෙනස්වීම් ප්‍රකාශය යටතේ දක්වන ලදී.

2013 ජනවාරි සිට මෙය නැවතත් 2012 වසරවලට පෙර වර්ෂවල කළ පරිදි ආදායම් ප්‍රකාශයෙහි සෘජු වියදමක් ලෙස පෙන්වා ඇත. දත්ත සන්සන්දනය සඳහා 2012 වසරට අදාල සංඛ්‍යා ද ප්‍රතිගණනය කර දක්වා ඇත.

# සටහන්

| සටහන් අංක 02<br>ආදායම | 2014<br>රු. | 2013<br>රු. |
|---|---|---|
| මහජන සම්පත | 4,330,554,920 | 4,399,835,800 |
| වාසනා සම්පත | 1,410,087,400 | 1,489,470,800 |
| ගොවිසෙත | 2,552,142,200 | 1,962,201,080 |
| සුපිරි වාසනා සම්පත | 1,834,803,800 | 1,942,297,000 |
| ජාතික සම්පත | 1,248,200,400 | 1,248,899,000 |
| සම්පත් රේඛා | 1,692,250,600 | 1,448,766,800 |
| මෙගා 50 | 124,573,600 | 515,404,600 |
| පවර් ලොටෝ | 243,402,900 | - |
| කලම්බු එයාර්පෝට් සුපර්ඩ්‍රෝ | - | 38,483,465 |
| සමෘද්ධි | 188,128,000 | 132,024,000 |
| සෙවණ | 1,489,596,000 | 1,269,374,000 |
| විශේෂ ක්ෂණික | 39,394,000 | 90,606,000 |
| එකතුව | **15,153,133,820** | **14,537,362,545** |

| සටහන් අංක 03<br>විකුණුම් පිරිවැය | 2014<br>රු. | 2013<br>රු. |
|---|---|---|
| ටිකට්පත් මුද්‍රණ ගාස්තු | 474,762,687 | 459,877,814 |
| නියෝජිත කොමිස් | 2,818,333,219 | 2,701,581,629 |
| ත්‍යාග වෙන් කිරීම් | 7,311,136,590 | 7,083,652,537 |
| ඒකාබද්ධ අරමුදලට දායකත්වය | 1,888,455,133 | 1,753,135,197 |
| එකතුව | **12,492,687,628** | **11,998,247,176** |

| සටහන් අංක 03-1<br>ටිකට්පත් මුද්‍රණ ගාස්තු | 2014<br>රු. | 2013<br>රු. |
|---|---|---|
| ආරම්භක ශේෂය - ජනවාරි 01 දිනට | | |
| දිනුම් අදින ලොතරැයි | 1,857,486 | 3,865,641 |
| සෙවණ ලොතරැයිය | 23,395,443 | 11,873,897 |
| සමෘද්ධි ලොතරැයිය | 3,284,900 | 1,361,468 |
| විශේෂ ක්ෂණික ලොතරැයිය | 1,369,921 | - |
| | 29,907,750 | 17,101,006 |
| එකතු කළා වර්ෂය : තුළ ටිකට්පත මිලදී ගැනීම් | 463,083,284 | 472,684,558 |
| | **492,991,034** | **489,785,564** |
| අඩු කළා දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය | | |
| දිනුම් අදින ලොතරැයි | 2,697,275 | 1,857,486 |
| සෙවණ ලොතරැයිය | 12,183,469 | 23,395,443 |
| සමෘද්ධි ලොතරැයිය | 3,347,602 | 3,284,900 |
| විශේෂ ක්ෂණික ලොතරැයිය | - | 1,369,921 |
| | 18,228,346 | 29,907,750 |
| එකතුව | **474,762,687** | **459,877,814** |

| සටහන් අංක 03-02<br>නියෝජිත කොමිස් | 2014<br>රු. | 2013<br>රු. |
|---|---|---|
| මහජන සම්පත | 809,128,844 | 824,628,923 |
| වාසනා සම්පත | 263,487,270 | 279,112,865 |
| ගොවිසෙත | 476,994,838 | 367,715,777 |
| සුපිරි වාසනා සම්පත | 342,791,282 | 703,915,828 |
| ජාතික සම්පත | 233,214,577 | 234,034,947 |
| සම්පත් රේඛා | 316,212,112 | 271,530,677 |
| මෙගා 50 | 23,343,601 | 96,466,905 |
| පවර් ලොටෝ | 45,495,203 | - |
| සමෘද්ධි | 32,659,924 | 20,859,792 |
| සෙවණ | 267,796,468 | 226,636,992 |
| විශේෂ ක්ෂණික | 7,209,102 | 16,580,898 |
| එකතුව | **2,818,333,222** | **2,701,581,629** |

| සටහන් අංක 03-03<br>ත්‍යාග වෙන් කිරීම් | 2014<br>රු. | 2013<br>රු. |
|---|---|---|
| මහජන සම්පත | 2,121,971,911 | 2,156,116,095 |
| වාසනා සම්පත | 663,741,078 | 699,151,016 |
| ගොවිසෙත | 1,199,509,834 | 922,352,768 |
| සුපිරි වාසනා සම්පත | 862,357,786 | 913,001,330 |
| ජාතික සම්පත | 586,596,678 | 585,988,824 |
| සම්පත් රේඛා | 795,358,042 | 724,656,826 |
| මෙගා 50 | 65,202,689 | 298,934,668 |
| පවර් ලොටෝ | 116,833,392 | - |
| කලම්බු එයාර්පෝට් සුපර්ඩ්‍රෝ | - | 7,334,050 |
| සමෘද්ධි | 96,879,840 | 64,691,760 |
| සෙවණ | 781,806,520 | 663,404,020 |
| විශේෂ ක්ෂණික | 20,878,820 | 48,021,180 |
| එකතුව | **7,311,136,590** | **7,083,652,537** |

| සටහන් අංක 03-04<br>ඒකාබද්ධ අරමුදලට ගෙවීම් | 2014<br>රු. | 2013<br>රු. |
|---|---|---|
| මහජන සම්පත | 714,541,562 | 725,972,907 |
| වාසනා සම්පත | 232,664,421 | 245,762,682 |
| ගොවිසෙත | 255,214,220 | 196,220,108 |
| සුපිරි වාසනා සම්පත | 183,480,380 | 194,229,700 |
| ජාතික සම්පත | 124,820,040 | 124,889,900 |
| සම්පත් රේඛා | 169,225,060 | 72,438,340 |
| මෙගා 50 | 12,457,360 | 51,540,460 |
| පවර් ලොටෝ | 24,340,290 | - |
| සමෘද්ධි | 18,812,800 | 13,202,400 |
| සෙවණ | 148,959,600 | 124,348,400 |
| විශේෂ ක්ෂණික | 3,939,400 | 4,530,300 |
| එකතුව | **1,888,455,133** | **1,753,135,197** |

| සටහන් අංක 04<br>වෙනත් ආදායම් | 2014<br>රු. | 2013<br>රු. |
|---|---:|---:|
| පොලී ආදායම | 83,751,232 | 211,592,849 |
| වෙනත් ආදායම් | 5,072,005 | 8,616,734 |
| එකතුව | **88,823,237** | **220,209,583** |

| සටහන් අංක 05<br>විකුණුම් අලෙවි හා බෙදාහැරීම් පිරිවැය | 2014<br>රු. | 2013<br>රු. |
|---|---:|---:|
| බෙදාහැරීම් පිරිවැය | 30,143,102 | 24,635,220 |
| විකුණුම් අලෙවි හා බෙදාහැරීම් පිරිවැය | 1,209,168,822 | 1,010,422,751 |
| සන්නිවේදන වියදම් | 45,287,379 | 33,942,384 |
| එකතුව | **1,284,599,303** | **1,069,000,355** |

| සටහන් අංක 05-1<br>බෙදාහැරීම් පිරිවැය | 2014<br>රු. | 2013<br>රු. |
|---|---:|---:|
| ටිකට්පත් ප්‍රවාහන වියදම් | 6,314,079 | 5,425,175 |
| නියෝජිත සහන හා ආපසු භාරදෙන ටිකට්පත්වල වටිනාකම | 91,642 | 542,982 |
| නියෝජිත සහ අලෙවි සහායක සුභසාධන කටයුතු | 58,000 | - |
| දි නියෝජිත හා අලෙවි නියෝජිත පුහුණු වියදම් | 4,244,349 | 3,854,498 |
| නියෝජිතයින්ගේ දරුවන් සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය | 1,247,500 | 1,317,500 |
| දි නියෝජිත හා අලෙවි නියෝජිතයින් සඳහා අලෙවි ප්‍රවර්ධන දීමනා | 7,006,704 | 9,587,403 |
| නියෝජිත වෛද්‍ය වියදම් | 2,096,000 | 1,845,000 |
| නියෝජිත අතිරේක අලෙවි ප්‍රවර්ධන | 9,084,829 | 2,062,662 |
| එකතුව | **30,143,103** | **24,635,220** |

| සටහන් අංක 05-2<br>අලෙවි හා විකුණුම් ප්‍රවර්ධන වියදම් | 2014<br>රු. | 2013<br>රු. |
|---|---:|---:|
| නිෂ්පාදන හා විකාශන ගාස්තු | 216,426,714 | 204,989,536 |
| ප්‍රතිඵල ප්‍රචාරණය | 36,688,896 | 34,248,305 |
| ප්‍රවර්ධන ප්‍රචාරණය | 321,786,376 | 312,412,135 |
| ප්‍රතිරූප ප්‍රවර්ධන ප්‍රචාරණය | 436,045,058 | 220,545,923 |
| පිටපළාත්වල කෙරෙන දිනුම් ඇදීම් වියදම් | 114,726,865 | 10,921,200 |
| 50 වන සංවත්සර ලොතරැයි - මූලික වියදම් | - | 176,991,500 |
| නියෝජිතයින්ට අලෙවි කුටි හා වෙනත් නඩත්තු වියදම් | 8,026,111 | 12,930,253 |
| විශේෂ වැඩසටහන් හා විශේෂ ලොතරැයි දිනුම් ඇදීම් ත්‍යාග | 8,560,824 | 3,968,919 |
| මහජන සම්බන්ධතා වියදම් | 66,907,977 | 33,414,980 |
| | **1,209,168,821** | **1,010,422,751** |

| සටහන් අංක 5-3<br>සන්නිවේදන වියදම් | 2014<br>රු. | 2013<br>රු. |
|---|---:|---:|
| තැපැල් හා විදුලි | 693,850 | 337,330 |
| දුරකථන, ෆැක්ස් හා අන්තර්ජාල | 22,649,296 | 19,018,940 |
| මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය | 20,670,959 | 13,794,964 |
| පුවත්පත් දැන්වීම් | 1,273,275 | 791,150 |
| එකතුව | **45,287,380** | **33,942,384** |

| **සටහන් අංක 06**<br>**පරිපාලන වියදම්** | **2014**<br>**රු** | **2013**<br>**රු.** |
|---|---|---|
| සේවක වියදම් | 267,215,394 | 247,527,709 |
| ආයතනික වියදම් | 138,286,479 | 74,491,059 |
| වෙනත් පරිපාලන වියදම් | 167,970,966 | 143,095,344 |
| එකතුව | **573,472,839** | **465,114,112** |

| **සටහන් අංක 07**<br>මූල්‍ය පිරිවැය | **2014**<br>**රු.** | **2013**<br>**රු.** |
|---|---|---|
| බැංකු ගාස්තු | 29,743,395 | 28,340,454 |
| මූල්‍යමය නොවන ත්‍යාග සඳහා රදවාගත් බදු | - | 8,850,393 |
| එකතුව | **29,743,395** | **37,190,847** |

| **සටහන් අංක 08** | **2014**<br>**රු.** | **2013**<br>**රු.** |
|---|---|---|
| වර්තමාන ආදායම් බදු | 72,007,450 | 292,294,911 |
| ලාභාංශ මත බදු -2012 | 9,295,615 | 314,081,591 |
| වර්තමාන වසරේ මුළු ආදායම් බදු | 81,303,065 | 606,376,502 |
| විලම්භිත බදු | 36,550,431 | 3,711,448 |
| එකතුව | **117,853,496** | **610,087,950** |

# සටහන් අංක - 09 - දේපල යන්ත්‍ර හා උපකරණ

## සටහන් අංක - 09 -1 - සින්නක්කර දේපල

| | ඉඩම් රු. | ගොඩනැගිලි රු. | මෝටර් රථ රු. | පරිගණක හා උපාංග රු. | පරිගණක හා මෘදුකාංග රු. | කාර්යාලීය උපකරණ රු. | දිනුම් අදින යන්ත්‍ර රු. | ලිබඩු හා සවිකිරීම් රු. | 2014 එකතුව රු. | 2013 එකතුව රු. |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| පිරිවැය | | | | | | | | | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | 500,000,000 | 9,900,000 | 181,841,164 | 93,632,733 | 30,357,519 | 31,794,459 | 11,696,063 | 16,256,068 | 875,478,007 | 706,521,870 |
| වර්ෂය තුල එකතුකිරීම් | - | 12,240,000 | 60,906,529 | 36,061,377 | 3,325,120 | 12,416,263 | 1,315,800 | 2,293,249 | 128,558,337 | 20,314,913 |
| වර්ෂය තුල විකුණුම් | - | - | (3,152,000) | (91,440) | - | (35,563) | - | (13,391) | (3,292,394) | (10,051,448) |
| වර්ෂය තුල මාරු කිරීම් | - | - | - | (27,549,526) | (12,755,024) | (2,500) | - | 2,500 | (40,304,550) | - |
| | 500,000,000 | 22,140,000 | 239,595,693 | 102,053,144 | 20,927,615 | 44,172,659 | 13,011,863 | 18,538,426 | 960,439,400 | 716,785,335 |
| සමුච්චිත ක්ෂය - නැවත ප්‍රත්‍යාගණනය | - | - | (87,615,737) | (1,432,867) | - | (749,471) | - | (477,958) | (90,276,033) | (89,395,319) |
| ප්‍රත්‍යාගණන ලාභ | - | - | 48,750,161 | 733,434 | - | (5,433) | - | (14,380) | 49,463,782 | 248,087,991 |
| **වර්ෂය අවසානයේ ශේෂය** | 500,000,000 | 22,140,000 | 200,730,118 | 101,353,710 | 20,927,615 | 43,417,754 | 13,011,863 | 18,046,087 | 919,627,149 | 875,478,007 |
| **ක්ෂය සඳහා ප්‍රතිපාදන** | | | | | | | | | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | - | - | 133,764,689 | 42,271,818 | 15,915,075 | 12,773,516 | 162,021 | 2,533,799 | 207,420,918 | 263,095,949 |
| වර්ෂය සඳහා ක්ෂය ප්‍රතිපාදන | - | 648,000 | 33,000,569 | 15,010,300 | 1,209,855 | 5,251,961 | 2,443,268 | 1,527,239 | 59,091,192 | 43,278,420 |
| විකුණුම් සඳහා ක්ෂය ප්‍රතිපාදන | - | - | (3,152,000) | (57,026) | - | (35,563) | - | (574) | (3,245,163) | (9,558,131) |
| වර්ෂය තුල මාරු කිරීම් | - | - | - | (14,874,593) | (973,700) | - | - | - | (15,848,293) | - |
| | - | 648,000 | 163,613,258 | 42,350,499 | 16,151,230 | 17,989,914 | 2,605,289 | 4,060,464 | 247,418,654 | 296,816,238 |
| සමුච්චිත ක්ෂය - නැවත ප්‍රත්‍යාගණනය | - | - | (87,615,737) | (1,346,065) | - | (749,471) | - | (477,958) | (90,189,231) | (89,395,319) |
| **වර්ෂය අවසානයේ ශේෂය** | - | 648,000 | 75,997,521 | 41,004,434 | 16,151,230 | 17,240,443 | 2,605,289 | 3,582,506 | 157,229,423 | 207,420,919 |
| **2014.12.31 දිනට ලියා හැරි අගය** | 500,000,000 | 21,492,000 | 124,732,598 | 60,349,276 | 4,776,385 | 26,177,311 | 10,406,574 | 14,463,582 | 762,397,726 | - |
| **2013.12.31 දිනට ලියා හැරි අගය** | 500,000,000 | 9,900,000 | 48,076,476 | 65,803,359 | - | 19,020,942 | 11,534,042 | 13,722,269 | - | 668,057,088 |
| ක්ෂය අනුපාත | - | 5% | 25% | 25% | 25% | 20% | 20% | 10% | | |

ඉඩම් -වොක්ෂෝල් ඉඩම
ගොඩනැගිලි - නාරාහේන්පිට සභාපති බංගලාව හා වෝක්ෂෝල් ගොඩනැගිල්ල

## සටහන් 09 - 2 - කුළී සින්නක්කර දේපල

| ගොඩනැගිලි | 2014<br>රු | 2015<br>රු |
|---|---|---|
| පිරිවැය | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | 71,693,168 | 3,759,162 |
| වර්ෂය තුල එකතු කිරීම් | - | 55,663,168 |
| ආයෝජන දේපලවලට මාරු කිරීම් | (71,693,168) | - |
| | - | 59,422,330 |
| සමුච්චිත ක්ෂය - නැවත ප්‍රත්‍යාගණනය | - | (3,282,096) |
| ප්‍රත්‍යාගණන ලාභ | - | 15,552,933 |
| **වර්ෂය අවසානයේ ශේෂය** | - | 71,693,168 |
| | | |
| **ක්ෂය සඳහා ප්‍රතිපාදන** | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | 463,424 | 3,123,149 |
| ආයෝජන දේපලවලට මාරු කිරීම් | (463,424) | - |
| වර්ෂය සඳහා ක්ෂය ප්‍රතිපාදන | - | 622,371 |
| | - | 3,745,520 |
| සමුච්චිත ක්ෂය - නැවත ප්‍රත්‍යාගණනය | - | (3,282,096) |
| **වර්ෂය අවසානයේ ශේෂය** | - | 463,424 |
| | | |
| **2014.12.31 දිනට ලියා හැරි අගය** | - | - |
| | | |
| **2013.12.31 දිනට ලියා හැරි අගය** | - | 71,229,744 |

| | 2014<br>රු | 2013<br>රු |
|---|---|---|
| මුළු එකතුව (09-1 + 09-2) | **762,397,726** | **739,286,832** |

**සටහන් අංක 10 - ආයෝජන දේපල**

**සංචාරක බංගලා - අනුරාධපුර සහ මන්නාරම**

| කුලි සින්නක්කර ගොඩනැගිලි | 2014 Rs. | 2013 Rs. |
|---|---|---|
| **පිරිවැය** | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | - | - |
| වර්ෂය තුල එකතුකිරීම් | 6,596,984 | - |
| වර්ෂය තුල මාරු කිරීම් | 71,693,168 | - |
| | 78,290,152 | - |
| සමුච්චිත ක්ෂය - නැවත ප්‍රත්‍යාගණනය | (463,424) | - |
| නැවත ප්‍රත්‍යාගණනයේ පාඩු - මන්නාරම සංචාරක බංගලාව | (27,296,728) | - |
| **වර්ෂය අවසානයේ ශේෂය** | **50,530,000** | - |
| **ක්ෂය සඳහා ප්‍රතිපාදන** | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | - | - |
| වර්ෂය සඳහා ක්‍රම ක්ෂය | 6,532,989 | - |
| වර්ෂය තුල මාරු කිරීම් | 463,424 | - |
| | 6,996,413 | - |
| සමුච්චිත ක්ෂය - නැවත ප්‍රත්‍යාගණනය | (463,424) | - |
| **වර්ෂය අවසානයේ ශේෂය** | **6,532,989** | - |
| **2014.12.31 දිනට ලියා හැරි අගය** | **43,997,011** | - |
| **2013.12.31 දිනට ලියා හැරි අගය** | - | - |

**සටහන් අංක 11 -**

**අස්පෘෂ්‍ය වත්කම්**

| පරිගණක මෘදුකාංග | 2014 Rs. | 2013 Rs. |
|---|---|---|
| **පිරිවැය** | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | - | - |
| වර්ෂය තුල එකතුකිරීම් | 21,820,000 | - |
| වර්ෂය තුල මාරු කිරීම් | 40,304,550 | - |
| | 62,124,550 | - |
| සමුච්චිත ක්ෂය - නැවත ප්‍රත්‍යාගණනය | - | - |
| ප්‍රත්‍යාගණන ලාභ | - | - |
| **වර්ෂය අවසානයේ ශේෂය** | **62,124,550** | - |
| **ක්ෂය සඳහා ප්‍රතිපාදන** | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | - | - |
| වර්ෂය සඳහා ක්‍රම ක්ෂය | 12,649,804 | - |
| වර්ෂය තුල මාරු කිරීම් | 15,761,491 | - |
| | 28,411,295 | - |
| සමුච්චිත ක්ෂය - නැවත ප්‍රත්‍යාගණනය | - | - |
| **වර්ෂය අවසානයේ ශේෂය** | **28,411,295** | - |
| **2014.12.31 දිනට ලියා හැරි අගය** | **33,713,255** | - |
| **2013.12.31 දිනට ලියා හැරි අගය** | - | - |

| සටහන් අංක 12<br>තොග | 2014<br>රු. | 2013<br>රු. |
|---|---|---|
| මුද්‍රිත ටිකට්පත් තොග | 18,228,347 | 29,907,750 |
| ත්‍යාග තොග | 125,337,068 | 107,934,989 |
| පාරිභෝජිත තොග | 7,430,663 | 11,294,923 |
| එකතුව | **150,996,078** | **149,137,662** |

| සටහන් අංක 13<br>වෙළඳ ලැබිය යුතු | 2014<br>රු. | 2013<br>රු. |
|---|---|---|
| ටිකට්පත්/ වෙළඳ ණයගැතියෝ | 379,671,475 | 251,778,646 |
| අගරු චෙක්පත් - සෙවණ, සමෘද්ධි | 1,403,097 | 714,297 |
| | 381,074,572 | 252,492,944 |
| අඩුකළා/ අඩමාණ ණය සඳහා ප්‍රතිපාදන | (10,814,029) | (10,814,029) |
| එකතුව | **370,260,544** | **241,678,915** |

| සටහන් අංක 14<br>වෙනත් ජංගම වත්කම් | 2014<br>රු. | 2013<br>රු. |
|---|---|---|
| වෙනත් ණයගැතියෝ | 49,982,675 | 22,268,264 |
| ලැබිය යුතු ගිණුම් | 5,823,737 | 9,050,071 |
| සේවක ණය | 101,708,309 | 95,424,888 |
| තැන්පතු හා පෙර ගෙවුම් | 16,934,409 | 23,879,485 |
| ඒකාබද්ධ අරමුදලින් ලැබිය යුතු ආදායම් බදු | 567,183,453 | 551,421,101 |
| එකතුව | **741,632,583** | **702,043,809** |

| සටහන් අංක 15<br>මුදල් හා මුදලට සමාන දෑ | 2014<br>රු. | 2013<br>රු. |
|---|---|---|
| අතැති මුදල් හා බැංකු | 411,990,175 | 499,968,366 |
| කෙටිකාලීන තැන්පතු | 990,787,939 | 1,589,431,447 |
| එකතුව | **1,402,778,114** | **2,089,399,813** |

| සටහන් අංක 16<br>රඳවාගත් ලාභ | 2014<br>රු. | 2013<br>රු. |
|---|---|---|
| වර්ෂය ආරම්භයේ ශේෂය | 435,775,888 | 531,283,063 |
| වර්ෂයට අදාල ලාභ පාඩු | (8,663,584) | (133,406,928) |
| | 427,112,304 | 397,876,135 |
| අඩුකළා:මහාභාණ්ඩාගාරයට කරන ලද විශේෂ ප්‍රතිපාදන | - | (500,000,000) |
| එකතු කළා:ගොඩනැගිලි සංචිතයෙන් මාරු කිරීම් | - | 365,000,000 |
| එකතු කළා:ගොඩනැගිලි සංචිතයෙන් මාරු කිරීම් - වොක්ෂෝල් ඉඩම | - | 187,042,734 |
| එකතු කළා:පාරිතෝෂික සඳහා කරන ලද අතිරික්ත ප්‍රතිපාදන | - | 12,385,733 |
| එකතු කළා:ගුවන්තොටුපල ලොතරැයියේ ලැබිය යුතු තිරුබදු ලියාහැරීම් | - | (26,774,238) |
| එකතු කළා:විනිමය විචලනයේ ප්‍රතිලාභ | 6,334,089 | 245,524 |
| වර්ෂය අවසානයේ ශේෂය | **433,446,392** | **435,775,888** |

| සටහන් අංක 17<br>ස්කන්ධ ප්‍රාග්ධනය සඳහා අනිකුත් සංරචක | 2014<br>රු. | 2013<br>රු. |
|---|---|---|
| සමුච්චිත භාරකාර අරමුදල | 21,263,101 | 21,263,101 |
| ප්‍රත්‍යාගණන සංචිත | 287,151,501 | 264,984,446 |
| ගොඩනැගිලි සංචිත | - | - |
| ත්‍යාග සංචිත | 335,229,369 | 603,851,440 |
| එකතුව | **643,643,970** | **890,098,987** |

| සටහන් අංක 18<br>විලම්භිත බදු වගකීම් | 2014<br>රු. | 2013<br>රු. |
|---|---|---|
| වර්ෂය ආරම්භයේ ශේෂය | 10,319,839 | 6,608,391 |
| සමාලෝචිත වසරේ විලම්භිත බදු ප්‍රතිපාදන | 36,550,431 | 3,711,448 |
| පෙර වසරේ කරන ලද අතිරික්ත ප්‍රතිපාදන | - | - |
| වර්ෂය අවසානයේ ශේෂය | **46,870,270** | **10,319,839** |

| සටහන් අංක 19<br>දිගුකාලීන ප්‍රතිපාදන | 2014<br>රු. | 2013<br>රු. |
|---|---|---|
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | 28,540,492 | 25,184,305 |
| ඒකාබද්ධ අරමුදලට ගෙවිය යුතු ආදායම් බදු | 1,215,320,896 | 1,736,370,634 |
| එකතුව | **1,243,861,388** | **1,761,554,939** |

| සටහන් අංක 20<br>වෙළඳ හා වෙනත් ගෙවිය යුතු | 2014<br>රු. | 2013<br>රු. |
|---|---|---|
| ඒකාබද්ධ අරමුදලට ගෙවිය යුතු මුදල් | 171,237,556 | 188,393,449 |
| ලොතරැයි මුදල් අත්තිකාරම් | 287,666,170 | 111,153,236 |
| විලම්භිත අයභාර වියදම් (ක. එ. සු) | 18,488,970 | - |
| ත්‍යාග සංචිතයට ගෙවිය යුතු ණය | 325,000,000 | - |
| ත්‍යාග සඳහා ගෙවීම් | 759,376,073 | 963,436,220 |
| වෙළඳ හා වෙනත් ණය හිමියෝ | 98,870,282 | 108,554,145 |
| උපචිත වියදම් | 313,520,345 | 400,161,079 |
| එකතුව | **1,974,159,396** | **1,771,698,129** |

| සටහන් අංක 21<br>සමාලෝචිත වසරේ ගෙවිය යුතු බදු | 2014<br>රු. | 2013<br>රු. |
|---|---|---|
| ගෙවිය යුතු එ ව බදු හා ජා ගො බදු | 46,030,076 | 72,521,485 |
| ගෙවිය යුතු ආදායම් බදු | 338,421,292 | 721,284,975 |
| එකතුව | **384,451,368** | **793,806,460** |




# 4 මෙහෙයුම් හා මූල්‍ය සමාලෝචනය


# මූල්‍යමය ප්‍රමුඛතාවන්


දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා


| විස්තරය | 2014 රු.මිලි | 2013 රු.මිලි | වෙනස 2013 වසර සමග සන්සන්දනය (%) |
|---|---|---|---|
| පිරිවැටුම | 15,153.1 | 14,537.3 | 4.2 |
| ඒකාබද්ධ අරමුදලට දායකත්වය | 1,888.4 | 1,753.1 | 7.7 |
| නියෝජිත කොමිස් | 2,818.3 | 2,701.5 | 4.3 |
| ත්‍යාග සඳහා වෙන් කිරීම් | 7,311.1 | 7,083.6 | 3.2 |
| එකතු කළ වටිනාකම් මත බදු | 540.5 | 507.7 | 6.4 |
| ජාතිය ගොඩනැඟීමේ බදු | 211.7 | 203.5 | 4.0 |
| වෙනත් ආදායම් | 88.8 | 220.2 | (59.6) |
| වියදම් | 1,887.8 | 1,571.3 | 20.1 |
| බදු පෙර ලාභ | 109.1 | 476.6 | (77.1) |
| වර්ෂය සඳහා ලාභ | (8.6) | (133.4) | (93.5) |
| මුළු වත්කම් | 4,726.4 | 5,663.2 | (16.5) |
| මුළු ශුද්ධ වත්කම් | 1,077.0 | 1,325.8 | (18.7) |
| බදු පෙර ලාභ පිරිවැටුමේ % ලෙස | 0.72% | 3.27% | - |
| බදු පෙර ලාභ මුළු වත්කම් වල % ලෙස | 2.31% | 8.41% | - |
| ද්‍රවශීලතා අනුපාතය | 1.1:1 | 1.2:1 | - |


2013 වසරේ ගෙවන ලද රු. මිලියන 500 විශේෂ දායකත්වය හැර

# සමස්ත කාර්යසාධනය
















# මහජන සම්පත

| විස්තරය | 2014<br>රු. මිලි | 2013<br>රු. මිලි | 2012<br>රු. මිලි |
|---|---:|---:|---:|
| පිරිවැටුම | 4,330.5 | 4,399.8 | 4,699.5 |
| ත්‍යාග සඳහා වෙන් කිරීම් | 2,121.9 | 2,156.1 | 2,302.7 |
| නියෝජිත කොමිස් | 809 | 824.5 | 881.0 |
| ඒකාබද්ධ අරමුදලට දායකත්වය | 7,14.5 | 725.9 | 775.4 |

















# වාසනා සම්පත

| විස්තරය | 2014<br>රු. මිලි | 2013<br>රු. මිලි | 2012<br>රු. මිලි |
|---|---:|---:|---:|
| පිරිවැටුම | 1,410.0 | 1,489.4 | 1,342.4 |
| ත්‍යාග සඳහා වෙන් කිරීම් | 663.7 | 699.1 | 630.9 |
| නියෝජිත කොමිස් | 263.4 | 279.0 | 251.6 |
| ඒකාබද්ධ අරමුදලට දායකත්වය | 232.6 | 245.7 | 221.5 |
















# ගොවිසෙත

| විස්තරය | වසර 2014 රු. මිලි | වසර 2013 රු. මිලි | වසර 2012 රු. මිලි |
|---|---|---|---|
| පිරිවැටුම | 2,552.1 | 1,962.2 | 1,622.1 |
| ත්‍යාග සඳහා වෙන් කිරීම් | 1,199.5 | 922.3 | 762.4 |
| නියෝජිත කොමිස් | 476.9 | 367.6 | 304.1 |
| ඒකාබද්ධ අරමුදලට දායකත්වය | 255.2 | 196.2 | 162.2 |
















# සුපිරි වාසනා සම්පත

| විස්තරය | 2014 රු. මිලි | 2013 රු. මිලි | 2012 රු. මිලි |
|---|---|---|---|
| පිරිවැටුම | 1,834.8 | 1,942.2 | 2,024.2 |
| ත්‍යාග සඳහා වෙන් කිරීම් | 862.3 | 913.0 | 951.3 |
| නියෝජිත කොමිස් | 342.7 | 364.0 | 379.4 |
| ඒකාබද්ධ අරමුදලට දායකත්වය | 183.4 | 194.2 | 202.4 |

















# ජාතික සම්පත

| විස්තරය | 2014 රු. මිලි | 2013 රු. මිලි | 2012 රු. මිලි |
|---|---|---|---|
| පිරිවැටුම | 1,248.2 | 1,248.8 | 1,023.5 |
| ත්‍යාග සඳහා වෙන් කිරීම් | 586.5 | 585.9 | 481.0 |
| නියෝජිත කොමිස් | 233.1 | 233.9 | 191.8 |
| ඒකාබද්ධ අරමුදලට දායකත්වය | 124.8 | 124.8 | 102.3 |
















# සෙවණ

| විස්තරය | 2014 රු. මිලි | 2013 රු. මිලි | 2012 රු. මිලි |
|---|---|---|---|
| පිරිවැටුම | 1,489.5 | 1,269.3 | 956.3 |
| ත්‍යාග සඳහා වෙන් කිරීම් | 781.8 | 663.4 | 496.2 |
| නියෝජිත කොමිස් | 267.7 | 226.5 | 168.5 |
| ඒකාබද්ධ අරමුදලට දායකත්වය | 148.9 | 124.3 | 93.2 |



# දස වසරක මෙහෙයුම් සමාලෝචනය

සංඛ්‍යා රුපියල් වලින්

| | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| **ආදායම** | **6,166,897,652** | **6,460,015,752** | **6,079,850,149** | **6,832,519,239** | **8,580,538,712** | **8,862,869,826** | **10,092,330,623** | **12,004,268,616** | **14,537,362,545** | **15,153,133,820** |
| අඩු කළා වක්‍ර බදු | | | | | | | | | | |
| එ .ව. මත බදු | 290,868,023 | 300,652,152 | 280,749,153 | 298,114,596 | 317,545,635 | 315,515,516 | 365,159,981 | 428,810,159 | 507,792,059 | 540,502,194 |
| ජා. ගො. බදු | - | - | - | - | 139,681,053 | 186,375,756 | 141,767,911 | 168,895,230 | 203,546,556 | 211,761,787 |
| **ශුද්ධ පිරිවැටුම එ ව බදු හා ජා ගො බදු** | 5,876,029,629 | 6,159,363,600 | 5,799,100,996 | 6,534,404,643 | 8,123,312,024 | 8,360,978,554 | 9,585,402,731 | 11,406,563,227 | 13,826,023,930 | 14,400,869,839 |
| අඩුකළා : විකුණුම් පිරිවැය | | | | | | | | | | |
| ටිකට්පත් මුද්‍රණ ගාස්තු | 404,809,076 | 394,484,461 | 315,362,150 | 289,619,018 | 271,803,581 | 293,504,383 | 376,528,826 | 393,049,086 | 459,877,814 | 474,762,687 |
| නියෝජිත කොමිස් | 968,319,771 | 1,025,881,243 | 971,932,383 | 1,163,307,511 | 1,585,329,388 | 1,638,501,705 | 1,874,354,373 | 2,232,580,487 | 2,701,581,629 | 2,818,333,219 |
| ත්‍යාග සඳහා වෙන් කිරීම් | 2,952,266,317 | 3,115,594,961 | 2,944,926,273 | 3,373,592,920 | 4,246,564,845 | 4,295,786,207 | 4,857,951,333 | 5,787,269,625 | 7,083,652,537 | 7,311,136,590 |
| විකුණුම් මත ඒකාබද්ධ අරමුදලට දායකත්වය | 957,406,531 | 845,908,023 | 767,590,790 | 898,282,571 | 1,136,298,465 | 1,173,460,051 | 1,345,046,907 | 1,574,149,137 | 1,753,135,197 | 1,888,455,133 |
| | 5,282,801,695 | 5,381,868,688 | 4,999,811,596 | 5,724,802,020 | 7,239,996,279 | 7,401,252,346 | 8,453,881,439 | 9,987,048,335 | 11,998,247,177 | 12,492,687,629 |
| **දළ ලාභය** | **593,227,934** | **777,494,912** | **799,289,400** | **809,602,623** | **883,315,745** | **959,726,208** | **1,131,521,292** | **1,419,514,892** | **1,827,776,753** | **1,908,182,210** |
| එකතු කළා : වෙනත් ආදායම් | 114,548,796 | 136,114,584 | 191,205,560 | 257,996,742 | 340,680,571 | 212,424,233 | 178,866,137 | 275,197,318 | 220,209,583 | 88,823,238 |
| | 707,776,730 | 913,609,496 | 990,494,960 | 1,067,599,365 | 1,223,996,316 | 1,172,150,441 | 1,310,387,429 | 1,694,712,210 | 2,047,986,336 | 1,997,005,448 |
| **රජය සඳහා සෘජු හා වක්‍ර දායකත්වය** | | | | | | | | | | |
| බෙදාහැරීම් පිරිවැය | 254,257,568 | 432,035,352 | 488,011,003 | 557,650,809 | 583,815,438 | 500,848,485 | 531,801,210 | 674,909,121 | 1,069,000,355 | 1,284,599,303 |
| පරිපාලන වියදම් | 171,319,607 | 212,314,509 | 269,993,917 | 311,203,508 | 365,193,951 | 362,334,768 | 356,796,344 | 411,913,602 | 465,114,112 | 573,472,839 |
| මූල්‍ය වියදම් | 12,789,382 | 44,893,795 | 21,746,255 | 25,717,200 | 30,483,249 | 29,936,142 | 25,807,844 | 26,094,291 | 37,190,847 | 29,743,395 |
| | 438,366,557 | 689,243,656 | 779,751,175 | 894,571,517 | 979,492,638 | 893,119,395 | 914,405,398 | 1,112,917,014 | 1,571,305,314 | 1,887,815,537 |
| **බදු පෙර ලාභ** | **269,410,173** | **224,365,840** | **210,743,785** | **173,027,848** | **244,503,678** | **279,031,046** | **395,982,031** | **581,795,197** | **476,681,023** | **109,189,911** |
| අඩුකළා : ආදායම් බදු වියදම් | 111,264,623 | 166,051,524 | 140,065,071 | 129,986,050 | 198,991,306 | 231,393,156 | 186,878,002 | **269,604,238** | 610,087,951 | 117,853,496 |
| **වර්ෂය සඳහා ලාභ :පාඩු** | **158,145,550** | **58,314,316** | **70,678,714** | **43,041,798** | **45,512,372** | **47,637,890** | **209,104,029** | **312,190,959** | **(133,406,928)** | **(8,663,585)** |
| අඩුකළා : මහා භාණ්ඩාගාරයට කරන ලද විශේෂ ප්‍රතිපාදන | - | - | - | - | - | 16,000,000 | - | - | - | - |
| **මණ්ඩලීය ශුද්ධ අතිරික්තය (හිඟය)** | **158,145,550** | **58,314,316** | **70,678,714** | **43,041,798** | **45,512,372** | **31,637,890** | **209,104,029** | **312,190,959** | **(133,406,928)** | **(8,663,585)** |
| විකුණුම් මත ඒකාබද්ධ අරමුදලට දායකත්වය | 957,406,531 | 845,908,023 | 767,590,790 | 898,282,571 | 1,136,298,465 | 1,173,460,051 | 1,345,046,907 | 1,574,149,137 | 1,753,135,197 | 1,888,455,133 |
| අඩුකළා : මහා භාණ්ඩාගාරයට කරන ලද විශේෂ ප්‍රතිපාදන | - | - | - | - | - | 16,000,000 | - | - | - | - |
| අහිමි කළ ත්‍යාගවලින් ඒකාබද්ධ අරමුදලට දායකත්වය | 146,390,083 | 127,809,507 | 147,893,404 | 127,081,500 | 194,511,177 | 182,465,862 | 180,473,400 | 197,806,370 | 247,738,070 | 246,424,920 |
| ස්කන්ධ ප්‍රාග්ධන අරමුදල්වලින් ඒකාබද්ධ අරමුදලට දායකත්වය | - | - | - | - | - | - | - | 702,000,000 | 500,000,000 | - |
| වක්‍ර දායකත්වය - බදු | 402,132,646 | 466,703,676 | 420,814,224 | 428,100,646 | 656,217,994 | 733,284,427 | 693,805,894 | 867,309,627 | 1,321,426,566 | 870,117,477 |
| **එකතුව** | **1,505,929,260** | **1,440,421,206** | **1,336,298,418** | **1,453,464,717** | **1,987,027,636** | **2,105,210,340** | **2,219,326,201** | **3,341,265,134** | **3,822,299,833** | **3,004,997,530** |
| දළ ලාභය අලෙවි පිරිවැටුමේ ප්‍රතිශතයක් ලෙස | 9.62% | 12.04% | 13.15% | 11.85% | 10.29% | 10.83% | 11.21% | 11.83% | 12.57% | 12.59% |
| බදු පෙර ලාභ අලෙවි පිරිවැටුමේ ප්‍රතිශතයක් ලෙස | 4.37% | 3.47% | 3.47% | 2.53% | 2.85% | 3.15% | 3.92% | 4.85% | 3.28% | 0.72% |
| වියදම් අලෙවි පිරිවැටුමේ ප්‍රතිශතයක් ලෙස | 7.11% | 10.67% | 12.83% | 13.09% | 11.42% | 10.08% | 9.06% | 9.27% | 10.81% | 12.46% |
| වර්ෂය සඳහා ලාභ (පාඩු) අලෙවි පිරිවැටුමේ ප්‍රතිශතයක් ලෙස | 2.56% | 0.90% | 1.16% | 0.63% | 0.53% | 0.54% | 2.07% | 2.60% | -0.9% | -0.1% |
| රජයට මුලු දායකත්වය අලෙවි පිරිවැටුමේ ප්‍රතිශතයක් ලෙස | 24.42% | 22.30% | 21.98% | 21.27% | 23.16% | 23.75% | 21.99% | 27.83% | 26.29% | 19.83% |
| අලෙවි පිරිවැටුමේ වර්ධන වේගය | (.4.97%) | 4.75% | (.5.88)% | 12.37% | 25.58% | 3.29% | 13.87% | 18.94% | 21.10% | 4.24% |

2014 වසරට අනුව දස වසරක සාරාංශයේ සංඛ්‍යා ප්‍රතිගණනය කර ඇත. ආදායම් බදු ගණනයේදී අනුදත් නොවූ වියදමක් ලෙස සලකන ලද ඒකාබද්ධ අරමුදලට ගෙවීම් සඳහා 2007 වසරේ සිට 40 ක අතිරේක ආදායම් බදු ගෙවීම් සිදු කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස රු 2780247776 ක මුදලක් 2013 පෙබරවාරි සිට 2017 අගෝස්තු දක්වා ඒකාබද්ධ අරමුදලට අදාල ගෙවීම්වලින් නැවත අයකර ගැනීමට නියමිතය.
කෙසේවෙතත් 2013 වසරේ සිට නැවත ඒකාබද්ධ අරමුදලට ගෙවීම් ආදායම් බදු ගණනයේදී පෙර කී පරිදිම අනුදත් වියදමක් ලෙස සැලකීමට අවසර ලැබිණි.

www.nlb.lk

EPA ADVERTISING - 0718 60 80 82